# ජාතික රක්ෂණ භාර අරමුදල



# වාර්ෂික වාර්තාව
# 2015

# සම්බන්ධතා විශ්වාසය


ජාතික රක්ෂණ භාර අරමුදල දිගුකල් පවත්නා සම්බන්ධතා පවත්වගෙන යමින් පාරිභෝගික කේන්ද්‍රීය ආයතනයක් ලෙස ජන හදවත් දිනා ගෙන ඇත. අපගේ පාරිභෝගිකයින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය මෙන්ම අපගේ වසර ගණනක මූල්‍යකාර්ය සාධනය මෙයට සාක්ෂි දරයි. 2015 වසර අභියෝග රැසක් සමගින් ආර්ථික අස්ථාවර බවකින් පැවතිය ද ජාතික රක්ෂණ භාර අරමුදලට එය වඩාත් යහපත් හෙට දිනයක් උදා කර ගැනීම සඳහා ශක්තිය යෙදවීමේ සතුටුදායක වසරක් වී තිබුණි.

අපගේ ආයතනික වටිනාකම් පද්ධතිය පාරිභෝගික කේන්ද්‍රීය විශ්වාසනීය නව්‍යතාවයෙන් යුතු ගුණාත්මක අඛණ්ඩ අභිවෘද්ධියකින් සමන්විත වන අතර අපගේ ව්‍යාපාර මෙහෙයුම් ගෞරවාන්විත බවකින් සැදුම්ලත් පදනමක් මත සිදු කරමින් තවදුරටත් ආර්ථික අභිවෘද්ධිය ළඟා කර ගැනීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබයි. අප ආයතනය සාර්ථකත්වය කරා මෙහෙයවා ඇති සියලු තරාතිරම්වල සේවක සේවිකාවන්ගේ උත්සාහය අප ඇගයීමට ලක් කරන අතර ඔවුන් පිළිබඳ අපි ආඩම්බර වෙමු.

මූලික වශයෙන් අඩු වරප්‍රසාද ලත් හා සැලකිල්ලට ලක් නොවූ සමාජ කොටස් මෙන්ම රාජ්‍ය සේවකයින් ඇතුළු අපගේ පාරිභෝගිකයින් වෙනුවෙන් ආරක්ෂක ජාලයක් ලෙස ක්‍රියා කරමින් ජාතික රක්ෂණ හා ප්‍රතිරක්ෂණ සපයන්නෙකු වීම අපගේ ඉලක්කයයි.

ජාතික රක්ෂණ හා ප්‍රතිරක්ෂණ වෙළෙඳපොළ සඳහා දැරිය හැකි, විශ්වාසනීය හා අඩු අවදානම් රක්ෂණ විසඳුම් සැපයීම මගින් මූල්‍ය ස්ථාවරත්වයක් ළඟා කර දීම අපගේ අපේක්ෂාව වන අතර එමගින් සමස්ථයක් ලෙස රක්ෂණ කර්මාන්තයට හා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දියුණුව සඳහා දායකත්වයක් සපයයි.

අපගේ රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත උදෙසා සහ රක්ෂණ කර්මාන්තයේ නියාමන රාමුවට අනුකූලව ජාතික රක්ෂණ භාර අරමුදලේ අපි ජාතියට සේවය සලසමින් අපගේ සහභාගිත්වය හා සන්ධානය තවදුරටත් ඉදිරියට ගෙන යැමට අපේක්ෂා කරමු.



# පටුන


| | |
|---|---|
| අපගේ දැක්ම / අපගේ මෙහෙවර | 2 |
| අප කවුරුන් ද | 3 |
| අපගේ ආයතනික හර පද්ධතිය හා උපාය මාර්ගික අරමුණු | 4 |
| මූල්‍යමය විශේෂ අවස්ථා | 5 |
| වැදගත් සිදුවීම් | 7-9 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 10-11 |
| ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය | 12-13 |
| කළමනාකරණ කථිකාව හා විශ්ලේෂණය | 14-15 |
| මූල්‍ය සමාලෝචනය | 16 |
| ආංශික විවරණය | 17-21 |
| සමායතනික පාලනය | 22-24 |
| ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2015 | 25 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික විස්තර | 26 |
| ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | 27 |
| අවදානම් කළමනාකරණය | 28-29 |
| ආයතනික සමාජ වගකීම | 30 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 31-32 |
| විගණන කමිටු වාර්තාව | 33 |
| ස්වාධීන විගණකගේ වාර්තාව | 34-49 |
| මූල්‍ය ප්‍රකාශන | |
| විස්තීර්ණ ආදයම් ප්‍රකාශය | 50 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 51 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 52 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 53 |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 54-74 |
| දස වසරක අවලෝකනය | 75-76 |
| ආයතනික තොරතුරු | පසුපස කවරය ඇතුලත |

# දැක්ම හා මෙහෙවර

## දැක්ම

- ආරක්ෂාව අවැසි සියළු අංශයන්ට රැකවරණය හා ආරක්ෂණ ජාලයක්

## මෙහෙවර

- සමාජයෙහි අගහිඟකම්වලින් පෙළෙන සියළුම අංශයන් අරභයා දැරිය හැකි කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම
- වෙනස් වෙමින් පවත්නා අවශ්‍යතාවයන් තුළින් පැන නඟින ඉහළ අවදානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීම හා වෙනත් වැඩ පිළිවෙලවල් තුලින් දේශීය වෙළෙඳපොලට විසඳුම් සලසාලීම
- දේශීය රක්ෂණ වෙළෙඳපොලට අතිරේක ශක්‍යතාවය සලසාලීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීම.


# අප කවුරුන් ද?

ජාතික රක්‍ෂණ භාර අරමුදල 2006 අංක 28 දරණ ජාතික රක්‍ෂණ භාර අරමුදල් පනත (ජා.ර.භා.අ.පනත) මගින් ස්ථාපිත කර ඇත. ආර්ථිකය වෙනුවෙන් එහි දායකත්වය සඳහා ප්‍රතිරක්‍ෂණය, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්‍ෂණය, අග්‍රහාර වෛද්‍ය රක්‍ෂණය, සෞඛ්‍යය රක්‍ෂණය, ස්වාභාවික විපත් රක්‍ෂණය හා කෘෂි රක්‍ෂණය ඇතුලු අනෙකුත් වර්ගවල සාමාන්‍ය රක්‍ෂණ ආවරණ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම සිදු කරයි. ජාතික රක්‍ෂණ භාර අරමුදල් පනතට අනුව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රථමයෙන් පාලනය කරන ලද රක්‍ෂණ අරමුදලක් වන වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්‍ෂණ අරමුදල පසුව ජාතික රක්‍ෂණ භාර අරමුදල වෙත පවරාගන්නා ලද අතර ජාතික රක්‍ෂණ භාර අරමුදල වෙනුවෙන් වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අවදානම් වෙනුවෙන් රක්‍ෂණ ආවරණ නිකුත් කරන සියලුම රක්‍ෂකයින් මේ සඳහා ඔවුන් ලබා ගන්නා වාරික ජාතික රක්‍ෂණ භාර අරමුදලට ප්‍රේෂණය කළ යුතු වේ. 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරණ රජයේ ගැසට් නිවේදනයට අනුව සෑම සාමාන්‍ය රක්‍ෂණ කොන්ත්‍රාත්තුවකින්ම ලැබෙන මුළු ප්‍රතිරක්‍ෂණ වාරිකයෙන් 30%ක ප්‍රමාණයක් ජාතික රක්‍ෂණ භාර අරමුදලට මාරු කළ යුතු වේ. දැනට ප්‍රාථමික රක්‍ෂකයින් සඳහා ප්‍රතිරක්‍ෂණ ආවරණ සපයන එකම ශ්‍රී ලාංකේය ආයතනය ජාතික රක්‍ෂණ භාර අරමුදල වේ. 2005/12 දරණ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍ර ලේඛය මගින් අග්‍රහාර වෛද්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය ආරම්භ කර ඇති අතර 2006 ජනවාරි 01 දින සිට එය ජාතික රක්‍ෂණ භාර අරමුදලේ විෂය පථය යටතට ගෙන ඇත. එමගින් විවාහක සේවකයින්හට කලත්‍රයා හා දරුවන්හට (අවිවාහක රැකියාවක් නොකරන අවුරුදු 21ට අඩු අය සඳහා පමණක්) සහ අවිවාහක සේවකයින්හට එනම් සාමාජිකයා, දෙමව්පියන් (දෙමව්පියන් අවුරුදු 70ට අඩු නම් පමණි) වෙත ප්‍රතිලාභ හිමි වේ.

අඩු වටිනාකමකින් යුත් වාරිකයන් සඳහා බහුවිධ ප්‍රතිලාභ ලබාදීම ප්‍රධාන අරමුණක් වන අතර හිමිකම් භාර ගැනීම හා ප්‍රතිලාභ ගෙවීම සඳහා ගත වන කාලය අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛස්ථානයට අප පැමිණ ඇත. අපගේ අභ්‍යන්තර හා බාහිර කාර්යක්‍ෂමතාවය දියුණු කිරීම සඳහා නව තාක්‍ෂණය යොදා ගෙන ඇති අතර සැලකිය යුතු ලෙස පහළ මට්ටම් වෙත සේවා දායකත්වයක් ලබාදීම සිදු කරයි. අනුරාධපුරය හා හම්බන්තොට ශාඛා දෙකක් හා දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඒකක 18ක් පිහිටුවා තිබීම මගින් දිස්ත්‍රික්ක සියල්ලම ආවරණය වී ඇත.

# අපගේ ආයතනික වටිනාකම්

අපගේ ව්‍යාපාර ප්‍රවේශ මාර්ගය සඳහා සය වැදෑරුම් ආයතනික වටිනාකම් ඇතුලත් ශක්තිමත් පදනමක් හා උපදෙස් ලබා දෙයි.






# උපාය මාර්ගික අරමුණු


- පවත්නා ව්‍යාපාරික අවස්ථා වැඩි දියුණු කරමින්, පාරිභෝගික කේන්ද්‍රීය රක්‍ෂණ අවස්ථා වර්ධනය කරමින් අපගේ ඉලක්ක ගත පාරිභෝගික කාණ්ඩය හා පොදු මහජනතාව වෙනුවෙන් දීර්ඝකාලීන වටිනාකම් නිර්මාණය කිරීම.
- වෙළඳපොළ අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් මූල්‍ය විනය හා කළමනාකරණය තුලින් විශාල මූල්‍යමය වර්ධනයක් ළඟා කර ගැනීම.
- ව්‍යාපාර ප්‍රවේශය පුළුල් කිරීම හා විශ්වාසනීයත්වය ගොඩනැගීම තුලින් පවත්නා හවුල්කාරීත්වය රැක ගැනීම හා ප්‍රසිද්ධ නව හවුල්කාරීත්වයක් ආකර්ෂණය කර ගැනීම.
- දක්‍ෂතා සහිත මානව සම්පත් ආකර්ෂණය කරගැනීම මගින් තිරසාර නායකත්වයක් ඉදිරියට ගෙන යාම.
- යටිතල පහසුකම් ඇති කිරීම හා ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය තුළින් ගත වන කාලය අඩු කිරීම හා සේවයේ කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවීම.
- අපගේ පාර්ශවකරුවන් වෙත ඉටුකරන ප්‍රධාන වගකීමක් ලෙස සියළුම මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි අවදානම් කළමනාකරණ ප්‍රමිති වැඩි දියුණු කිරීම.
- පූර්ව ක්‍රියාකාරී වෙළඳපොළ ගවේෂණයක් සිදු කරමින් වෙළඳපොළ අවස්ථා නිසි පරිදි ආයතනයට හා කර්මාන්තයට වටිනාකම් එකතු කරන්නේ ද යන්න සොයා බැලීම.


# මූල්‍යමය විශේෂ අවස්ථා


| | |
|---|---|
| බදු පසු ලාභය | රු. බිලියන 4.3 |
| මුළු වත්කම් | රු. බිලියන 12 |
| ඒකාබද්ධ අරමුදල් දායකත්වය | රු. බිලියන 3 |
| වත්කම් මත ප්‍රතිලාභ | 36% |







| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| මුළු ආදායම | 8,787,869,247 | 8,655,544,130 |
| දළ ලිඛිත වාරිකය | 5,062,685,701 | 5,842,067,431 |
| ශුද්ධ ඉපයූ වාරිකය | 7,931,485,679 | 8,015,628,346 |
| බදු පෙර ලාභය | 4,390,146,531 | 4,582,655,586 |
| බදු පසු ලාභය | 4,303,324,331 | 4,582,655,586 |
| මුළු වත්කම් | 12,233,466,883 | 11,193,375,695 |
| වත්කම් මත ප්‍රතිලාභ % | 35.89 | 40.94 |

# වැදගත් සිදුවීම්

**1. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අග්‍රහාර ප්‍රතිලාභීන්හට ප්‍රතිලාභ ලබාදීම සඳහා බොහෝ රෝහල් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.**

**2015 ජූලි 20**



**ජාතික රක්ෂණ භාර අරමුල හා හේමාස් රෝහල් සමාගම අතර අවබෝධතා ගිවිසුම**

2015 ජූලි 20 දින ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ හේමාස් හොස්පිටිල් සමූහයේ කළමනාකාර අධ්‍යක්ෂ වෛද්‍ය ලකිත් පීරිස් මහතා ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා සහ හේමාස් හොස්පිටිල්ස් හි සභාපති හා සමූහයේ අධ්‍යක්ෂ මූර්තසා එසුපලී ඉදිරියේ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. සහභාගීත්වය තුළින් අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට හිමිකම් ලබා ඇති රාජ්‍ය අංශයේ සේවකයින් හට ගුණාත්මක පෞද්ගලික සෞඛ්‍ය සේවාවක් විශේෂ සහනදායි මිලකට හේමාස් රෝහල් සමූහයේ ඕනෑම රෝහලකින් ලබා ගත හැකිය.

**2015 අගෝස්තු 21**



**සීමාසහිත ලංකා හොස්පිටල් සහ ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

2015 අගෝස්තු 21 දින ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ ලංකා හොස්පිටල් හි කළමනාකාර අධ්‍යක්ෂ තිස්ස නානායක්කාර මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා ලංකා හොස්පිටල්ස් හි ප්‍රධාන විධායක නිලධාරි දේශාන්ත ද සිල්වා මහතා ඉදිරියේ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 අගෝස්තු 25**





**නවලෝක රෝහල් සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ නවලෝක රෝහල් සමාගමේ අධ්‍යක්ෂ හර්සිත් ධර්මදාස මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා නවලෝක රෝහල් සමාගමේ ආයතනික සැලසුම් කළමනාකාර නාලක නිරෝෂණ මහතා ඉදිරියේ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 ඔක්තෝබර් 14**



# වැදගත් සිදුවීම්



**උතුරු මැද රෝහල් සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ උතුරු මැද රෝහල් සමාගමේ අධ්‍යක්ෂ වෛද්‍ය පී. කෙෂාවරාජා මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා උතුරු මැද රෝහල් සමාගමේ පී. ගනේෂ්රාජා මහතා ඉදිරියේ 2015 ඔක්තෝබර් 14 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 නොවැම්බර් 16**



**රත්නපුර සිංහ ආරෝග්‍යශාලා (පුද්ගලික) සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ සිංහ රෝහල් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ඊ.එම්.ඩී.එච්.එන්. වීරසිංහ මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා ඉදිරියේ 2015 නොවැම්බර් 16 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 නොවැම්බර් 19**



**කළුතර නිව් පිලිප් රෝහල් (පුද්ගලික) සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ නිව් පිලිප් රෝහල් සමාගමේ අධ්‍යක්ෂ ක්‍රිස්ටෝෆර් ප්‍රනාන්දු මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා පිලිප් රෝහලේ ගණකාධිකාරි අචිනි ජයසිංහ මහත්මිය ඉදිරියේ 2015 නොවැම්බර් 19 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 දෙසැම්බර් 11**



**මාවනැල්ල ඔස්රෝ රෝහල් (පුද්ගලික) සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ ඔස්රෝ රෝහල් සමාගමේ අධ්‍යක්ෂ වෛද්‍ය නානායක්කාර මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා ඔස්රෝ රෝහලේ රාජු බණ්ඩාර මහතා ඉදිරියේ 2015 දෙසැම්බර් 11 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 දෙසැම්බර් 17**



# වැදගත් සිදුවීම්



**ගාල්ල සමූපකාර රෝහල් සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ ගාල්ල සමූපකාර රෝහල් සමාගමේ සාමාන්‍යාධිකාරී කේ.ජී. චාල්ස් ගමගේ මහතා විසින් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා ගාල්ල සමූපකාර රෝහල් සමාගමේ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී ඒ.ඩී. වලතරආරච්චි මහතා ඉදිරියේ 2015 දෙසැම්බර් 17 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**2015 දෙසැම්බර් 30**



**නාවින්න මෙඩිකෙයාර් රෝහල් (පුද්ගලික) සමාගම හා ජා.ර.භා. අරමුදල අතර අවබෝධතා ගිවිසුම**

ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා සහ නාවින්න මෙඩිකෙයාර් රෝහල් (පුද්ගලික) සමාග මේ සභාපති ඒ.එච්.එන්.ඩී.ඩබ්ලිව්. ද සිල්වා මහත්මිය ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා හා නාවින්න මෙඩිකෙයාර් රෝහලේ සාමාන්‍යාධිකාරී තේජානු ද සිල්වා මහතා ඉදිරියේ 2015 දෙසැම්බර් 30 දින අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

**ප්‍රතිරක්ෂණ මූලධර්ම භාවිතය හා ව්‍යසනයන්ට නිරාවරණය වීමේ ගෝලීය ප්‍රවනතාවය පිළිබඳ සම්මන්ත්‍රණයක් 2015 ජාතික රක්ෂණ භාර අරමුදල, ඉන්දියානු රක්ෂණ ආයතනය හා එක්ව කොළඹ ගලධාරි හෝටලයේ දී 2015 දෙසැම්බර් 08 දින පවත්වන ලදී.**

**2015 දෙසැම්බර් 08**







ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිනි ඉන්ද්‍රානි සුගතදාස මහත්මිය, ප්‍රධාන ආරාධිතයා ලෙසත් ජා.ර.භා. අරමුදලේ සභාපති මංජුල ද සිල්වා මහතා, ජා.ර.භා. අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි සනත් සී. ද සිල්වා මහතා, ඉන්දියානු රක්ෂණ ආයතනයේ මහ ලේකම් - පී. වේනුගෝපාල් මහතා, ඉන්දියානු රක්ෂණ ආයතනයේ සභාපති හා ඉන්දියානු ජීවිත රක්ෂණ සංස්ථාවේ සභාපති - එස්.කේ. රෝයි මහතා, ඉන්දියා එක්ස්චල් කැට්ලින් නේවාසික කළමනාකරු - ජෝසප් ඔගස්ටින් මහතා, ඉන්දියා හැනෝවර් රී කළමනාකාර අධ්‍යක්ෂ - අන්කූර් නිජාවන් මහතා, ඉන්දියා ලොයිඩ්ස් දිවයිනට නියෝජිත - අරූන් අගුවාල් මහතා, ජී.අයි.සී. රී ඉන්දියා සාමාන්‍යාධිකාරී - පර්ජට් දුත්තා, ජනශක්ති රක්ෂණ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ - ප්‍රකාශ් ෂාප්ටර්, එච්.එන්.බී. ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි - නිරංජන් මානික්කම් මහතා, ඉන්දියානු රක්ෂණ විද්‍යාලය අධ්‍යක්ෂ - අරින්දම් මුකර්ජී මහතා සහ ප්‍රධාන විධායක ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකා ආයතනයේ ඇනස්ලි අලස් මහතා සෙසු ආරාධිතයන් ලෙසත් සහභාගී වී ඇත. ප්‍රතිරක්ෂණයේ මූලධර්ම නැවත සාකච්ඡා කිරීම ව්‍යසනයන් සඳහා නිරාවරණයවීමේ ගෝලීය ප්‍රවනතා සහ ප්‍රතිරක්ෂණය කිරීමේ වැඩසටහන් නිර්මාණය කිරීමේ දී පැනනගින ගැටළු මෙහි දී සාකච්ඡාවට ලක් විය.

# සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික රක්ෂණ භාර අරමුදලට වසර නවයක් සපිරෙන මේ මොහොතේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා එහි වාර්ෂික වාර්තාව ඔබ වෙත පිළිගන්වන්නේ හද පිරි සතුටිනි. අපගේ පාර්ශවකරුවන් හට සැලකිය යුතු වටිනාකමක් ලබාදීම සඳහා ජාතියේ අවශ්‍යතාවන්ට මුල් තැන ලබා දෙමින් සන්ධානයන් හා සහභාගිත්වයන් ගොඩනගා ගනිමින් වසර ගණනාවක් පුරා සේවය සලසා ඇත.

2009 වසරේ දී හැර දේශීය හා ගෝලීය ආර්ථික පසුගාමී බවක් දක්නට ඇති අවස්ථාවන්වල දී  එය වාරික අරමුදල් වර්ධනය අඩු කිරීමට හේතුවක් වූ අතර මෙම කාලය පුරාම ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය අනාගත ස්ථාවර ඉදිරි දැක්මක් පෙන්වා ඇත. ආසියානු කලාපයේ බොහෝ ආර්ථිකයන්ට වඩා ශ්‍රී ලංකාවේ රක්ෂණය සඳහා යොමුවීම ඉතාමත් අඩු මට්ටමක පවතී. එමගින් රක්ෂකයින් හට පාරිභෝගිකයින්ගේ වැඩිවන අවශ්‍යතා සඳහා රක්ෂණ නිපැයුම් ලබාදෙමින් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කිරීමට බොහෝ අවස්ථාවන් ඇති බව පෙන්නුම් කරයි. 2015 වසරේදි මිලියන 21ක් වන මුළු ජනගහනය සඳහා ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,924ක් ලෙස සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය 4.8%ක් ලෙස වර්ධනය වෙමින් සංවර්ධනය, ප්‍රතිසංස්කරනය හා වර්ධනය දෙසට යොමුවීමක් පිළිබිඹු කරයි. දළ දේශීය නිෂ්පාදිතයට 62.4%ක් සේවා අංශයෙන් ද 28.9%ක් නිෂ්පාදන අංශයෙන් ද 8.7%ක් කෘෂිකාර්මික අංශයෙන් ද දායකත්වය ලබා ඇත. උසස් මධ්‍යම ආදායම් ආර්ථික මට්ටමක් ලඟා කර ගැනිමේ අභිලාෂයත් සමග බස්නාහිර පළාත් නාගරීකරණය, කොළඹ ප්‍රදේශය තුළ  මූල්‍ය කේන්ද්‍රස්ථානයක් නිර්මාණය කිරීම හා ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය මගින් සංචාරක ව්‍යාපාරය ආදී වූ නිසැකවම ආර්ථික ප්‍රගමනයක් ඇති කරන මෙන්ම සමස්ථයක් වශයෙන් රක්ෂණ කර්මාන්තය තුළ නව අවස්ථා උත්පාදනය කිරීම සඳහා උපක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතී.

2014 වසරේ පැවති රු. බිලියන 5.8 ට සාපේක්ෂව රු. බිලියන 5ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් ජාතික රක්ෂණ භාර අරමුදලට සාර්ථක මූල්‍ය වසරක් නිම කිරීමට හැකි වූ අතර මෙම පසුගාමී බවට වගා රක්ෂණ යෝජනා ක්‍රමය කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරීම හේතු වී තිබුණි. මීට අනුරූපව බදු පසු ලාභය රු. බිලියන 4.4ක් ලෙස පසුගිය වසරේ පැවති රු. බිලියන 4.6ට සාපේක්ෂව අවකරණයවීමකට ලක් වී ඇත. මුළු ගිණුම්ගත අගයෙන් 84%ක් වන ආයෝජනයන් රු. බිලියන 12.2 කින් එනම 9% ක වර්ධනයක් ශේෂ පත්‍රයෙහි දක්වයි. රක්ෂණ ඔප්පු හිමියන් වෙත වූ අපගේ පොරොන්දුව හා කැපවීමට ගරු කරමින් අප විසින් රු. බිලියන 3.2ක්වූ හිමිකම් ගෙවීමක් 2015 වසර තුළ සිදු කර ඇත.

“ රක්ෂණ ඔප්පු හිමියන් වෙත වූ අපගේ පොරොන්දුව හා කැපවීමට ගරු කරමින් අප විසින් රු. බිලියන 3.2ක්වූ හිමිකම් ගෙවීමක් 2015 වසර තුළ සිදු කර ඇත. ”



# සභාපතිතුමාගේ පණිවුඩය

අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ හිමිකම් ගෙවීම් සීමාවන්වල වර්ධනයක් විදහා දැක්වෙන අතර කඩිනම් ගෙවීම් පද්ධති ක්‍රියාත්මක කිරීම හා රෝහල් සඳහා ගෙවීම් සිදු කිරීමට පහසුවන ලෙස සකස් කළ විද්‍යුත් කාඩ්පත් පහසුකම් ඇති කිරීම ක්‍රියාත්මක කිරීම මෙම මූල්‍ය වර්ෂය තුළ දක්නට තිබුණි. අපගේ සාමාන්‍ය රක්ෂණ අංශය තුළ කටයුතු වඩාත් කඩිනම් කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථාන මෙන්ම විවිධ වූ සේවා ස්ථානයන් ආරම්භ කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළ ඉඩ ප්‍රස්ථා ලබාදී ඇති අතරම මේ සම්බන්ධ දෘෂතාවය හා පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා අලෙවිකරන හා ප්‍රවර්ධන කාර්යයන් යොදා ගනු ලබයි. සීඝ්‍ර හා කාර්යක්ෂම ක්‍රියවලි පරිසරයක් සහතික කිරීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අඛණ්ඩව ආයෝජනයන් සිදු කරනු ලබයි.

ජාතික රක්ෂණ භාර අරමුදල අඛණ්ඩව තම ප්‍රධාන වටිනාකම් තුළින් තම ව්‍යාපාර අත්තිවාරම ගොඩනගමින් පාරිභෝගික කේන්ද්‍රීය ආයතනයක් ලෙස පැවැත්ම සකසා ගෙන ඇත. අපගේ සමායතනික පාලන තත්ත්වයන් කෙරේ පවත්නා දැඩි ඇල්ම පිළිබඳ සලකා කොටස්කරුවන් සඳහා දිගුකාලීන වටිනාකම් ඇති කිරීම හා ඉදිරියට පවත්වා ගෙන යෑමත් වර්ෂය පුරා උසස් මට්ටමේ කාර්යසාධනයක් පවත්වා ගැනීම හා වර්ධනය කිරීම උදෙසා තම උපකාර හා සහයෝගය ලබා දෙනු ලබන සේවාදායකයින් වෙනුවෙන් ආයෝජනය කිරීම් අරමුණු කර ඇත. අපගේ අනාගත ඉලක්ක ආපේක්ෂා හා ව්‍යාපාරික සැලසුම්වල කොටසක් ලෙස අපගේ භූගෝලීය ප්‍රවේශය, අපගේ යටිතල පහසුකම්වල ආයෝජනය, අභ්‍යන්තර පද්ධති හා අපගේ මානව සම්පත් සංවර්ධනය ව්‍යාප්ත කිරීමට අප අදහස් කර ඇති අතර මේ සියල්ලම සමාජයේ විශාල පිරිසක් වෙත ළඟා වී ඔවුන්ගේ රක්ෂණ අවශ්‍යතා සඳහා සේවය කිරීම පිණිස වේ.

ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා (ඔහුගේ විෂය පථය යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක වෙයි.) රාජ්‍ය අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා සහ අතිරේක ලේකම්වරුන් වෙත ඔවුන් ලබාදුන් මඟපෙන්වීම් හා සහයෝගය සඳහා මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි. මහා භාණ්ඩාගාර ලේකම්තුමාට හා ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතුවලට සම්බන්ධවන අනෙකුත් භාණ්ඩාගාර නිලධාරීන් හට ද මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂතුමා හා නිලධාරීන් සහ රක්ෂණ කර්මාන්තයේ නියාමකවරුන් වෙත ද මාගේ අවංක ස්තූතිය පුද කර සිටිමි. අවසන් වශයෙන් මෙම මණ්ඩලයේ අනෙකුත් මාගේ සහෝදර සාමාජිකයන්ට ද ප්‍රධාන විධායක නිලධාරීතුමාට ද ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය මණ්ඩලයට ද වර්ෂය පුරා ලබාදුන් ඔවුන්ගේ දායකත්වය හා කැපවීම වෙනුවෙන් ඔවුන් වෙත ද මාගේ ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.



මංජුල ද සිල්වා
සභාපති

2017.05.23

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

2015 වසර රක්ෂණ කර්මාන්තයට ජයග්‍රාහී වසරක් වී තිබූ අතර එම වර්ෂයේ දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනය 2014 වසරේ වාර්තා වූ 5.44% හා සැසඳීමේ දී එයට සාපේක්ෂව 16.12% ලෙස පැවතිනි. නියත වශයෙන්ම මෙය 2015 වසරේ රු. බිලියන 122.39 ක දළ ලිඛිත වාරික ආදායමක් ලබා ගැනිමට ඉවහල් වූ අතර එයට සාපේක්ෂ වශයෙන් 2014 වසරේ වාර්තා වූයේ රු. බිලියන 105.3කි. තව ද මෙයට ඉවහල් වී තිබුනේ දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ අංශයේ වාරික ඉහළ අගයක් ගැනිමයි. 2015 වසර තුළ දී රක්ෂණ අංශයේ ප්‍රධාන වර්ධනයන් දෙකක් සිදු වී තිබුණි. සංශෝධිත පනතේ 53 වන පරිච්ඡේදයට අනුව සංයුක්ත රක්ෂණ සමාගම් සඳහා එක් ව්‍යාපාරයකින් අනෙකට බලපාන අවදානම් අවම කර ගැනීම සඳහා ඔවුන්ගේ මෙහෙයුම් සමාගම් දෙකක් ලෙසින් වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යෑම සඳහා උපදෙස් ලබා දී තිබුණි. මෙය නියාමකයින් විසින් ගත් කාලෝචිත පියවරකි. නියාමක ප්‍රාග්ධනය රු. මිලියන 100 සිට රු. මිලියන 500 දක්වා වැඩි කරමින් රක්ෂණ සමාගම්වලට ඔවුන්ගේ ව්‍යාපාර ලැයිස්තු ගත කිරීම සඳහා පදනමක් නිර්මාණය කර දීම ද සිදු කර තිබිණි.

ජාතික රක්ෂණ භාර අරමුදල සතුටුදායක මූල්‍ය වර්ෂයක් පසුකර ඇති අතර නව සභාපතිතුමාගේ සම්ප්‍රාප්තියත් සමග සැලකිය යුතු අත්දැකීම් සම්භාරයක් හා විශේෂඥ දැනුම අප ආයතනයට ලැබී ඇත. ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකරන කණ්ඩායම බල ගැන්වීම මගින් අභ්‍යන්තර වර්ධනයකට හා අභිවෘද්ධියකට මඟ පෑදී ඇත. වගා රක්ෂණ යෝජනා ක්‍රමය කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට පැවරීම හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි පෙර වර්ෂයේ පැවති රු. බිලියන 5.8ට සාපේක්ෂව රු. බිලියන 5ක් ලෙස දළ ලිඛිත වාරික ආදායමේ අඩුවීමක් වාර්තා කර ඇත. අනෙක් කරුණ වන්නේ අපගේ බදු පසු ලාභය මූලිකව ඉහත සඳහන් කළ හේතුව නිසාම රු. බිලියන 4.6 සිට රු. බිලියන 4.4 දක්වා පහත බැසීමයි.

ජාතික රක්ෂණ භාර අරමුදල ''අග්‍රහාර'' සෞඛ්‍යය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය සේවකයින් සඳහා දැරිය හැකි මිලකට උසස් ගුණාත්මක සෞඛ්‍යය සේවාවක් ලබාදීම සඳහා ලංකා රෝහල් සමාගම ඇතුළු තවත් පෞද්ගලික රෝහල් ගණනාවක් සමග සහයෝගයෙන් නව වැඩසටහනක් දියත් කර ඇත. රාජ්‍ය සේවකයින් හට පහසුවෙන් ලබා ගත හැකි උසස් ගුණාත්මක ප්‍රතිකාර මෙමගින් ලබා ගත හැකි අතර මෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ රෝහල් ගාස්තු කලින් තීරණය කිරීමට හැකි වීමයි. ශ්‍රී ලංකාවේ සියළුම රක්ෂණ සමාගම් විසින් පවරන ලද ප්‍රතිරක්ෂණයන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිරක්ෂණ පැවරීම් ආවරණයක් ලබා ගැනීමට ජාතික රක්ෂණභාර අරමුදල වැඩ පිළිවෙලක් ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. දිගුකාලීන වශයෙන් අපගේ පාර්ශවකරුවන් හට වටිනාකමක් ලබාදීමේ ක්‍රමයක් ලෙස මානව සම්පතෙහි ආයෝජනයන් සිදු කිරීම අපගේ තවත් අපේක්ෂිත ක්ෂේත්‍රයක් විය.



"ජාතික රක්ෂණ භාර අරමුදලේ මානව සම්පත් හා ශේෂ පත්‍රය ආරක්ෂා කිරීමත් දියුණු කිරීමත් සිදු කරමින් අපගේ පාර්ශ්වකරුවන් හට ගුණාත්මක සේවාවක් ලබාදීමට අපි කැපවී සිටිමු."

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

ඒ අනුව අපගේ කාර්ය මණ්ඩලය පිළිබඳ නැවත අවධානය යොමු කර අවශ්‍ය තැන්හි දී සේවා මට්ටම් උසස් කළ අතර අපගේ සේවකයින්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා  අදාළ ක්ෂේත්‍රයේ කුසලතා වැඩි දියුණු කිරීමේ පුහුණුවීම් ලබා දී තිබිණි. අලෙවිය හා ප්‍රවර්ධනය නංවාලීම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල එහි දැක්ම වැඩි දියුණු කර ගෙන ඇත.

රක්ෂණය සඳහා යොමුවීමට මූල්‍ය ශක්තියක් නොමැති දිළිඳු ජනයාගේ මූල්‍ය තත්ත්වය නගා සිටුවීමට හා රක්ෂණය වෙත යොමු කිරීම ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන අරමුණ වේ. මෙය දිළිඳු ජනතාව වෙනුවෙන් ආරක්ෂණ ජාලයක් වීමේ අපගේ දැක්ම හා සමගාමීව සිදු වෙයි. වගා හානි සිදු වූ විට මූල්‍යමය වශයෙන් එයට මුහුණ දිය නොහැකි ගොවි ජනතාව ආරක්ෂා කිරීම සඳහා බැංකු හා මූල්‍ය සමාගම් සමග සහයෝගයෙන් කෘෂි ණය රැකවරණ යෝජනා ක්‍රමයක් සැලසුම් කර ඇත. කර්මාන්තයේ පවතින ප්‍රධාන බාධකයන්ගෙන් එකක් වන්නේ රක්ෂණයේ වැදගත්කම පිළිබඳව ඇති දැනුම හා අවබෝධය නොමැතිවීමයි. අනෙක් අතට කලාපයේ ඇති අනෙකුත් රාජ්‍යයන් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ රක්ෂණය සඳහා යොමුවීම ඉතා අඩු මට්ටමක පවතින අතර එමගින් රක්ෂණ කර්මාන්තය දියුණු කිරීමට ඇති හැකියාවන් පිළිබිඹු කරයි. එහෙයින් අපගේ ප්‍රධාන කාර්යය විය යුත්තේ මේ සඳහා පුද්ගලයින් දැනුවත් කිරීම වේ.

සුවිසල් ඉදිරි දියුණුවක් වෙත පිය නැගීම සඳහා අපගේ ඇති හැකියාව කෙරෙහි විශ්වාසය තබමින් අපගේ ශක්තිමත් අඩිතාලම මගින් පාර්ශ්වකරුවන්හට උපරිම ප්‍රතිලාභ ලබාදීම සඳහා අපි කැපවී සිටිමු. සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන් ලබාදුන් මනා සහයෝගය වෙනුවෙන් ද මෙම ආයතනය ඉදිරියටත් පවත්වාගෙන යෑම සඳහා සිය කැපවීම් සිදු කළ අපගේ සේවක මණ්ඩලය පිළිබඳව හා අප පිළිබඳව විශ්වාසය තැබූ අපගේ හිතවත් පාරිභෝගිකයින් වෙනුවෙන් ද මම මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි.



සනත් ද සිල්වා
ප්‍රධාන විධායක නිලධාරී

2017. 05. 23

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

## බාහිර පරිසරය

### ලෝක ආර්ථික ඉදිරි දැක්ම

දියුණු වූ ආර්ථිකයන් හි අඩු වර්ධනයක් සමඟ පස්වන වසරටත් නැගී එන හා දියුණුවන වෙළෙඳපොළ වර්ධනයේ අඩුවීම 2015 දී ගෝලීය ආර්ථික ක්‍රියාකාරීත්වය මන්දගාමීවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ සඳහා තෙවැදෑරුම් හේතුවක් බලපා ඇති අතර චීනය ආයෝජන හා නිෂ්පාදන මුල් කර ගත් ආර්ථිකයක් වෙත මාරුවීම නිසා ආනයන හා අපනයන වර්ධනයේ පසුගාමී ස්වරූපයක් ඇති විය. මේ සමඟින් චීන ආර්ථිකයේ අවිනිශ්චිත ඉදිරි දැක්ම වෙළෙඳාම, විශ්වාසය අඩුවීම හා මූල්‍ය වෙළෙඳපොළ් ඇති වූ විචල්‍යතාවයන් ලෙස අනෙකුත් ආර්ථිකයන්ට ද බලපෑම් ඇති කර තිබුණි. සාමාන්‍ය වශයෙන් නිෂ්පාදනය හා වෙළඳාම පසුබෑමක් පෙන්නුම් කළ ද එමගින් චීන ආර්ථිකයේ තත්ත්වය නිරූපණය නොවීම පමණක් නොව ගෝලීය ඉල්ලුමෙහි හා ආයෝජනවල අඩුවීමක් ද දක්නට තිබුණි. ගෝලීය වෙළඳාමට බලපෑමක් එල්ල වී තිබූ සංවර්ධනය වන හා නැගී එන ජාතීන්ගේ ආනයන සඳහා ඇති ඉල්ලුම අඩුවීම ප්‍රකටව දිස් විය.

බලශක්ති හා පාරිභෝජන භාණ්ඩවල මිල පහත බැසීම තවත් සාධකයකි. තෙල් මිල පහත බැසීම ඉන්ධන අපනයන කරුවන් මත අධි බරක් පැනවීමට හේතු වේ. සංවර්ධනය වෙමින් පවතින හා දියුණුවන ආර්ථිකයන්හි තෙල් අපනයන කරුවන්ට මෙය එලදායී වුවද බොහෝ ආනයන පදනම් වූ ආර්ථිකයන් තුළ පවත්නා අබණ්ඩ ණය පියවීමේ අවශ්‍යතාවය මත තෙල් පාරිභෝජනය දුර්වලවීමේ නැඹුරුවක් පෙන්වයි.

තෙවනුව 2015 පළමු කාර්තුව තුළ දී සංකෝචනයවීමෙන් පසු ප්‍රසාරණයවීමක් සඳහා ඇමෙරිකානු ආර්ථිකය සාක්ෂි දරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීමක් හා පොලී අනුපාත ප්‍රතිශතයෙන් කාලක් වැඩිකිරීම තුලින් ෆෙඩරල් සංචිත වැඩි කිරීම සිදු කර ඇත. මෙය ශුද්ධ අපනයනය අඩු කරමින් පාරිභෝගික වියදම් කෙරේ බලපෑම් එල්ල කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් තම ප්‍රක්ෂිප්ත වර්ධනය සංශෝධනය කරමින් 2015 දී 3.1% දක්වා පහත හෙළා ඇති අතර 2016 සඳහා ප්‍රක්ෂිප්ත වර්ධනය 3.4% ක් ලෙස දැක්වේ. චීනයේ වර්ධනය පහත වැටීම තෙල් මිල පහත වැටීම හා ඇ.එක්සත් ජනපදයේ ශක්තිමත් ප්‍රතිසාධනයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම මේ සඳහා හේතුවල අන්තර් ගත වේ.

### ශ්‍රී ලංකාවේ ආර්ථිකය

පශ්චාත් යුධ සමය හා රජයන්ගේ වෙනස්වීමත් සමග උසස් මධ්‍යම ආදායම් ලබන ආර්ථිකයක්වීමේ අභිලාෂය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දිගුකාලීන උපාය මාර්ගික හා ව්‍යුහාත්මක සංවර්ධන අභියෝග යන් කේන්ද්‍රගත කිරීම වෙත මාරු වී ඇත. ණය අරමුදල් යොදා ගනිමින් යටිතල පහසුකම් සංවර්ධනයෙන් බැහැරව පුද්ගලික අංශයේ වෙළඳපොළ කටයුතු මගින් වර්ධනයක් ලබා ගැනීමේ රජයේ අභිලාෂය පැහැදිලිව දක්වා ඇත. දළ දේශීය නිෂ්පාදිතයෙන් සේවා අංශය 62.4%ක් ලෙස ගණනය කර ඇති අතර ඉන් පසුව නිෂ්පාදන අංශය (28.9%) ලෙස හා කෘෂිකර්මාන්ත අංශය (8.7%) ලෙස ගණනය කර ඇත.

### විනිමය අනුපාතය

ශ්‍රී ලංකා රුපියල ඇ.ඩො. සාපේක්ෂව 2015 වසරේ බොහෝ කාල පරිච්ඡේදවල නොවෙනස්ව පැවති අතර අභ්‍යන්තර ප්‍රේෂණ හා අපනයන ඉපයීම් අඩුවීම මත අඛණ්ඩව වැඩිවන ගෙවුම් ශේෂ හිඟය කළමනාකරණය කිරීමේ උත්සාහයක් ලෙස විදේශ විනිමය වෙළඳපොළ කෙරේ ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් නොවීමේ ප්‍රතිපත්තියෙන් පසු 2015 සැප්තැම්බර් මාසයෙන් අනතුරුව දුර්වල වී ඇත.

**විනිමය අනුපාත - ඇ.ඩො. ට එදිරිව ශ්‍රී ලංකා රු. (මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)**

| අවසන් වූ වර්ෂය | ඇ.ඩො. |
|---|---|
| 2011 | 113.90 |
| 2012 | 127.16 |
| 2013 | 130.75 |
| 2014 | 131.05 |
| 2015 | 144.06 |

### උද්දමනය

සතුටුදායක දේශීය සැපයුම් තත්ත්වයන් පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ උද්ධමනය 5%ට අඩු තත්ත්වයක පැවතී ඇත. 2015 ජූලි - සැප්තැම්බර් කාල වකවානුව තුළ රුපියල අවප්‍රමාණවීම හේතුවෙන් උද්ධමනය ප්‍රථම වතාවට සෘණ අගයක්ව පැවතිනි. බැංකු ණය වර්ධනයවීම හා රජයේ සේවයේ ඇතුළු සියළු අංශවල වේතන ඉහළ අගයක් ගැනීම හේතුවෙන් 2015 වර්ෂය තුළ කොළඹ පාරිභෝගික මිල දර්ශකය 0.9%කට පහත බැස ඇත.

**උද්ධමන අනුපාතය - මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015**

| අවසන් වූ වර්ෂය | උද්ධමන අනුපාතය (වාර්ෂිකව (%) | වාර්ෂික සාමාන්‍ය කො.පා.මි. ද වර්ධනය |
|---|---|---|
| 2011 | 4.9 | 6.7 |
| 2012 | 9.2 | 7.6 |
| 2013 | 4.7 | 6.9 |
| 2014 | 2.1 | 3.3 |
| 2015 | 2.8 | 0.9 |

### පොළී අනුපාත

නිදහස් මූල්‍ය පරිසරයත් සමඟ පොලී අනුපාතයන් වසර පුරාවට අඩු මට්ටමක පැවතී ඇති අතර විටින් විට ඉහලයෑමක් සමාලෝචිත වර්ෂය තුලදී නිරීක්ෂණය වී ඇත. ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය 6%ක පැවතී ඇති අතරම ස්ථාවර ණය පහසුකම් අනුපාතය 7.5%ක පිළිවෙලින් පැවතී ඇත.

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

නිරන්තරයෙන් 6%ට වඩා අඩුවෙන් පොළී අනුපාතයන් පැවතීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 2015 අප්‍රේල් මස තුළ ප්‍රතිපත්තිමය අනුපාත අඩු කිරීමක් සිදු කර ඇත. 2015 දෙසැම්බර් 31 දිනට සතියේ සාමාන්‍ය බර තැබූ ප්‍රාථමික/මූල අනුපාතය 7.5%ක් ද, එක් වර්ෂයක් සඳහා වන භාණ්ඩාගාර බිල්පත් අනුපාතය 7.11%ක් ද වී ඇත.

### කර්මාන්තයේ ඉදිරි දැක්ම

කර්මාන්ත නියාමකයා වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකයේ තරඟකාරී හා පුළුල් ලෙස වර්ධනය වී ඇති රක්ෂණ අංශයේ 2015 අවසානය වන විට ලියාපදිංචි රක්ෂණ ආයතන සංඛ්‍යාව 29ක් වන අතර අංශයේ මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 394.2ක් වී ඇත. මෙයට සංසන්දනාත්මකව 2014 වර්ෂයේ අවසානයේ මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 406.8කි. දැරියහැකි ආදායම අඩු මට්ටමක පැවතීම රක්ෂණ සංකල්පය හා එමඟින් අසීරු අවස්ථාවන්හි දී ලබා ගත හැකි මූල්‍යමය ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය හා තේරුම් ගැනීම අඩුවීම් තුළ රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් අවබෝධය අඩු මට්ටමක පවතී. නොමිලේ ලබා දෙන අධ්‍යාපනය හා සෞඛ්‍ය පහසුකම් මෙන්ම විශ්‍රාම වැටුප් ලබා ගන්නා පුද්ගලයන් හඳුනාගත ඇති අතර ඔවුන් රක්ෂණ භාවිතයෙන් බැහැර වන නමුත් මූල්‍යමය අනුබලයක් අවශ්‍ය වූ විට එය රජය වෙතින් අපේක්ෂා කරයි.

2011 වසරේ හඳුන්වාදීමෙන් අනතුරුව 2015 මුල් භාගයේ දී ක්‍රියාවට නංවන ලද නව රෙගුලාසි මඟින් රක්ෂණ ක්‍රියාකාරීන් හට තම රක්ෂණ අවස්ථා නිෂ්පාදිතයන් පන්ති ආකාරයට බෙදා වෙන් කරන ලෙසත්, සංයුක්ත රක්ෂණ ආයතන වෙත තම රක්ෂණ කටයුතු ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ලෙස සමාජ කොටස් අනුව ඛණ්ඩනය කරන ලෙසද දක්වා ඇත. මෑතකාලීනව, ප්‍රධාන වශයෙන් දිගුකාලීන ප්‍රාග්ධන කාර්යක්ෂම ලෙස භාවිත කිරීමට අනුබල දීම මෙන්ම විවිධ සමාජ කාණ්ඩයන් අවධානම් ඉලක්ක කර ගත් ප්‍රාග්ධන දෘෂ්ටිකෝණයෙන් කළමනාකරණය සුරක්ෂිත කිරීම අරමුණු කෙරිණි. වර්තමානයේ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සිදු කරන සංයුක්ත රක්ෂණ ආයතන 04ක් ද, සාමාන්‍ය රක්ෂණ කටයුතු සිදු කරන ආයතන 14ක් ද, ජීවිත රක්ෂණ කටයුතු සිදු කරන ආයතන 11ක් ද පමණක් පවතී. මීට අමතරව, බහුතරයක් සාමාන්‍ය රක්ෂණ කටයුතු කෙරේ වැඩි අවධානය යොමු කරනු ලබන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදංචිවී ඇති රක්ෂණ තැරැව්කාර ආයතන 57ක් පිහිටා ඇත.

විමර්ශිත වර්ෂය තුළ අවදානම් මූලික කරගත් ප්‍රාග්ධන රාමුව හඳුන්වාදීම සිදු කර ඇත. මීට අමතරව, නියාමනය සඳහා වන ප්‍රාග්ධන අවශ්‍යතාව රු. මිලියන 100 සිට රු. මිලියන 500 දක්වා ඉහළ නංවා ඇත. මෙම වෙනස කුඩා ප්‍රමාණයේ තරඟකරුවන් හට අභියෝගයක් වුව ද, එමඟින් පූර්වාපේක්ෂිත අනාගතයේ වැඩි එකමුතුභාවයක් අපේක්ෂාවෙන් සිදු කර ඇති ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් 2016 කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සියළුම රක්ෂණකරුවන්ගෙන් ඉල්ලා ඇත්තේ එයින් මූල්‍ය වෙළඳපොළ වර්ධනය මෙන්ම විදේශ විනිමය ලබා ගත හැකි විශාල අන්තර් ජාතික ආයතන සඳහා නිදහස ලබාදීමෙන් රක්ෂණ අංශයේ විනිවිදභාවය වැඩිවීම සිදු වන බැවිනි.

මේ සියළුම වෙනස්කම් තුළින් කර්මාන්තයේ ස්ථිරභාවය, විනිවිදභාවය, ආයතනික පාලනය සහ මනා අවදානම් කළමනාකරණය සමඟම වෙළඳපොළ කටයුතු කඩිනම්කිරීම අපේක්ෂා කෙරේ.

# මූල්‍ය සමාලෝචනය

ජා.ර.භා. අරමුදල ශුද්ධ ඉපයූ වාරිකය රු. බිලියන 7.9ක් 2015 වර්ෂයේ දී වාර්තා කර ඇති අතර එය 2014 දී පැවති රු. බිලියන 8ට අනුව සුළු පහත වැටීමකි. මේ සඳහා මූලික වශයෙන් කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය මාරුවීම තුළ භෝග රක්ෂණ වාරිකය පහළ වැටීම හේතු වී ඇත. අදාළත්වය හා විවිධාංගීකරණය වූ ජාලය මගින් ඵලදායී ලෙස හිමිකම් පියවීමේ හැකියාව සලකා බලමින් ජා.ර.භා. අරමුදල යටතේ වූ භෝග රක්ෂණ ක්‍රමය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට පවරා දී ඇත. ජා.ර.භා. අරමුදල විසින් ශුද්ධ ලිඛිත වාරික ආදායම රු. බිලියන 3.8ක් ලෙස වාර්තා කර ඇති අතර 2014 වර්ෂයේ වූ රු. බිලියන 4.2ට සාපේක්ෂව එය 8.6ක අඩුවීමකි.

ඉහල පොලී අනුපාතයන් යටතේ අයෝජනයකල ඉහල දැමූ ද්‍රවශීලතාවය නිසා ඉපයූ ඉහල පොලී ආදායම 2014 වසරේ දී වාර්තාවූ රු. මිලියන 639 හා සැසඳීමේ දී සාමාලෝචිත වර්ෂය තුල දී ලබාගත් රු. මිලියන 856 ක අතිරේක ආදායමට හේතුවී ඇත. වර්ෂය අවසානයේ ඇමෙරිකානු ඩොලර් වලින් නම්කරන ලද ඉතුරුම් ගිණුම් වලින් ඉපයූ විනිමය රුපියලට සාපේක්ෂව ඇ. ඩොලරයේ අගය ඉහලයාම සම්බන්ධයෙන් ජා.ර.භා අරමුදලට වාසි සහගත තත්ත්වයක් උදාවී තිබිනි.

ජා.ර.භා. අරමුදල නීතිගත කිරීමට පෙර එවකට ශ්‍රී ලංකා රජය යටතේ ක්‍රියාත්මක වූ අරමුදලක්වන වැඩ වර්ජන, කැරළි, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා නිසා වන හානි ප්‍රතිපූර්ණ අරමුදල මගින් කුඩා ණය අවශ්‍යතා සඳහා වියදම් කිරීම සිදු කර ඇත. මෙම ණය ලබාදී ඇත්තේ සිවිල් අරගල සමයේ ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක් වූ විශාල ප්‍රමාණයේ ඉදි කිරීම් සඳහා සහනශීලී අනුපාතිකයන් යටතේය. 2006 දී ජා.ර.භා. අරමුදලට මාරු කරනු ලැබූ මෙම ණය පියවී යාම හේතුවෙන් ඉන් ලැබෙන පොලී ආදායම මේ වන විට අඩු වී ඇත.

කාර්ය මණ්ඩල සම්පාදන පිරිවැය සමග අලෙවිකරණය හා ව්‍යාප්තකිරීම් සඳහා අදාළ පිරිවැය හේතුවෙන් පසුගිය මූල්‍ය වර්ෂයේ රු. බිලියන 4.6ක්ව පැවති ජා.ර.භා. අරමුදල් බදු පෙර ලාභය රු. බිලියන 4.4ක්ව ඇත. ජා.ර.භා. අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 12.2 එනම් 2014 ට සාපේක්ෂව රු. බිලියන 01ක වර්ධනයක් පෙන්නුම් කරන අතර එය මූලික වශයෙන් රජයේ සුරැකුම්පත් එහි සමුච්චිත අරමුදල 2014 දී පැවති රු. බිලියන 7.7ට එරෙහිව රු. බිලියන 8.6ක් රැස් කර තිබීම තුළින් මූල්‍ය ආයෝජනයන් වර්ධනයවීමෙන් පැන නැගී ඇත.

**දළ ලිඛිත පාරිතෝෂික කාණ්ඩ අනුව වෙන් කිරීම - 2015**

| අගය රු. | 2015 | 2014 |
|---|---|---|
| ප්‍රතිරක්ෂණ ලැබීම් | 1,737,839,949 | 2,041,207,710 |
| වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදය | 3,018,417,937 | 2,835,199,980 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 242,090,517 | 142,690,974 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 36,599,503 | 22,595,787 |
| විගා රක්ෂණය | - | 787,372,981 |
| පාර්ලිමේන්තු සාමාජිකයින් සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රමය | 27,737,796 | 13,000,000 |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය සඳහා ලද මුළු දායකත්වය | 1,636,567,419 | 1,494,899,976 |
| එකතු කරන ලද විගා රක්ෂණ අයවීම් | 1,259,134,207 | 1,184,647,255 |

# ආංශික විවරණය

## අග්‍රහාර

අග්‍රහාර වෛද්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය රාජ්‍ය සේවකයින්ගේ ප්‍රතිලාභ සඳහා හඳුන්වා දෙන ලද අතර එමගින් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වෙයි. 1997 සිට වසර 19කට පෙර ආරම්භ කරන ලද්දේ නාමික දායකත්වයක් ලබා දීමේ පදනමින් වූ අතර වර්තමානයේ මේ වන විට විශ්‍රාම වැටුප් හිමි සෑම අයෙකුගේම වැටුපෙන් මාසික දායක මුදලක් අය කිරීමේ ක්‍රමයට මෙය ක්‍රියාත්මක වෙයි.

මූලාරම්භයේ දී මෙය ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව මගින් සිදු කරන ලද අතර එම ආයතනය පෞද්ගලීකරණයත් සමගම 2006 ජනවාරි සිට ක්‍රමිකව මෙය රජය මගින් ක්‍රියාත්මක කිරීම අරඹන ලදී. වර්තමානයේ මෙම ව්‍යාපෘතිය ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සහයෝගය ඇතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් මෙහෙයවීම කරනු ලබයි. වර්තමානයේ 825,000 පමණ සාමාජික සංඛ්‍යාවක් මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කරනු ලබන අතර ආසන්න වශයෙන් එම සාමාජික පවුල්වල සෙසු සාමාජිකයින් ඇතුලුව මිලියන 2.2 ක ජනගහනයක් ආවරණය කරයි.


ජාතික රක්‍ෂණ භාර අරමුදල් මණ්ඩලය විසින් රක්‍ෂණ වන්දි මුදල් ගෙවීම් වේගවත් කිරීමේ අරමුණින් නව පරිගණක ගත වැඩසටහනක් හඳුන්වාදීමට කටයුතු කර ඇත. ඒ අනුව එම අයදුම්පත් සමග අදාළ සියලුම අවශ්‍යතා සපුරා තිබේ නම් දින 3ක කාලයක් තුළ ගෙවීම් කිරීමට හැකියාව ලැබී ඇත. මීට අමතරව ''ලංකා හොස්පිටල්, හේමාස් හොස්පිටල්, නවලෝක රෝහල, යාපනය උතුරු රෝහල, රත්නපුර සිංහ රෝහල, මාවනැල්ල ඔසරෝ රෝහල, ගාල්ල සමූපකාර රෝහල් සංගමය'' වැනි නමගිය රෝහල් සමූහයක සහයෝගීතාව ඇතිව ''ඊ-කාඩ්පත්'' මගින් රෝහල් ගතවීමක දී හා බාහිර ප්‍රතිකාර ලබාගැනීම් වලදී විශේෂිත ප්‍රතිලාභ හා වට්ටම් ලබාදීම් සිදු කරනු ලැබේ. මෙම සෞඛ්‍ය ආරක්‍ෂණ ක්‍රමය මගින් පහත සඳහන් ප්‍රතිලාභ ඇතුළත් මානුෂික ප්‍රතිලාභ ලබා දෙයි.

- රෝහල් ගාස්තු ප්‍රතිපූර්ණයට, රෝහල් ගාස්තු, ශල්‍යකර්ම හා ඒ ආශ්‍රිත වෛද්‍ය වියදම්, විශේෂඥ වෛද්‍ය ගාස්තු හා අනෙකුත්, වෛද්‍ය පරීක්‍ෂන ගාස්තු හා රෝහල් ගත ප්‍රතිකාර වියදම් ඇතුලත් වේ.
- හෘද රෝග සඳහා වන ශල්‍යකර්ම ගාස්තු ප්‍රතිපූර්ණයට රු. 400,000 සිට රු. 500,000 දක්වා වැඩි කිරීම.
- පිළිකා හා වකුගඩු ආශ්‍රිත ශල්‍යකර්ම සඳහා ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල රු. 150,000 සිට රු. 200,000 දක්වා වැඩි කිරීම.
- රු. 100,000කට තිබූ ස්වභාවික මරණයකදී ගෙවන ලද මුදල රු. 150,000 දක්වා වැඩි කිරීම.
- සෑම වසර 3කට වරක්ම ගෙවනු ලබන අස් කණ්නාඩි මිලට ගැනීමට අදාළ ප්‍රතිපූර්ණ මුදල රු. 3,500 ක් ගෙවීම.

අනුරාධපුර හා හම්බන්තොට ආරම්භ කර ඇති ප්‍රාදේශීය කාර්යාලයන්ට අමතරව දිවයිනේ සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක්ම ආවරණය වන පරිදි නියෝජිත ඒකක 18ක් පිහිටුවීම මගින් 'අග්‍රහාර'සාමාජිකයින්ට සේවා සැපයීම සිදුකරයි. මේ සෑම ඒකකයක්ම සම්බන්ධීකරණ නිලධාරියෙකු මගින් කළමනාකරනය කරන ලබන අතර දැනුවත් කිරීම් හා ප්‍රවර්ධනය මගින් ව්‍යාපාර කටයුතු නඟා සිටුවීමට කටයුතු කරයි. සාමාලෝචිත වර්ෂය තුල දී මෙම ඒකකයන් ගෙන් කීපයක ව්‍යාපාරික ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කර ඇත.

අග්‍රහාර අංශයෙහි දළ ආදායම්වලින් 99%ක්ම සමන්විත වනුයේ දළ රක්‍ෂණ වාරික වන අතර එය රු. බිලියන 1.64කි. එය රු. බිලියන 1.49ක සිට 9.4% කින් වැඩි වී ඇත. එය මූලිකව රක්‍ෂණ වූ සාමාජික සංඛ්‍යාවේ වර්ධනය මත පදනම් වී ඇත. තව ද වාර්ෂික පොලී ආදායම වර්ෂයෙන් වර්ෂය රු. 569,491 සිට රු. මිලියන 3.29 දක්වා 477% පමණ වැඩිවීම තුළින් මෙම වර්ධන තත්ත්වය තවදුරටත් සාක්‍ෂි දරයි. මීට ප්‍රධාන වශයෙන්ම අතිරික්ත ද්‍රවශීල මුදල් භාණ්ඩාගාර බිල්පත් හා කෙටිකාලීන ප්‍රති විකුනුම් ආයෝජන වල යෙදවීම මත උපයා ගැනීමට හැකි වූ පොලී ආදායමකි.

| රු. | 2015 (රු.) | 2014 (රු.) |
|---|---:|---:|
| දළ රක්‍ෂණ වාරික | 1,636,567,419 | 1,494,899,976 |
| පොලී ආදායම | 3,290,985 | 569,491 |
| වෙනත් ආදායම් | 40,750 | 169,835 |
| මුළු ආදායම | 1,639,899,154 | 1,495,639,302 |




# ආංශික විවරණය

**අග්‍රහාර රක්ෂණ ප්‍රතිපූර්ණ වර්ගීකරණය - 2015 වර්ෂය**


| ප්‍රතිපූර්ණ වර්ගය / ප්‍රතිපූර්ණ සංඛ්‍යාව | මුලු ප්‍රතිපූර්ණ ලැබීම් | | ගෙවන ලද ප්‍රතිපූර්ණ | | ගෙවීමට ඇති ප්‍රතිපූර්ණ | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| මරණ | 1,137 | 1,649 | 840 | 1,413 | 278 | 213 |
| දුබලතා | 359 | 198 | 310 | 152 | 36 | 42 |
| දරූ උපත් | 10,427 | 10,851 | 9,167 | 9,829 | 964 | 662 |
| පිළිකා | 352 | 529 | 310 | 449 | 29 | 55 |
| හෘදයාබාධ | 664 | 783 | 653 | 757 | 7 | 16 |
| ඇස් කණ්නාඩි | 60,205 | 72,672 | 52,760 | 65,434 | 3,019 | 2,341 |
| වෙනත් රෝග සඳහා රජයේ රෝහල් ගාස්තු | 29,565 | 31,777 | 26,624 | 28,745 | 1,927 | 2,044 |
| වෙනත් රෝග සඳහා පෞද්ගලික රෝහල් ගාස්තු | 15,215 | 19,497 | 12,296 | 15,779 | 1,497 | 1,823 |
| වකුගඩු රෝග | 16 | 5 | 14 | 5 | - | - |
| අංශභාග රෝගය | 1 | 1 | 1 | - | - | - |
| එකතුව | 117,941 | 137,962 | 102,975 | 122,563 | 7,757 | 7,196 |

**අග්‍රහාර රක්ෂණ ආවරණ වර්ගීකරණය**



# ආංශික විවරණය


### රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම් සාරාංශය




### ශුද්ධ ප්‍රතිලාභ ගෙවීම්

| රු. | 2015 | 2014 |
|---|---|---|
| සාමාජිකයින්ගේ දායකත්වය | 1,236,567,419 | 1,094,899,976 |
| මහාභාණ්ඩගාරයේ දායකත්වය | 400,000,000 | 400,000,000 |
| මුළු දායකත්වය | 1,636,567,419 | 1,494,899,976 |
| ප්‍රතිලාභ වියදම් | (1,561,625,099) | (1,228,123,716) |
| ඌණතාවය/අතිරික්තය | 74,942,320 | 266,776,260 |

### ප්‍රතිලාභ වියදම් 2015




### වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී වන්දි අරමුදල් (SRCC&TF)

ජාතික රක්ෂණ සංස්ථාව මගින් 1987 වර්ෂයේදී ආරම්භකර කළමනාකරණය කරන ලද අතර වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී වන්දි අරමුදල් පිහිට වුයේ සාමාන්‍ය රක්ෂණ ආවරණ යටතේ සිදු වන දේපල හානි හා අලාභයන් සඳහා ගෙවීමට සිදු වන හානි ප්‍රතිපූර්ණය කිරීමේ අරමුණිනි. එය තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ලංකා භූමි භාගය තුළ සිදුවන මහජන වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී කටයුතු ආදිය නිසා පුද්ගලයින්ට වන හදිසි අනතුරු සහ ශාරීරික හානි ආදිය ආවරණය කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි රක්ෂණ සමාගම් 17ක් පමණ මෙම වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී කටයුතු වලින් වූ හානි සඳහා රක්ෂණ ආවරණ ලබා දීමට ඉදිරිපත් වි ඇත.

- සී/ස ඒෂියන් ඇලයන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම
- සී/ස සණස ඉන්ෂුවරන්ස් සමාගම
- අමානා ටකාෆුල් පී.එල්.සී.
- සී/ස සමූපකාර රක්ෂණ සමාගම
- සී/ස සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම
- සී/ස ඒ.අයි.ඒ. ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම
- සී/ස එච්.එන්.බී. ජෙනරල් රක්ෂණ සමාගම
- සී/ස ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම
- සී/ස එම්.බී.එස්.එල්. ඉන්ෂුවරන්ස් සමාගම
- සී/ස ඇලයන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම
- සී/ස යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් සමාගම
- සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
- සී/ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම
- පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.
- සී/ස එල්.ඕ.එල්.සී. ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම
- සී/ස ඔරියන්ට් ඉන්ෂුවරන්ස් සමාගම
- ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය

# ආංශික විවරණය

| රු. | 2015 (රු.) | 2014 (රු.) |
|---|---:|---:|
| දළ ලිඛිත වාරික | 3,018,417,937 | 2,835,199,980 |
| ආයෝජන ආදායම | 550,349,604 | 479,257,678 |
| වෙනත් ආදායම් | 3,198,218 | 11,937,931 |
| මුළු ආදායම | 3,571,965,759 | 3,326,395,589 |

## ප්‍රතිරක්ෂණය

විදේශ විනිමය රඳවා ගැනීමේ අභිප්‍රාය ඇතිව 2008 වර්ෂයේ දී රට තුළ ක්‍රියාත්මක සියළුම ප්‍රාථමික රක්ෂණ සමාගම්වලට උපකාර කිරීමේ අරමුණින් යුතුව ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ප්‍රතිරක්ෂණ කටයුතුවලට අදාළ අවදානම් භාර ගැනීමේ කටයුතු අරඹන ලදී. ජාතික රක්ෂණ භාර අරමදල වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක එකම ප්‍රතිරක්ෂණ ආයතනය වන අතර ඒඅනුව ජාතියේ ප්‍රතිරක්ෂකයා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සාමාන්‍ය රක්ෂණ සමාගම්වල මුළු ප්‍රතිරක්ෂණ වටිනාකමින් 30%ක ප්‍රමාණයක් ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවක් වෙයි. එහිදී ප්‍රාථමික රක්ෂණ සමාගම් මගින් ඉදිරිපත් වන පිළිගත හැකි ඕනෑම වටිනාකමක හිමිකම් සදහා ජාතික රක්ෂණ භාර අරමුදලේ දායකත්වය ගෙවීමට පැවරී ඇත. තවද ජාතික රක්ෂණ භාර අරමුදල මගින් විශේෂිත වූ අසාමාන්‍ය අහිතකර ආකාරයේ හානි ප්‍රතිපූර්ණයක් තුළින් එහි ශේෂ පත්‍රයට ඇති විය හැකි අහිතකර බැලපෑම් ආවරණය කිරීම සඳහා ප්‍රතිරක්ෂණ (Retrocession Cover) ආවරණයක් ද ලබා ගෙන ඇත.

| රු. | 2015 (රු.) | 2014 (රු.) |
|---|---:|---:|
| දළ ලිඛිත වාරිකය | 1,737,839,949 | 2,014,207,710 |
| ආයෝජන ආදායම | 186,086,647 | 78,837,436 |
| වෙනත් ආදායම් | 23,719,435 | 948,265 |
| මුළු ආදායම | 1,947,646,031 | 2,093,993,411 |

## රථවාහන රක්ෂණය

රජයේ පූර්ණ හිමිකාරීත්වයෙන් යුතු ආයතනයක් වන ජාතික රක්ෂණ භාර අරමුදල මගින් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලට දැරිය හැකි වාරික මුදලකට සම්පූර්ණ සහ තෙවන පාර්ශවීය රක්ෂණ ආවරණ සපයනු ලබයි. මෙම අංග සම්පූරණ රක්ෂණ ආවරණය මගින් ගින්නෙන්, සොර සතුරු, තුන්වන පාර්ශවයේ (මරණ හා තුවාලවීම්) ද ඇතුළුව ගංවතුර, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා නිසා වන හානි සියල්ල ආවරණය කරනු ලබයි.

තරඟකාරී තත්ත්වය තුළ ජාතික රක්ෂණ භාර අරමුදල මගින් දිවයින පුරා ආවරණය වන පරිදි අනතුරු හානි තක්සේරුව කඩිනමින් පහසු ගරාජයක් මගින් අළුත්වැඩියා කර ගැනීමට හැකි වන පරිදි අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කර දින 03ක් තුල වන්දි ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව මෙම රක්ෂණ ආවරණය තවදුරටත් පුළුල් කරමින් රජයේ සේවයේ ක්ෂේත්‍ර නිලධාරීන් පරිහරණය කරනු ලබන මෝටර් සයිකල් සඳහා ද දිවයින පුරා ආවරණය වන පරිදි ව්‍යාප්ත කර ඇත.

මීට අමතරව තවදුරටත් මෙම රක්ෂණ ක්ෂේත්‍රයෙහි ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ගංවතුර ආරක්ෂණය, තෙවන පාර්ශවයේ දේපල හානි ආවරණය, තීරුබදු නිදහස් නැව්ගත කිරීමේ ආවරණය, කුලීපිට මිලදී ගැනිම් ආවරණය, වායු ආරක්ෂන ආවරණය, රැගෙන යෑමේ ගාස්තු ආවරණය, ඉදිරිපස ප්‍රධාන වීදුරු ආවරණය, රියදුරු පුහුණු ආවරණය, සේවක වන්දි ආවරණය මගින් සඳහා වන භෞතික වගකීම් පිළිබඳ ආවරණය සහ මාර්ගස්ථ භාණ්ඩ සඳහා වන ආවරණය ආදී රක්ෂණ ආවරණ රැසක් හඳුන්වා දී ක්‍රියාත්මක කරනු ලබයි.


සලකා බලනු ලබන වර්ෂය තුළ දී පැය 24ක් පුරා ක්‍රියාත්මක සෘජු ඇමතුම් මධ්‍යස්ථාන හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට සමගාමීව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක ශාඛා කාර්යාල තුළින් ඉදිරිපත් වන වන්දි ගෙවීම් කඩිනම් කිරීම හා වන්දි ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීමට කටයුතු කර ඇත. දිවයින පුරා ආවරණය වන පරිදි නිපුණතාවයෙන් යුතු තක්සේරු නිලධාරී කණ්ඩායමක සේවය ලබා ගනිමින් ඉදිරිපත් වන අනතුරු වන්දි කඩිනම් කිරීමට ද කටයුතු කර ඇත.

| රු. | 2015 (රු.) | 2014 (රු.) |
|---|---:|---:|
| දළ ලිඛිත වාරිකය | 242,090,517 | 142,690,974 |
| ආයෝජන ආදායම | 34,621,732 | 34,530,790 |
| වෙනත් ආදායම් | 21,181,827 | 1,193,618 |
| මුළු ආදායම | 297,894,076 | 178,415,382 |

මෝටර් රථ වාහන අංශය සලකා බැලීමේ දී දළ ලිඛිත වාරික ආදයම වර්ෂයෙන් වර්ෂයට ශුද්ධ ආදායම් වර්ධනය 70% සිට 78% දක්වා සතුටුදායක ලෙස වර්ධනයවීමක් වාර්තා ගත වී ඇත. නව කළමනාකාරීත්වයේ මෙහෙයවීම මත අලෙවිකරණ සහ ප්‍රවර්ධන කාර්ය මණ්ඩල වැඩි කිරීම සහ දායකත්වය මත කාර්ය සාධනයන් ඉහළ ගිය අතරම එහි ප්‍රතිඵලයක් ලෙස අවසාන වශයෙන් ඉහළ පාරිභෝගික සේවාවක් සැපයීමට හැකි විය. මෝටර් වාහන රක්ෂණ අංශය මගින් ද සාමාන්‍ය රක්ෂණ හිමිකරුවන් හට ද රක්ෂණ පිළිබඳ ලිඛිත සහතික තිබීම වෙනුවට රක්ෂණ කාඩ්පත මගින් මෝටර් වාහන රක්ෂණකරුවන් හට සේවා සැපයීම අරඹන ලදී. තව ද රක්ෂණ කටයුතුවල දී ලිපි තැපැල් කිරීම මගින් ගනු දෙනු කරුවන් ඒ සඳහා වැඩි ප්‍රියතාවයක් නොදක්වන බව හඳුනා ගත් අතර ඒ අනුව සලකා බලනු ලබන වර්ෂය තුළ දී ඒ සඳහා ප්ලාස්ටික් කාඩ්පතක් හඳුන්වාදීම තුළින් ගනුදෙනුකරුවන්ගේ සිත් දිනා ගැනීමක් ඇති කර ගැනීමට ද හැකි විය. ඒ තුළින් අප ආයතනයේ ආදායම් තත්ත්වය වැඩි වර්ධනය කර ගැනීමට ද හැකි විය.

# ආංශික විවරණය

| කාණ්ඩය | 2014 | | 2015 | |
|---|---|---|---|---|
| | හිමිකම් ප්‍රමාණය | ප්‍රමාණය (රු. මිලියන) | හිමිකම් ප්‍රමාණය | ප්‍රමාණය (රු. මිලියන) |
| පෞද්ගලික කාර් රථ | 392 | 32.77 | 258 | 33.02 |
| මෝටර් සයිකල් | 42 | 0.52 | 966 | 13.89 |
| මෝටර් බස් රථ | 117 | 12.28 | 91 | 9.52 |
| ලොරි/ඉඩම් වාහන | 68 | 6.46 | 51 | 4.34 |
| ද්විත්ව කාණ්ඩ වාහන | 272 | 19.85 | 220 | 26.51 |
| එකතුව | 891 | 71.87 | 1,586 | 87.27 |




### සාමාන්‍ය රක්ෂණය (මෝටර් රථ වාහන නොවන)

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සාමාන්‍ය රක්ෂණ (මෝටර් රථ වාහන නොවන) කටයුතු ගිනි, මුහුදු, වෛද්‍ය හා විවිධ යන උප කාණ්ඩවලට බෙදා ඇති අතර එයින් පසුව සඳහන් කල කාණ්ඩයට සේවකයන් සඳහා වන්දි ගෙවීම, පුද්ගල අනතුරු, ගමනාගමන (Travel) සහ සොරබිය ආවරණය ආදී නව රක්ෂණ යෝජනා ක්‍රම ඇතුලත්වේ. සාමාන්‍ය රක්ෂණ අංශය දිවයින පුරා ආවරණය වන පරිදි නිපුනතාවයෙන් යුතු අලාභ තක්සේරුකරුවන් යෙදවීම මගින් ඉදිරිපත් වන හිමිකම් සෑම අයදුම්පත් සඳහා ක්ෂණිකව අවධානය යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන කඩිනමින් නිරවුල් කිරීමට හැකි විය.

මෙම අංශය මගින් ගිනි රක්ෂණය, කොන්ත්‍රාත්කරුවන්ගේ සියළුම අවදානම් රක්ෂණය, වැඩකරුවන්ගේ වන්දි රක්ෂණය, සොර සතුරු රක්ෂණය, කොන්ත්‍රාත්කරුවන්ගේ යන්ත්‍ර උපකරණ රක්ෂණය, පුද්ගල අනතුරු රක්ෂණය, නාවුක හා ගුවන් භාණ්ඩ රක්ෂණය, මාර්ගස්ථ මුදල් රක්ෂණය, විද්‍යුත් උපකරණ රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය සහ බැංකු ආශ්‍රිත හානි රක්ෂණය යනාදී රක්ෂණ ක්‍රම බොහෝමයක් ක්‍රියාත්මක කරනු ලබයි.

| රු. | 2015 (රු.) | 2014 (රු.) |
|---|---|---|
| දළ ලිඛිත වාරිකය | 36,599,503 | 22,595,787 |
| ආයෝජන ආදායම | 6,516,870 | 12,717,852 |
| වෙනත් ආදායම් | 38,087 | 183,465 |
| මුළු ආදායම | 43,154,460 | 35,497,104 |

# සමායතනික පාලනය

යහපාලන සහ සමායතනික පාලන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් සාමූහික යහපාලන රෙගුලාසි හා භාවිතයන් සහ රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මඟපෙන්වීම්වලට අනුකූලව කටයුතු කරන අතර රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඉහළ ගුණාත්මකභාවය රැක ගනිමින් ජාතික රක්ෂණ භාර අරමුදල ක්‍රියාත්මක වෙමින් ක්ෂේත්‍රයේ සිය ස්ථාවරත්වය රැක ගැනීම සඳහා නිරන්තරයෙන්ම කටයුතු කරන ලදි, ඊට අමතරව ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සියළු කාර්ය මණ්ඩලය අරමුදලෙහි අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීම අරමුණු කරගත් රීති මාලාවකට අනුගත කර ක්‍රියාත්මක වන අතරම ඒ තුළින් සේවකයින්, රජය සහ මහජනයා පිළිබඳව සහ ගණුදෙනුකරුවන්ගේ විශ්වාසනීයත්වය සුරක්ෂිත කිරීමට අරමුණු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඒ ආශ්‍රිත කමිටුවල කාර්යක්ෂමභාවය හා ඒවායේ කාර්ය මණ්ඩලයේ මනා සහයෝගීතාවය සහ විනිවිධභාවයෙන් යුතු සන්නිවේදන පද්ධතිය පැවතීම තුළින් මනා යහපාලන පැවැත්මක් තහවුරු කර ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සමායතනික පාලනයේ හරය වන අතර ඒ අනුව යමින් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් එහි සියළු පාර්ශ්වකරුවන් හට වගකීමට බැඳෙන අතරම ජාතික රක්ෂණ භාර අරමුදල කාර්යක්ෂමව කළමනාකරණය කරමින් පවත්නා නෛතික හා ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන් තුළ කටයුතු කරමින් එහි ඉලක්ක ගත අරමුණු ළඟා කර ගැනීමට බැඳී සිටියි. ඒ සඳහා ආයතනය තුළ යෝග්‍ය පාලන පද්ධතියක් ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම පිළිබඳව සහතික විය යුතු වේ. 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත අනුව එහි සභාපතිවරයා පත්කර ඇත්තේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වේ.

මෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පවත්නා ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව තුළ කටයුතු කරමින් ආයතනයේ වටිනාකම් එකතු කිරීමක් තුළින් කාර්යක්ෂමව දිගුකාලීන සේවා සැපයීමක් සහිතව මනාව මෙහෙයවීම පිළිබඳව සියළුම සම්බන්ධිත පාර්ශවකරුවන් වෙත වගකීමට බැඳෙනු ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩල වගකීම ආයතනය තුළ කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන අරමුණු පිහිටුවීම උදෙසා ව්‍යවසායකත්වය නායකත්වයදීම සහ උපායමාර්ගික මගපෙන්වීම කළ යුතු වේ.

මේ සඳහා සමස්ථ ව්‍යාපාරික සැලසුම් කිරීමට මඟ පෙන්වීම පැහැදිලිව සැලසුම්කළ සහ නිශ්චිත මානව සම්පත් පද්ධතියක් ඇති කිරීම ව්‍යවස්ථාමය අනුකූලතාව පිළිබඳ මඟපෙන්වීම, අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණ මඟපෙන්වීම් මෙන්ම විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික ආයෝජන සැලසුම් විමර්ශනයන් ද ඇතුළත් වේ.

සමාලෝචනයට භාජනය කරනු ලබන කාලය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 7ක් පවත්වා ඇති අතර සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පැමිණීම තුළින් සිය වගකීම ඉටු කිරීමට ඇති අවංක කැපවීම මනාව ප්‍රදර්ශනය කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මූල්‍ය තත්ත්වය, ව්‍යාපාරික දියුණුව, අරමුණු ළඟා කර ගැනීම අවධානම් සඳහා නිරාවරණයවීම සහ ව්‍යවස්ථාපිත අනුකූලතාව යනාදී සියළු කරුණු පිළිබඳව සිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම් කර ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම් 2015

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය එහි අවශ්‍ය පරිදි නියමිත රැස්වීම් පවත්වමින් ආයතනයේ සිදුකරමින් පවතින ව්‍යාපාරික කටයුතු සාකච්ඡාවට භාජනය කරයි. සියළුම නොපැමිණීම් කල් ඇතිව දැනුම් දී වාර්තා ගත කර ඇති අතර නොපැමිණි සාමාජිකයින් වාර්තා කිරීම මගින් දැනුවත් කිරීමට ද කටයුතු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ද කල් ඇතිව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර බෙදා හැරීම් කර කාර්යක්ෂම සහ ධනාත්මක සාකච්ඡාවකට භාජනය කිරීමකට අවශ්‍ය පරිසරය ගොඩනගන ලදී. ඒ අනුව වර්ෂය තුළ අවස්ථා 7කදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

ගයනි සියඹලාගොඩ මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල තීරණ වාර්තා කිරීම හා රැස්වීම් සංවිධානය කිරීම තුලින් අධ්‍යක්ෂක මණ්ඩලය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යයි.

### මූල්‍ය ප්‍රකාශන

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ අනෙකුත් අදාළ නෛතික රෙගුලාසිවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

### ප්‍රසම්පාදන කටයුතු

මෙම ප්‍රසම්පාදන කටයුතු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ක්‍රියාත්මක කර ඇති අතර මෙම කටයුතු අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුවක් මගින් තීරණය ගෙන ක්‍රියාවට නංවන ලදී. වටිනාකමට අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

### විගණන කමිටුව

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත්කර ඇති විගණන කමිටු සඳහා වන හොඳම භාවිතයන් සංග්‍රහය අනුව කාර්යයන් සහ වගකීම් විධිමත්ව සකසා ඇති විගණන කමිටුවේ පිහිටුවීම සමාලෝචිත වර්ෂය තුලදී දක්නට තිබිනි. විගණනයේ විෂය පථය මෙන්ම විගණන කමිටුවට අදාල වගකීම් පහත සඳහන් පිරිදි 2015 වසරතුලදී ස්ථාපිත කරන ලදී.

- වාර්ෂික විගණන සැලසුම් සමලෝචනය කර ස්ථාපනය කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ ඇගයීමට ලක් කිරීම.
- පිරිවැය පිරික්සුම්භාවය සහ නිෂ්කාරණ වියදම් අවම කර ගැනීමේ ද්විත්ව අරමුණු සඳහා වරින් වර සමලෝචනය කිරීමේ අරමුණින් විශේෂිත වූ ඒකකයක් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල ලිපි සහ අනෙකුත් ලිපිවලට අදාළව බාහිර විගණන සහ විගණකාධිපති නිරීක්ෂණවලට අදාළව නිරන්තර පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- අණපනත්, රෙගුලාසි සහ චක්‍රලේඛ විධි විධානයන්ට අනුකූලතාව දැක්වීම සහතික කර ගැනීමේ අරමුණින් ක්‍රමවත් පරීක්ෂාවකට ලක් කිරීම.

# සමායතනික පාලනය

- අදාළ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇද්ද යන්න සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තා පරීක්ෂා කිරීම
- දෝෂයන් හා ඊට ගත් පිලියම් ක්‍රියාමාර්ගයන් සඳහා අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා මෙන්ම කළමනාකරණ ලිපි නිරීක්ෂණය
- කමිටු නිර්දේශයන් / උපදේශයන් ක්‍රියාත්මක වී ඇත්දැයි නිරීක්ෂණය

විගණන කමිටුව 2015 වර්ෂය තුළ තුන් අවස්ථාවක් රැස් වී ඇත. මෙම විමර්ෂණ ගත වර්ෂය තුළ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරේ. සියළු දෝෂ හඳුනා ගැනීමට සහ අවධානය යොමු කිරීමට නිරන්තරයෙන් රැස්වීම් පවත්වමින් අභ්‍යන්තර විගණන වාර්තා මාසිකව පිළියෙල කරනු ලබයි. හඳුනාගත් දුර්වලතා මැඩ පැවැත්වීමට සහ කාර්යක්ෂමතාවය හා සඵලදායීතාව වැඩිදියුණු කිරීමට හඳුනාගත් අවදානම් ද පාදක කර ගනිමින් කුමන ආකාරයේ පාලන ක්‍රම හා ක්‍රියා පිළිවෙත් අනුග මනය කළ යුතු ද යන්න තීරණය කර ඇත. අමතර වැඩ පිළිවෙලක් ලෙස අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් රක්ෂණ සමාගම් කීපයක් වෙත ගොස් ජා.ර.භා. අරමුදලෙහි දක්වා ඇති නීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු සිදු වන්නේ ද යන්න පරීක්ෂා කිරීමට උත්සාහ කොට ඇත.

| විගණන කමිටු සාමාජිකයින් | සහභාගීවීම (පැමිණීම) |
|---|---|
| ඩී.ආර්. දේශප්‍රිය මහතා (සභාපති) | 3 |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා | 3 |
| අසේන්ද්‍ර සිරිවර්ධන මහතා | 3 |

### බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව බාහිර විගණක වශයෙන් විගණකාධිපතිවරයා පත් කර ඇති අතර රාජ්‍ය සංස්ථා, කිසියම් ලිඛිත නීතියක් යටතේ රජයට අයිතිය හිමි වූ ව්‍යාපාර හෝ වෙනත් භාරගත් කටයුතුවලට අදාළ ගිණුම් විගණනය කිරීම සිදු කෙරේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) වගන්තිය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31ක දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය වාර්තාවන්හි වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් සිදුකරනු ලබයි.

### ආයෝජන කමිටුව

ආයෝජන කමිටුවේ වගකීම් ප්‍රධාන අංශ දෙකකට වර්ග කර ඇති අතර ඒවා නම්, වඩා ස්ථිර ආයෝජන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සහ ජා.ර.භා. අරමුදලේ මාර්ගෝපදේශයන්ට හා ආයෝජන ප්‍රතිපත්ති නිර්ණායකයන්ට අනුකූලව එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කරමින් උපරිම ප්‍රතිලාභ උපයා ගැනීමයි. සමාලෝචිත වර්ෂය ජා.ර.භා. අරමුදලේ ආයෝජන කළඹ කළමනාකරණය, වත්කම් වෙන් කිරීම් හා වත්කම් වගකීම් ගැලපීම් කළමනාකරණය පිළිබඳ සියුම්ව සොයා බලා ආයෝජනයට අවස්ථා සොයා ගත්තකි. මෙම සමාලෝචිත වර්ෂය තුළ එක් ආයෝජන කමිටු රැස්වීමක් පවත්වා ඇත.

| ආයෝජන කමිටු සාමාජිකයින් | සහභාගීවීම (පැමිණීම) |
|---|---|
| ට්‍රෙවින් ප්‍රනාන්දු පුල්ලේ මහතා (සභාපති) | 1 |
| අසේන්ද්‍ර සිරිවර්ධන මහතා | 1 |
| ජේ.ඩී. ඩයස් මහතා | 1 |

### ක්‍රියාකාරී කමිටුව

වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී වන්දි අරමුදලේ ක්‍රියාකාරී කමිටුව විසින් වර්ජන, කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අවදානම්වලට අදාළව හිමිකම් ගෙවීම් සම්බන්ධව සාකච්ඡා පවත්වා තීරණයන්ට එළැඹේ. සාමාන්‍ය රක්ෂණ සමාගම් හි ජ්‍යෙෂ්ඨ රක්ෂණ නිලධාරීන්ගෙන් සැදුම්ලත් මෙම ක්‍රියාකාරී කමිටුව මාසිකව රැස්වී හිමිකම් ගෙවීම් සම්බන්ධ තීරණ ගන්නා අතර එම තීරණ වැ.ව.කැ.කෝ.සි.අ.ර සහ ත්‍ර. අරමුදලේ තාක්ෂණික උපදේශක කමිටුවක් වෙත යවනු ලබයි.

### තාක්ෂණික උපදේශ කමිටුව

සාමාන්‍ය රක්ෂණ සමාගම් හි ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් වැ.ව.කැ.කෝ.සි.අ. සහ ත්‍ර. අරමුදලේ තාක්ෂණික උපදේශක කමිටුව විසින් සමස්ථයක් ලෙස උපායා මාර්ගික ක්‍රමෝපායයන් තීරණය කිරීම සිදු කර ඇත. එසේ සමස්ථයක් ලෙස තා.උ.ක. විසින් ගන්නා තීරණ ජා.ර.භා. අරමුදල් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

### මානව සම්පත් පාලනය

මෙම ගතික කර්මාන්තය තුළ, අපගේ සේවක මණ්ඩලයේ හැකියාව, කාර්ය සාධනය හා කැපවීම අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව ලෙස හැඳින අවබෝධ කොට ගෙන ඇත. ඔවුන්ගේ වෘත්තීමය විශේෂඥතාව හා නව්‍යතා වැළඳ ගැනීමේ කැමැත්ත අපගේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට රුකුලක් වනවා සේම ඉහළම තත්ත්වයට පත්වීම සඳහා උපායමාර්ගික මානව සම්පත් සැලසුමක අවශ්‍යතාව අපහට අවබෝධ වී ඇත. එසේ පුහුණු කිරීම සහ පුද්ගල සංවර්ධනය හා කාර්ය සාධනයන් දියුණු කිරීම සඳහා ආකර්ෂණීය අවස්ථාවන් ඇති කිරීමත් ඒ තුළින් විශේෂඥතාවයන් අඛණ්ඩව පවත්වා ගැනීමත් අරමුණු කෙරේ. මානව සම්පත් අංශය සතුව මේ සඳහා විශාල හැකියාවක් සහිත සංවර්ධන වැඩසටහන් පවතින අතර අදාළ අංශයන් පිළිබඳ මනා පුහුණුවක් ලබාදීමට අභ්‍යන්තර හා බාහිර පුද්ගල සම්පත් දායකත්වයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. කාර්යාල ආශ්‍රිත මෙරට මෙන්ම පිටරට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සේවක මණ්ඩලයේ සෑම මට්ටමක් සඳහාම අදාළ තාක්ෂණික දැනුම හා නිපුණතාවය ලබාදීමට කටයුතු කර ඇත. අපගේ පහළ කළමනාකරුවන් වෙනුවෙන් කළමනාකාරීත්වය සංවර්ධන වැඩසටහන් ලබා දෙමින් ඔවුන්ගේ රැකියා ජීවිතය තුළ වර්ධනයක් හා කාර්යඵලයක් ලැබීමට අවස්ථාවන් උදා කර දී ඇත. අපගේ ව්‍යාපාර දැක්ම හා උපාය මාර්ගික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා ජා.ර.භා අරමුදල විසින් වඩා ශක්තිමත් නායකත්වයක් ඉදිරියට ගෙන යාම උදෙසා මානව සම්පත් සාර්ථකව සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඉඩ ප්‍රස්ථා අරමුණු කර ගනිමින් සේවක මණ්ඩලයේ සෑම මට්ටමක් සඳහාම තම දුක්

# සමායතනික පාලනය

ගැනවිලි ඇත්නම් රහස්‍ය ලෙස ඉදිරිපත් කිරීමට අවකාශය ලබාදී ඇති අතරම ඒ සම්බන්ධයෙන් මණ්ඩලයේ අනුමැතීන් ලබා ගැනිමේ ක්‍රම වේදයක් ද සකසා ඇත.

සේවක සමානාත්මතාවයේ අවශ්‍යතාව විශ්වාස කරන අප සේවක බඳවා ගැනිමක දී ජන වර්ගය, සංස්කෘතිය, ස්ත්‍රී පුරුෂභාවය හෝ කුලය අනුව කිසිදු ආකාරයේ වෙනස්කමකට ලක් කරනු නොලබයි. සියළුම සේවකයන්ට වැඩ පරිසරය තුළ සේවා උසස් කිරීම්, ප්‍රතිලාභ පුහුණු හා වන්දි ලබාදීම් ඇතුළුව සමාන අවස්ථා ලබාදී ඇත. සියළුම සේවකයන් හා ඔවුන්ගේ පවුල් පුළුල් රක්ෂණ ප්‍රතිපත්තියකින් ආවරණය වී ඇතිතාක් මෙන්ම සුභ සාධක සමිතිය විසින් සුහද හමු සහ වැඩපරිසරයෙන් බාහිර කටයුතු වර්ෂය තුළ සංවිධානය කර ඇත.

අපගේ ප්‍රධාන සමායතනික අගයන් වන්නේ ව්‍යාපාරය තුළ මානව සම්පත් මූලිකාංග පිළිබඳ අවධානය යොමු කිරීමයි. මේ හේතුවෙන් අනුකූලත්වය හා ස්ථිරසාර බව යන රාමුව තුළ සේවකයන් ඉහළ කාර්ය සාධනයක් සඳහා උත්සාහ ගන්නේ ද යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය සාධන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මකව ඇත.

### තොරතුරු තාක්ෂණය පාලනය

ව්‍යාපාර පරමාර්ථ හා ඒකතුවන වර්තමානයේ භාවිත කරනු ලබන තාක්ෂණය හා සම්බන්ධ ගැටළු නිරාකරණය මෙමගින් සිදු වේ. ජා.ර.භා. අරමුදල සතුව පවත්නා පුළුල් ජාල පද්ධතියක් මගින් ප්‍රධාන ඒකකයන් වන රක්ෂණය, ප්‍රතිරක්ෂණය, මූල්‍ය, කළමනාකරණ ගණකාධිකරණය, ප්‍රසම්පාදනය, මානව සම්පත් භාණ්ඩාගාර හා ආයෝජන ආවරණය කෙරේ. ජා.ර.භා. අරමුදල හා සම්බන්ධ සියළු කාර්යයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ස්වයංක්‍රීය හා දිවයින පුරා ජාලගත පද්ධතියක් පවතින අතරම එම භාවිතා කරන්නාගේ මුහුණත හා පාලනයන් ව්‍යාපාර අවධානම් අවම කරමින් ආරක්ෂිතව සැලසුම් කොට තිබීම මෙන්ම පාර්භෝගිකයාට කාර්යක්ෂම හා සඵලදායී සේවයක් වේගය වැඩි දියුණු කිරීම තුලින් ලබාදීම, සිදුවේදැයි තහවුරු කර ගැනීමට ජා.ර.භා.අරමුදල් කළමනාකාරීත්වය විශාල පරිශ්‍රමයක් දරයි.

### සමාප්තිය

ජා.ර.භා. අරමුදලේ විශ්ලේෂිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනයේ සඵලදායී ක්‍රියාකාරීත්වය වත්කම් සඳහා ප්‍රමාණවත් ආරක්ෂණය, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ බාහිර විගණකවරුන්ගේ සඵලදායීතාව, ගිණුම්කරණ ප්‍රතිපත්ති නිසි පරිදි යොදා ගැනීම තුළින් මූල්‍ය ප්‍රකාශනවල සත්‍යතාව සාක්ෂාත් කිරීම, වැඩ පරිසරය තුළ අනුකූලගත රාමුව, තොරතුරු තාක්ෂණික පාලනයන් මෙන්ම අනුකූලගත නොවන අවස්ථාවන් නිවැරදි කිරීම හා වැළැක්වීමේ ක්‍රියා මාර්ග පිළිබඳ විගණන කමිටුව තෘප්තිමත් වේ.

# ජා.ර.භා. අරමුදල් මණ්ඩලයේ සාමාජිකයින් - 2015



1 මංජුල ද සිල්වා මහතා

2 ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා

3 චන්දන කුමාරසිංහ මහතා

4 අසේන්ද්‍ර සිරිවර්ධන මහතා

5 ඩී. පී. විමලසේන මහතා

# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තොරතුරු

1. **මංජුල ද සිල්වා මහතා (සභාපති)**

මංජුල ද සිල්වා මහතා 2015.04.06 දින මෙහි සභාපති වශයෙන් පත් කෙරිණි. මෙසේ සභාපති ලෙස ජා.ර.භා.අ. පත් වීමට ප්‍රථම එච්. එන්. බී. ඇෂුවරන්ස් සමාගමෙහි කළමණාකාර අධ්‍යක්ෂකවරයා විය.

මංජුල ද සිල්වා මහතා ආර්ථික විද්‍යාව හා සම්බන්ධව බීඒ ගෞරව ප්‍රථම උපාධියක් කොළඹ විශ්වවිද්‍යාලයෙන්ද පශ්චාත් උපාධිය එක්සත් රාජධානියේ ලන්ඩන් බිස්නස් ස්කූල් හිදී ද ලබා ඇත. ඔහු එෆ්.සී.එම්.ඒ. (බ්‍රිතාන්‍ය) සහ සී.ජී.එම්.ඒ. ලබා ඇත.

ඔහු මෑතකදී රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යංශයේ උපදේශකවරයකු ලෙසද පත්කර ඇත. 2015ට පෙර ඔහු එච්.එන්.බී. ඇසුවරන්ස් සමාගමේ හි වසර 09 ක් පුරා කළමණාකාර අධ්‍යක්ෂ ලෙස ද, තවත් වසර 02 ක් එහි ප්‍රධාන විධායක නිලධාරී ලෙසද කටයුතු කර ඇත. ඔහු ඊගල් එන්.ඩී.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමෙහි (වර්තමානයේ එන්.ඩී.බී. වෙල්ත් මැනේජ්මන්ට්) හි සාමාන්‍යාධිකාරී ලෙස ද, ඊගල් ඉන්ෂුවරන්ස් (වර්තමානයේ ඒ.අයි.ඒ. ඉන්ෂුවරන්ස්) හි ආයතනික ව්‍යාපාර හා මානව සම්පත් සාමාන්‍යාධිකාරී ලෙසද, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂමෙහි අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්ද සේවය කර ඇත.

ඔහු සී.අයි.එම්.ඒ. (වරලත් කළමණාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය) හි 2016 ශ්‍රී ලංකා කමිටු සභාපති ලෙස කටයුතු කර ඇති අතර, පසුව එහි ප්‍රාදේශීය මණ්ඩලයෙහි මෙසානා ප්‍රාදේශීය ඒකකයෙහි 2017 ජුනි 30 දක්වා සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩලයේ කමිටු සාමාජිකයකු ද, රක්ෂණය පිළිබඳ හැසැරවීම් කමිටු සභාපති ද විය.

2. **ඒ. ආර්. දේශප්‍රිය මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

ඒ. ආර්. දේශප්‍රිය මහතා 2015.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්කර ඇත. 2015 වසරේ දී ඔහු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කර ඇත.

3. **ඩබ්. එම්. එම්. බී. එච්. ගුණරත්න මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

ඩබ්. එම්. එම්. බී. එච්. ගුණරත්න මහතා 2015.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරඇත. 2015 වසරේදී ඔහු මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කර ඇත.

4. **ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා (මාණ්ඩලික සාමාජික)**

ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා 2015.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර ඇත. ඔහු එච්.එස්.බී.සී. බැංකුව වෙතින් විශ්‍රාම ගන්නා අවස්ථාව වන විට එහි නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී විය. තවද, ඔහු වර්තමානයේ ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලිසින් ඇන්ඩ් ෆිනෑන්ස් හි (ඩුබායි හි පිහිටා ඇති කන්ග්ලොමේරේට් අල් ෆුටායිම් සමූහයේ සාමාජික) සභාපති ලෙස ද, ජෝසප් ෆ්‍රේසර් අනුස්මරණ රෝහල නිවසෙහි සභාපති ලෙසද, යූනියන් බැංකුවෙයි හි විධායක නොවන අධ්‍යක්ෂ ලෙසද ඩච් ලංකා ට්‍රේලර් මැනිෆැක්චරින් ලිමිටඩ් හි විධායක නොවන අධ්‍යක්ෂ ලෙසද (ඉන්දියාවේ ටාටා සමූහයේ සාමාජික) සේවය කරයි.

5. **අසේන්ද්‍ර සිරිවර්ධන මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

අසේන්ද්‍ර සිරිවර්ධන මහතා 2015.04.02 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර ඇත. ඔහු වර්තමානයේ නීතීඥයකු ලෙස කටයුතු කරයි.

6. **ඒ.ජේ.ඩී. ඩයස් මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

ඒ.ඒ.ඩී.ඩයස් මහතා 2015.05.08 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර ඇත. 2015 දී සෞඛ්‍ය හා දේශීය ඖෂධ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු ලෙස සේවය කර ඇත.

7. **ජේ. ඒ. කේ. එන්. ජයතුංග මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

ජේ. ඒ. කේ. එන්. ජයතුංග මහතා 2015.05.06 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර ඇත. 2015 දී රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු ලෙස සේවය කර ඇත.

8. **ඩී. පී. විමලසේන මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**


ඩී. පී. විමලසේන මහතා 2015.12.14 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර ඇත. 2015 දී ඔහු මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කර ඇත.

9. **චන්ද්‍රන කුමාරසිංහ මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

චන්ද්‍රන කුමාරසිංහ මහතා 2015.02.14 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කර ඇත. 2015 වසරේදී රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කර ඇත.

# සමායතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම






1. සනත් සී ද සිල්වා මහතා - ප්‍රධාන විධායක නිලධාරී
2. අනුර සමරකෝන් මහතා - අග්‍රභාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
3. ආර්.එස්. ගුණසේකර මහතා - පර්යේෂණ හා විශ්ලේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
4. ටී.ජී. ලක්ෂ්මන් මහතා - මෝටර් රථ හිමිකම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
5. ධම්මිකා වීරකෝන් මිය - මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
6. එම්.එන්.කේ. පාඬිගමගේ මහතා - හම්බන්තොට ශාඛාවේ ප්‍රධානී (වැ.බ.)
7. නිමේෂා සහබන්ධු මිය - ක්ෂුද්‍ර රක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
8. එස්.ආර්.ජී. උදාරි ප්‍රියභාෂිනී මිය - නීති දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
9. නිමාලි පෙරේරා මිය - ශාඛා පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
10. උපේක්ෂා ඒකකනායක මිය - මෝටර් රථ ප්‍රාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
11. ගයාත්‍රි සොයිසා මිය - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
12. ගයනි සියඹලාගොඩ මිය - විධායක ලේකම්
13. නාමල් කාංචන මහතා - ආයෝජන අංශයේ ප්‍රධානී
14. කවීන්ද්‍ර ජයසිංහ මහතා - තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
15. සිතාර අසංක ජයලත් මහතා - මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
16. දේශානි නානායක්කාර මිය - ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී
17. ෂාමල් සුමුදු සේනාරත්න මහතා - අනුරාධපුර ශාඛාවේ ප්‍රධානී
18. රන්දිමා ඩී.එම්. මානගේ මෙනවිය - සාමාන්‍ය හිමිකම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානී

# අවදානම් කළමනාකරණය

ජා.ර.භා. අරමුදලේ ව්‍යාපාර උපාය මාර්ගයේ කේන්ද්‍රය වන්නේ එය අවදානම් කළමනාකරණය කර ගන්නේ කෙසේ ද යන්නයි. අවිනිශ්චිතතාවයේ මූලිකාංග මතින් අවදානම් සැකසුන ද, එය ව්‍යාපාරයට අගයන් එකතු කිරීමට සමත් අවස්ථාවන් උදා කිරීමට ද දායක වේ. ජා.ර.භා. අරමුදල එහෙයින් ව්‍යාපාර ක්‍රියාවලියට බලපාන අවදානම් අනාගතයේ වර්ධනයට හෝ සෘණාත්මක ලෙස අරමුණු කෙරෙහි බලපෑම් කළ හැකි වත්කම්, මූල්‍ය තත්ත්වය හා ලාභදායීත්වය හෝ ව්‍යාපාරයට අගයක් එක් කළ හැකි එවැනි සාධක හඳුනා ගෙන ඇත. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටිය, ස්වාධීන ව්‍යාපාර ඒකක සමඟ සම්බන්ධ වීමට සමත් වන අතර එමගින් ඉලක්ක කර ඇත්තේ ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම් පෙර සූදානමකින් හඳුනා ගෙන අනාගත සංවර්ධන අවස්ථා හඳුනා ගැනීමයි.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආයතනයේ සෑම මට්ටමක් කෙරේ අදාළ වන අතර එහි අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. මෙම මට්ටමේ දී උපාය මාර්ගික අවදානම් ව්‍යාපාර සැලසුම් බවට පරිවර්ථනය කරමින් ඔවුන් කෙසේ මෙහෙයවීම හා අධීක්ෂණය සිදු කරන්නේ ද යන්න දැක්වේ. අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ සොයා බැලීම ආයතනයක විගණන කමිටුවට අදාළ වේ. ප්‍රධාන අවදානම් ප්‍රතිපත්ති, අවදානම් වගකීම් දරන්නන් හා අවදානම් ඉවසීම සඳහා පසුව සොයා බලා හඳුනාගෙන අනුමත කිරීම සිදු කරයි. යටිතල පහසුකම් ඇගයීම්, පුද්ගල හැකියාවන්, තාක්‍ෂණය හා සන්නිවේදන මාර්ග සොයා ගැනීමෙන් අවදානම් හා සම්බන්ධව අදාළ නිවැරදි තොරතුරු ලබා ගැනීම සාක්‍ෂාත් කර ගැනීම කෙරේ විගණන කමිටුවේ සහභාගීත්වය විකාශනය කිරීම අවශ්‍ය වේ. ස්වාධීන විගණනකරු විසින් පිළිගත හැකි අවදානම් රාමුවක් තුළ ඵලදායී ක්‍රියාවලියක් තුළින් අවදානම් සම්බන්ධ කටයුතු සිදු වන බවට නිවැරදිව සොයා බැලීම සිදු කරයි.

ජාතික රක්‍ෂණ භාර අරමුදල ව්‍යාපාරික අවදානම් කළමනාකරණ ආකෘතිය පිළිගෙන ක්‍රියාත්මක කළ අතර එමගින් ආයතනය මුහුණ දෙන සමස්ථ අවදානම් සියල්ලටම වඩා සාර්ථකව මුහුණ දී අවදානම් කළමනාකරණයේ ඉහළ ප්‍රතිඵල අත් කර ගැනීමට හැකි වනු ඇත. සාර්ථක අවදානම් කළමනාකරණයක් යනු හොඳින් දැනුවත් වූ විගණනයක් හා සම්බන්ධිත සියලු පාර්ශ්වයන්ගේ අගය වැඩි කිරීමට කැප වූ අධ්‍යක්ෂ මණ්ඩලයක ක්‍රියාකාරීත්වය නියෝජනය කරයි.

උපාය මාර්ගික අවදානම් කළමනාකරණ අරමුණු කරා ළඟාවීමේ අරමුණින් හා තහවුරු කර ගැනීම උදෙසා ජාතික රක්‍ෂණ භාර අරමුදලෙහි කළමනාකාරීත්වය දේශපාලනික, තාක්‍ෂනික, සමාජීය හා සංස්කෘතික, ආර්ථික පරිසරයෙහි වෙනස්කම් පිළිබඳව සමීප අධීක්‍ෂණයක් කරනු ලබයි. එසේම මෙහි දී තම තරගකරුවන්ගේ සහ ගණුදෙනු කරුවන්ගේ නිරන්තර වෙනෙස්වන තත්ත්වයන් ද සැලකිල්ලට ගනු ලබයි.

අවදානම් වර්ගීකරණය තෙවැදෑරුම් වේ. ආයතනය තුලින් හට ගන්නා වළක්වා ගත හැකි අවදානම් මනාව කළමනාකරණය කර ගත හැකිය. මෙය කළමනාකරණය නීති රෙගුලාසීන්ට අනුකූලතාව දැක්වීම තුළින් ළඟා කර ගත හැකි වේ. ඒ අතරම උපාය මාර්ගික හා බාහිර අවදානම් කළමනාකරණයට වෙනස් වූ පිවිසුමක් අවශ්‍ය අතර එමගින් සිදු විය හැකි අවදානම් සහ පිරිවැය කාර්යක්‍ෂමව පාලනය කර ගත හැකි වේ.

## වළක්වා ගත හැකි අවදානම්

### ආර්01 කීර්තිනාමය පිළිබඳ අවදානම

ජා.ර.භා. අරමුදල මගින් විශේෂ වශයෙන් එහි නාමය පිළිබඳව අවදානය යොමු කරන අතරම ඒ පිළිබඳව සම්බන්ධිත සියලු පාර්ශ්වයන්, ගණුදෙනු කරුවන් හා මහජන අදහස් පිළිබඳව වඩා සැලකිලිමත් වෙයි. දැඩි පාලනයක් සහ අනුකූලතාව දැක්වීමේ යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම තුලින් ප්‍රතිපත්තීන් හා පිළිවෙත් නිසියාකාරව අනුගමනය කරන බව තහවුරු කර ගනියි. සියලුම් උත්සාහයන් හා මෙහෙයවීම් තුළින් ධනාත්මක වැඩ පරිසරයක් හා වඩා යහපත් සාමූහික වටිනාකම් ඇති කිරීමට හා ක්‍රියාත්මක කිරීම අරමුණු කරයි.

### ආර්02 වංචා අවදානම

ජා.ර.භා. අරමුදල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් හා ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දී ඇත. ජා.ර.භා. අරමුදලට ඵලදායී අභ්‍යන්තර විගණන අංශයක් පවතින අතර එමගින් ආයතනය තුළ වංචනික කටයුතු සිදුවීම අවම කර ගැනීම සඳහා මනා අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක වෙයි. ක්‍රමානුකූලව සැලසුම් කළ මෙහෙයුම් ක්‍රියාවලියක් සහ පිළිවෙත් තුළින් සහ නිරවුල් සංනිවේදන මාර්ග සහතික කරීම මගින් කල් ඇතිව අවදානම් හඳුනා ගැනීමට ද හැකියාව ඇත.

## උපාය මාර්ගික සහ මෙහෙයුම් අවදානම

### ආර්03 ප්‍රාරක්ෂණ අවදානම

ජා.ර.භ. අරමුදල තුලනාත්මකව ව්‍යාපාරික පරිසරයට නිරාවරණය වීම තුළින් පිළිගත හැකි මට්ටමක අවදානමක් පවතින බව තහවුරු කර ගනියි. එය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අයදුම්පත් අනුමත කිරීමේ ක්‍රියාවලියක්, විවෘත වීමේ සීමාවන් සහ ආවරණය සීමාවන් හඳුන්වා දී ඇත. ඊට අමතරව අඛණ්ඩ අධීක්ෂණයක් සහ ඇගයීමකට ලක් කිරීමක් ක්‍රියාත්මක වේ. ඒ තුළින් අලාභයක් හඳුනා ගැනිම සහ රඳවා ගැනීම් ද හඳුනා ගනියි. ජා.ර.භා. අරමුදල විධිමත් ආකාරයෙන් ප්‍රාරක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන අතර අභ්‍යන්තර විගණනය සියලුම මාර්ගෝපදේශයන්ට අනුකූලතාව තහවුරු කර ගනියි. කාර්ය මණ්ඩලය සඳහා අභ්‍යන්තර පුහුණුව ලබාදීම තුළින් ප්‍රමාණවත් දැනුමකින් හා අත්දැකීම්වලින් යුත් කණ්ඩායමක් බවට පත් කිරීමෙන් මේ පිළිබඳ ඇති අවදානම අවම කර ගත හැකිය.

### ආර්04 ප්‍රතිරක්ෂණ අවදානම

සලකා බලන මූල්‍ය වර්ෂය තුළ දී ජා.ර.භා. අරමුදල විශේෂිත වූ දෙවන ප්‍රතිරක්ෂණ ආවරණයක් සාධාරණ පිරිවැයකට ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර එමගින් 2016 වර්ෂයේ ප්‍රතිරක්ෂණ කළඹ ඉහළ මූල්‍ය හා ගෝලීය නිපුනතාවයන් ඇති ආයතන සමග ප්‍රතිරක්ෂණය මගින් මෙම අවදානම තවදුරටත් අවම කර ගැනීමට කටයුතු කර ඇත.

### ආර්05 සංචිත ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවදානම

වගකීම් ගෙවීමට සිදුවූ විට ඒ සඳහා සංචිත අරමුදලෙහි ඇති ප්‍රමාණාත්මක බව තහවුරු කරගැනීම සඳහා ජා.ර.භා. අරමුදල එය අඛන්ඩව සමාලෝචනය කරයි.

# අවදානම් කළමනාකරණය

**ආර්06 ණය අවදානම**

ජා.ර.භා. අරමුදල, අඛණ්ඩව අධීක්ෂණය කිරීම තුළින් ආයතන සහ පුද්ගලයින්ගේ ණය ගෙවීමේ හැකියාව සහ මූල්‍ය ස්ථායිතාවය තහවුරු කර ගනු ලබයි. ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ඒවායෙහි ප්‍රමාණය, ව්‍යාපාරික වර්ගය අනුව සැලසුම් කර ගොඩනගා ඇත. කාර්ය මණ්ඩලයට මඟපෙන්වීම සඳහා ණය ප්‍රතිපත්තියක් හඳුන්වාදී ඇත. ජා.ර.භා. අරමුදල ගෙවීම් සහ වාරික අය කර ගැනීම් සඳහා සෘජු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් ඒවා නොගෙවා සිටි විටදී දැඩි ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කර ඇත.

**ආර්07 ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම හෝ ගිවිසුම්ගත බැඳීම් නිරවුල් කිරීමට නොහැකිවීම හානි පූර්ණ ගෙවීම්, ප්‍රති රක්ෂණ ගෙවීම්, භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම පිළිබඳ ඇති අවදානම, ආයෝජන විවිධාංගීකරණය සහ විවිධ වූ කල්පිරීම් සහිතව කෙටිකාලීන ආයෝජන මගින් මෙය අවම කර ගනියි. විවිධ වූ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සහ ණයකර මගින් මෙම තත්ත්වය ඇති කර ගනියි.

ජා.ර.භා. අරමුදල සිය අරමුදල් සියල්ල රජයේ සුරැකුම්වල සහ සැලකිය යුතු ප්‍රමාණයක් කෙටිකාලීන ආයෝජන සහ ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම්වල රඳවා ගනියි. සුරැකුම්වල කල් පිරීම් විශ්ලේෂණය මගින් වගකීම් සහ ද්‍රවශීලව මුදල් පැවතීම යන අන්ත දෙක අතර විශාල නොගැලපීමක් නොමැති බවට තහවුරු කර ගත හැකිය.

**ආර්08 තොරතුරු ආරක්ෂණ පද්ධති අවදානම**

ජා.ර.භා. අරමුදල් පද්ධති කඩා වැටීම නිසා සිදු විය හැකි අලාභයන් ඇති නොවන බවට හෝ කිසියම් සයිබර් ප්‍රහාරයක් නිසා ඇති වන හානි අවම කර ගැනීමට කටයුතු කරයි. එය අඛණ්ඩව එහි තොරතුරු තාක්ෂණ දියුණුවට සහ ඒ සම්බන්ධ යටිතල පහසුකම් වැඩි දියුණුවට ආයෝජනය කරයි. එසේම තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති තුළින් ගුණාත්මක ආරක්ෂාවක් ද අභ්‍යන්තර කාර්ය මණ්ඩලයම නිරන්තර පුහුණුව හා නිවැරදි පද්ධති සම්බන්ධිත ක්‍රියාවලි හා පාලනයන් හඳුන්වාදීම තුළින් තොරතුරුවල රහස්‍යභාවය සහ ස්වාධීනත්වය ආරක්ෂා කරයි.

**ආර්09 ව්‍යාපාර අඛණ්ඩභාවය පිළිබඳ අවදානම**

මණ්ඩලයේ කෙටිකාලීන හා දිගුකාලීන ව්‍යාපාරික පැවැත්ම මෙහි දී තහවුරු කර ගනියි. ජා.ර.භා. අරමුදල සතුව ආපතිකතා සැලැස්මක් ඇති අතර ඊට ආයතනික ආපදා ප්‍රකෘතිමත් කිරීමේ හා ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීමේ සැලසුම ද එහි කාර්ය මණ්ඩලයට සහ සම්පත් වලට අදාළව පවතියි. මෙම සැලසුම් මගින් දීර්ඝකාලීනව මෙහෙයුම් කඩා වැටීම වළක්වා මනා ක්‍රියාකාරිත්වය තහවුරු කරයි.

**බාහිර අවදානම්**

මෙම අවදානම් වර්ගය වැඩි වශයෙන් ආයතනයේ පාලනයෙන් තොර වුව ද ජා.ර.භා. අරමුදල පෙර ක්‍රියා මාර්ග ගැනීම තුළින් මෙහි ව්‍යාපාරික කටයුතුවලට ඇතිවන බලපෑම තක්සේරු කිරීම මගින් ඊට ඇති අවදානම මඟහරවා ගනී.

**ආර්10 අරමුණුගත අවදානම**

ප්‍රමාණවත් නොවන විවිධාංගීකරණය නොවූ ආයෝජන වත්කම් හා ඒ තුළින් අවදානමට නිරාවරණයවීම මගින් ඇතිවන අලාභයන් වැඩීම මෙයින් අදහස් කරයි. ජා.ර.භා. අරමුදල රජයේ සුරැකුම්වල ආයෝජනය කිරීම කෙරෙහි අවදානය යොමුකරයි. කෙසේ වෙතත් එය කිසිවටික අවදානම් අඩු කිරීමක් නියෝජනය නොකරයි.

**ආර්11 හානි පූර්ණ ගෙවීම් අවදානම**

ඇතිවිය හැකි මතභේද වංචනික කටයුතු, නීතිමය, තාක්ෂණිකහේතු නිසා වන්දි ගෙවීම් පිළිබඳ ගැටලු ඇතිවිය හැකිය. මෙම සාධකයන් පාලනය සඳහා වඩා දැඩි සෘජු රෙගුලාසි හඳුන්වාදීම මගින් ඉදිරිපත් වන අයදුම්පත් අනුමත කිරීම විධිමත් කිරීම සහ අයදුම්පත් සැකසීමේ ක්‍රියාවලිය ක්‍රමිකව රාජකාරී බෙදීමකට ලක් කිරීම සිදු කර ඇත.

**ආර්12 වෙළඳපොළ අවදානම**

ජා.ර.භා. අරමුදල පැහැදිලි ආයෝජන මග පෙන්වීම් සකස් කර ඒවා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇත. මෙම මාර්ගෝපදේශ මගින් කෙසේ ඵලදායී ලෙස ආයෝජන කළමනාකරණය කළ යුතු ද යන්න නිශ්චිතව දක්වා ඇත. කළමනාකරණ වාර්තා ආදිය ආයෝජන කමිටුවට ලබාදීම තුළින් වෙළඳපොළ ඇති අවදානම ප්‍රමාණවත් පරිදි අවම කර ගැනීමට හැකියාව ඇත.

**ආර්13 නියාමන සහ අනුකූලතා අවදානම**

ජා.ර.භා. අරමුදල සියලුම නියාමන වෙනස්කම් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර ඒවායෙහි අඛණ්ඩ සංවර්ධනයන් ආදිය කර්මාන්තයේ ඇති අදාළ වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට සහභාගීවීම තුළින් ලබා ගනියි. ඒ තුලින් අදාළ ව්‍යාපාරික පරිසරයේ පවතින නව ප්‍රවනතාවන්ට අනුකූලවීමත් ප්‍රතිපත්තීන් හා ක්‍රියා පිළිවෙත් කාලීනව සමාලෝචනය ද ඒවා ආයතනයෙහි අභ්‍යන්තර සම්බන්ධිත පාර්ශව අතර හුවමාරු කර ගැනීම සිදු කරයි.

**ආර්14 ව්‍යාපාරික අවදානම**

මෙම ව්‍යාපාරික අවදානම අවම කර ගැනීමට විවිධ වූ උපාය මාර්ගික ව්‍යාපාර ඒකක එනම් වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී හානි රක්ෂණය, මෝටර් රථ රක්ෂණය අග්‍රහාර රක්ෂණය, ස්වාභාවික විපත් රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය යනාදී අංශ තුළ ව්‍යාපාරය පුළුල් කිරීම මගින් අවදානම අඩු කර ගත හැකි වේ.

**ආර්15 විදේශ විනිමය අවදානම**

විදේශ විනිමය ගණුදෙනුවලට අදාළ අවදානම පිටුදැකීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට එළැඹි ඒවායෙහි ප්‍රතිරක්ෂණ වාරික දේශීය මුදලින් ගෙවීම් කිරීම කරනු ලබයි.

**ආර්17 ආයෝජන ණය අවදානම**

ආයෝජන ණය අවදානම අවම කර ගැනීම සඳහා අවදානම් නොමැති ආයෝජන එනම් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආදිය රජයේ බැංකු මාර්ගයෙන් සිදු කිරීම කරනු ලබයි.

**ආර්19 මෙහෙයුම් අවදානම**

මෙහෙයුම් අවදානම වළක්වා ගැනිම මෙහෙයුම් ක්‍රියාකාරකම් පරිගණක ගත කිරීම මගින් සිදු කර ඇත. වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී හානි අරමුදල අංශ විගණනය කරනුයේ ජා.ර.භා. අරමුදලෙහි අභ්‍යන්තර විගණන අංශය මගිනි. එමගින් වාරික අයකර ගැනීම හා හිමිකම් ගෙවීම් වලට අදාළව සිදු වන වැරදි හා වෙනස්කම් අවම කර ගැනීමට හැකි වී ඇත. තව ද සියලුම කාර්යාල මෙහෙයුම් කටයුතු පරිගණක ගත කිරීම තුළින් ගණුදෙනුවල වැරදීම්වලින් තොර සැකසුම් ක්‍රියාවලියක් ඇති කර ඇත.

# ආයතනික සමාජ වගකීම

සියළුම පාර්ශව කරුවන් සඳහා වටිනාකම් ලබා දීමක් නිර්මාණය කිරිමේ මාර්ගයක් ලෙස සමාජ වගකීමකින් යුතු ආයතනයක් වීමේ වැදගත්කම ජාතික රක්‍ෂණ භාර අරමුදල වටහාගෙන ඇත. මෙම කාර්ය සඳහා සියළු මට්ටම්වල ව්‍යාපාර කටයුතු සිදුකරන ප්‍රධාන ආයතනික වටිනාකම් ස්ථාපිත කර ඇති ආචාර ධර්ම පද්ධතියක් පවතී. මෙය එහි සාර්ථකත්වයේ ප්‍රධාන පදනම වෙයි. දැක්ම හා මෙහෙවර අනුව දිවයිනේ සමාජ ආර්ථික දියුණුවට දායකත්වය ලබා දෙමින් සමාජයේ දිළිඳු ජනතාව වෙනුවෙන් සේවය සැලසීම ජා.ර.භා අරමුදලේ ප්‍රමුඛ පරමාර්ථය වෙයි. මේ අනුව ජා.ර.භා අරමුදල එහි පදනම වී ඇති දියුණුව කරා පා නගන ජනතාවට සහන ලබා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අපේක්‍ෂා කරයි. මෙය සිහියේ තබා ගනිමින් ජා.ර.භා අරමුදල එහි නිපැයුම් තවදුරටත් වැඩි දියුණු කරීම සඳහා වෙනත් ආයතන සමග සන්ධානගතවීම සිදුකරයි.

සමාලෝචිත වසර තුලදී ජා.ර.භා අරමුදල අග්‍රහාර යෝජනා ක්‍රමය යටතේ අඩුකල මිලගනන් වලට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් රාජ්‍ය සේවකයින් සදහා ලබා දීමට ප්‍රසිද්ධ රෝහල් ගනනාවක් සමගම අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත. මෙයට අමතරව ජා.ර.භා අරමුදලේ සුභ සාධක සංගමය විසින් මාලින්බොඩ දික් ඇල්ලකන්ද විද්‍යාලයේ ගොඩනැගිල්ලක් අලුත් වැඩියා කිරීමත් ඔවුන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරිමත් සිදුකර ඇත. අපි නිරන්තරයෙන්ම ආධාර උපකාර කිරීම සඳහා සූදානමින් සිටින අතර අපගේ තෙවැදෑරුම් අංගයන් වන මිනිසුන්, ලාභය හා අපගේ ලෝකය පිළිබදව සැලකිය යුතු අවධානයකින් පසුවෙමු.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයින් සත් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මගින් ජා.ර.භා අරමුදල පාලනය වෙයි.

(අ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු

(ආ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී

(ඇ) සෞඛ්‍ය විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු

(ඈ) රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු සහ

(ඉ) මූල්‍ය, බැංකු, රක්ෂණ කළමණාකරණය හෝ නීතිය පිළිබඳ සුදුසුකම් ලද හෝ ඒ පිළිබඳ විශේෂඥ දැනුමැති පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

මණ්ඩලයේ එක් සාමාජිකයකු සභාපතිවරයා ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය හිමි වේ. පනතට අනුව, පත්වීමේ සිට පුරා වසර 05 ක කාලයක් මෙම මණ්ඩලය පැවතිය යුතුය. 2015 වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා ඇති අතර මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහභාගීත්වයද උසස් මට්ටමක පැවතී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විස්තර පහත පරිදි වේ.

| මණ්ඩලයේ සාමාජිකයින් | පැමිණීම | | | | | | | අධ්‍යක්ෂකවරයෙක් ලෙස පත්වීමේ දිනය | ඉවත් වූ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | ඔක් | නොවැ | දෙසැ | | |
| මංජුල ද සිල්වා මහතා | √ | √ | √ | √ | √ | √ | √ | 06/04/2015 | |
| ඒ. ආර්. දේශප්‍රිය මහතා | √ | √ | √ | √ | x | √ | √ | 08/04/2015 | |
| ඩබ්. එම්. එම්. බී. එච්. ගුණරත්න මහතා | √ | √ | √ | √ | √ | අ/නො | අ/නො | 08/04/2015 | 01/10/2015 |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා | √ | √ | x | x | √ | √ | √ | 08/04/2015 | |
| අසේන්ද්‍ර සිරිවර්ධන මහතා | √ | √ | √ | √ | √ | √ | √ | 02/04/2015 | |
| ඩී.ජේ.ඩී. ඩයස් මහතා | අ/නො | අ/නො | √ | √ | √ | √ | √ | 08/05/2015 | |
| ජේ. ඩී. කේ. එන්. ජයතුංග මහතා | අ/නො | අ/නො | අ/නො | √ | √ | අ/නො | අ/නො | 08/05/2015 | 01/10/2015 |
| ඩී. පී. විමලසේන මහතා | අ/නො | අ/නො | අ/නො | අ/නො | අ/නො | අ/නො | √ | 14/12/2015 | |
| චන්දන කුමාරසිංහ මහතා | අ/නො | අ/නො | අ/නො | අ/නො | අ/නො | අ/නො | √ | 14/12/2015 | |

ආයතනය ලඟාවී ඇති භෞතික හා මූල්‍ය ඉලක්ක සහ අනුමත කර ඇති ව්‍යාපාරික සැලැස්මට පදනම්ව සුදුසු පරිදි ව්‍යාපාරය පවත්වාගෙන යෑම තහවුරු කිරීම සඳහා ආයතනයේ පාර්ශව කරුවන්හට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වෙයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික සමාලෝචනය

2015 වර්ෂයේ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රධාන කටයුතු වූයේ රජයේ නිලධාරීන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (අග්‍රහාර), අනිවාර්ය ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමය, පාර්ලිමේන්තු සාමාජිකයින්ට රක්ෂණ යෝජනා ක්‍රමය, මෝටර් රථ වාහන රක්ෂණ ක්‍රමය (රජය සතු මෝටර් රථ සඳහා) ක්‍රියාත්මක කිරීමයි. සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, කෘෂිකාර්මික ණය ආරක්ෂණය, වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී කටයුතු නිසා වන රක්ෂණ අරමුදල කළමනාකරණය ද මීට ඇතුළත් වේ.

### මූල්‍ය ප්‍රතිඵලයන්

2015 වර්ෂය තුළ දී ජාතික රක්ෂණ භාර අරමුදල රු. මිලියන 5,026 ක දළ ලිඛිත වාරික වටිනාකමක් වාර්තා කර ඇත. මෙම දළ ලිඛිත වාරික 2014 හි රු. මිලියන 5,842 ට වඩා සුළු අඩුවීමක් නිරූපනය වන්නේ 2015 ගොවීන්ගේ කෘෂි රක්ෂණ වාරික නැවතීමත් සමගය. 2015 වර්ෂය තුළ දී ජාතික රක්ෂණ භාර අරමුදල බද්දට පසු ලාභය ලෙස රු. මිලියන 4,303ක් උපයා ඇත.

### කාර්ය මණ්ඩලය

2015 වර්ෂය අවසානය වන විට මුළු කාර්ය මණ්ඩලය 186 දෙනෙකි.

### විගණකවරුන්

1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන අනුව මණ්ඩලයේ 2015 මූල්‍ය වාර්තා විගණකාධිපති විසින් විගණනයට ලක් කර ඇත.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

### විගණන කමිටුව

2015 වසර තුළ දී විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය. නම් වශයෙන් සඳහන් කලහොත් ඒ.ආර්. දේශප්‍රිය මහතා (සභාපති) (අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව - 2015) ටී.ආර්. ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ අසේන්ද්‍ර සිරිවර්ධන මහතා ඇතුලත් වේ. කමිටුවේ ආරාධනයෙන් නිරීක්ෂකවරයෙක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් ජාතික රක්‍ෂණ භාර අරමුදල සඳහා පත් කළ විගණන අධිකාරීවරයා ද කමිටු රැස්වීම් සඳහා සහභාගී වී ඇත. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටු රැස්වීම් වාර තුනක් පවත්වා ඇත. කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් විස්තර සමග වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. විගණන කමිටුව වෙත අභ්‍යන්තර විගණන සැලැස්මක් ඉදිරිපත් කර අනුමැතිය ලබා දී ඇත. 2015 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණනය හා වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ විගණන කටයුතු ද ඇතුළු අභ්‍යන්තර විගණන කාර්යයන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් සිදු කර ඇත.

### ආයතනික පාලනය

ආයතනික පාලනය හා යහ පාලන භාවිතයන් සඳහා නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති විශිෂ්ට භාවිතයන් සඳහා වූ ආයතනික පාලන සංග්‍රහයේ දක්වා ඇති අදාළ ක්ෂේත්‍ර සඳහා නිසි අවධානය යොමු කරමින් ආයතනික පාලනය සිදු කර ඇත.



**මංජුල ද සිල්වා**
**සභාපති**



**උදාර් රන්හොටිගමගේ**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

2017 මැයි 23
කොළඹ

# විගණන කමිටු වාර්තාව

2015 වර්ෂය තුළ දී විගණන කමිටුව සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන ඒ.ආර්. දේශප්‍රිය මහතා (අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව) ට්‍රෙවීන් ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ අසේන්ද්‍ර සිරිවර්ධන මහතා යන අය ඇතුළත් විය. ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් නම් කළ විගණන අධිකාරීවරයා ද ආරාධනය පරිදි විගණන කමිටු සඳහා සහභාගී විය.

**විගණනයේ විෂය පථය**

2015 වර්ෂය තුළ දී විගණන කමිටුව මගින් පහත විගණන විෂය පථය පිහිටුවන ලදී,

1. අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනයට ලක් කිරීම.
2. ආයතනයෙහි සියලුම ක්‍රියාකාරකම්වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කිරීම හා සමාලෝචනය කිරීම.
3. වියදම් ඵලදායීව සහ නිෂ්පල වියදම් වැළකීමේ අරමුණින් අඛණ්ඩ කාල පරාසයක් තුළ ක්‍රියාකාරකම් සමලෝචනය.
4. බාහිර විගණක සමඟ සමීපව ක්‍රියා කිරීම සහ විගණකාධිපතිගේ බාහිර විගණක කළමනාකරණ ලිපිවලට අදාළව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
5. අණපනත්, රෙගුලාසීන්, නීති සහ චක්‍රලේඛ ආදියට අනුකූලතාවය දක්වා ඇති බවට තහවුරු කර ගැනීම.
6. ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලතාව තහවුරු කර ගැනිම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
7. අභ්‍යන්තර විගණන / බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි ආදිය සමාලෝචනය කර අවශ්‍ය නිවරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීම.
8. රජයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ නියෝගයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය.

**කමිටුවේ රැස්වීම්**

කමිටුවෙහි සභා වාර පිළිබඳව ප්‍රමාණවත් විස්තර සහිතව අවශ්‍ය තොරතුරු අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා ගත කර ඇති අතර 2015 වසර තුළදී විගණන කමිටුව තෙවරක් රැස්වී ඇත.

**අභ්‍යන්තර විගණන**

ජාතික රක්ෂණ භාර අරමුදලේ අභ්‍යන්තර විගණන අංශයක් පවතියි. අභ්‍යන්තර විගණන සැලසැස්ම ඉදිරිපත් කර විගණන කමිටුව අනුමත කර අඛණ්ඩව සමාලෝචනය සහ අභ්‍යන්තර විගණන සහ නිරීක්ෂණ ක්‍රියාකාරකම් මෙහෙයවීම.

**බාහිර විගණන**

බාහිර විගණකගේ කළමනාකරණ ලිපි සමාලෝචනය සහ පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන සුදුසු ක්‍රියාකාමාර්ග ගැනීම සඳහා කළමනාකාරීත්වය මෙහෙයවීම.

**ඒ.ආර්. දේශප්‍රිය**
**සභාපති**

**විගණන කමිටුව**

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } විආර්ථ/සී/එන්අයිටීඑෆ්/එෆ්ඒ/2015 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2017 අප්‍රේල් /8 දින.

සභාපති,

ජාතික රක්ෂණ භාර අරමුදල.

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2016 ඔක්තෝබර් 28 වන දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# ස්වාධීන විගණකගේ වාර්තාව

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

----------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුව අස්ථිත්වයක් විසින් ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් නොකල යුතු බව දක්වා තිබුණද වර්ෂ කිහිපයක සිට පැවත එන හඳුනාගත නොහැකි වූ ලැබිය යුතු එකතු කළ අගය මත (වැට්) බදු - මෝටර් හා ගෙවිය යුතු වැට් බදු - මෝටර් ශේෂයන් එකිනෙකට හිලව් කිරීමෙන් අනතුරුව තවදුරටත් ඉතිරි වූ රු.8,452,926 ක ශේෂය ගෙවිය යුතු වැට් බදු - මෝටර් ගිණුමට බැර කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දුන් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන හඳුනාගත නොහැකි වී තිබී ගිණුම් 04 ක එකතුව වූ රු. 1,860,990 ක් හා එකතුව රු. 3,385,401 ක් වූ තවත් ගිණුම් 09 ක ශේෂයන් කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අවිනිශ්චිත ගිණුමකට මාරු කර තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමකින් තොරව අවසන් මූල්‍ය ප්‍රකාශන මගින් අවිනිශ්චිත ගිණුමෙන් නැවත පෙර ගිණුම්වලට ගලපා තිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව



(ආ) අරමුදලේ අංශ අතර ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස සඳහන්ව තිබූ ගිණුම් 04 ක ශුද්ධ ශේෂය වූ රු. 4,668,866 ක් හඳුනා ගැනීමකින් හා නිරවුල් කිරීමකින් තොරව අවසන් මූල්‍ය ප්‍රකාශනවල රඳවාගත් ඉපයුම්වලට ගලපා තිබුණි.

(ඇ) අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල යන ත්‍රස්තවාදී අරමුදල් (SRCC & TR) අංශයෙන් 2014 වර්ෂයේදී අරමුදලට ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.2,489,103 ක්වූ සේවක ණය ශේෂය, සමාලෝචිත වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ලෙස ලැබිය යුතු වාරික ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 03 යටතේ ණයකර සඳහා පොලී ආදායමෙන් 2010 සිට 2014 දක්වා වර්ෂවලට අදාල එකතුව රු.46,121,820 ක් වූ රඳවාගත් බදු විධිමත් අනුමැතියකින් තොරව 2015 වර්ෂයට අදාළ සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල ආදායම් බදුවලින් අඩු කර දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 15 යටතේ අනෙකුත් මූල්‍ය වගකීම්වල ඇතුලත් කර තිබූ රජයේ නිළධාරීන්ට ලබාදුන් මෝටර් සයිකල් රක්ෂණය සඳහා වාරික අත්තිකාරම් ලෙස ලද එකතුව වූ රු. 71,632,037 කින් රු. 29,328,516 ක් අරමුදලේ ආදායමක් ලෙස හඳුනා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු වාරික ආදායම | 1,043,806,532 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ආ) | අනෙකුත් මූල්‍ය වත්කම් | 32,307,438 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඇ) | අනෙකුත් මූල්‍ය වගකීම් | 193,756,079 | |
| (ඈ) | ලැබිය යුතු ඉන්වොයිස් හා ගෙවිය යුතු බැරපත් අවලංගු කිරීම | 92,421,039 | අනුමැතිය |

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 10 දිනැති අංක DFD/Circular/2014/03 දරන මුදල් හා ක්‍රමසම්පාදන චක්‍රලේඛය මගින් 2014 මහ කන්නයේ සිට වගා රක්ෂණය ක්‍රියාත්මක කිරීම, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පවරා තිබුණි. එහෙත් මහ කන්නයේදී ගොවීන්ගෙන් අය කරන ලද වාරික මුදල් ගොවිජන මධ්‍යස්ථාන මගින් අරමුදලේ ගිණුමට බැර කර තිබු අතර 2015 දෙසැම්බර් 31 දිනට එසේ බැර කර තිබු වාරික මුදල්වලින් රු.42,520,846 ක් ඇස්තමේන්තු කර එම මුදල කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත නිරවුල් කළ යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි. ඉන් විගණිත දිනය වු 2016 ජුනි 30 දින දක්වාත් නිරවුල් කර තිබුණේ රු.4,425,709 ක් පමණි. මේ අනුව, මෙම රක්ෂණ ක්‍රමය දැනට අරමුදල සතු නොවුවද, අදාල වාරික මුදල් අරමුදල වෙත ලැබීම හා ඒ මගින් හිමිකම් ගෙවීම අදාල ආයතනය වෙත නොපවරා තවදුරටත් ඒ සම්බන්ධව කටයුතු කිරීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ආ) රක්ෂණ සමාගම් විසින් වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සඳහා ගෙවනු ලබන වාරික මුදල් විවිධ හේතුන් මත ආපසු ඉල්ලා සිටින බවත් අරමුදල මෙම ඉල්ලීම් සලකා බැලීම සඳහා කමිටුවක් (Working Committee) වෙත ඉදිරිපත් කරනු ලබන බවත් විගණනයේදි අනාවරණය වු අතර කමිටුව විසින් එසේ ආපසු ගෙවීම සඳහා අනුමැතිය ලබා දුන් රු.14,482,746 ක් විගණිත දිනය දක්වාත් නිරවුල් කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදලට අදාල හිමිකම් ගෙවීම් පරිපාටියේ 3 අදියරේ (VII) වගන්තිය අනුව, මෝටර් රථ හිමිකම සැලකීමෙන්, මෝටර් XL විධිවිධානය අනුව එක් හිමිකමක් සඳහා අතිරේක හිමිකම් ප්‍රතිපූර්ණය වාර්ෂිකව රු.මිලියන 10 ක් වන අතර, එම රු.මි.10 ඉක්මවා, තාක්ෂණික උපදේශනාත්මක කමිටුවේ අනුමැතිය ද ලැබී ඇති නමුත් අදාල ආයතන විසින් ලිපිලේඛණ ඉදිරිපත් නොකිරීම මත නිරවුල් නොකළ රු.36,376,284 ක හිමිකම් මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. මෙම වටිනාකම් වලින් රු.24,966,409 ක් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක ශේෂ වලින් සමන්විත විය.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඇ) ප්‍රතිරක්ෂණ අංශයේ ලැබිය යුතු වාරික ආදායම තුළ ඇතුලත් රක්ෂණ සමාගම් 08 කින් හා 05 කින් ලැබිය යුතු නමුත් වර්ෂ තුන ඉක්ම වූ පිළිවෙලින් රු. 75,752,260 ක් වටිනා හර හා රු. 48,092,753 ක් වටිනා බැර ශේෂ නිරවුල් කිරීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

### !.4 පැහැදිලි නොකළ වෙනස්කම්

2015 දෙසැම්බර් 31 දිනට සේවක ආපදා ණය ගිණුම හා උපලේඛන අතර රු. 1,442,422 ක වෙනස්කම් විය.

### !.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සදහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 49 වන වගන්තිය | සෑම රක්ෂණකරුවෙකු විසින්ම රක්ෂණකරුගේ ව්‍යාපාරයට අදාල වාර්තාවේ සහතික පිටපතක් හා තත් කාර්යය සඳහා සාදනු ලබන යම් තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික වාර වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත සපයනු ලැබිය යුතු වුවද, අරමුදල විසින් 2015 වර්ෂයේදී එම වාර්තා හෝ අනුකූලතා සහතික (Compliance Certification) මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

# ස්වාධීන විගණකගේ වාර්තාව



| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මුදල් රෙගුලාසි 135 | රාජ්‍ය ආයතනයකින් ගෙවීම් සිදුකිරීම සඳහා බලය පැවරීමට අදාලව සීමා පනවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාල අධිකාරී බල සීමා අනුමත කල යුතු වූ අතර එය වර්ෂයයක් පාසා අළුත් කල යුතු වුවද අරමුදල විසින් දැනට භාවිතා කරනු ලබනුයේ 2012 මාර්තු 14 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 77-04 මගින් අනුමත කරනු ලැබූ අධිකාරී බල සීමාවන් බව නිරීක්ෂණය විය. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 පරිච්ඡේදය | අනුමැතිය සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර තිබූ අරමුදලේ පරිපාලන අත්පොත සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලෙස 2015 වර්ෂයේදී මණ්ඩලය වෙත දන්වා ඇතත් ඒ සඳහා 2016 ජූනි දක්වාම ප්‍රතිචාර දක්වා නොතිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිවාස දුරකථන, ජංගම දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමේදී මිළට ගැනීමට සිදුවන උපකරණ හා උපාංග සඳහා දැරීමට සිදුවන පිරිවැය අදාල නිලධාරියා විසින් දැරිය යුතු බව සඳහන් කර තිබුණ ද 2015 වර්ෂය තුළ රු. 562,609 ක් වටිනා ජංගම දුරකථන 18 ක් සඳහා අරමුදලේ මුදල් වැය කර තිබුණි. මේ සඳහා අවශ්‍ය පිරිවිතර තීරණය කොට මිළ ගණන් කැඳවීම් කිරීම වෙනුවට එක් එක් නිලධාරියා විසින් කරන ලද ඉල්ලීම් අනුව ජංගම දුරකථන මිළට ගෙන ඇති බවත්, එක් එක් තනතුරු සඳහා ලබාදිය යුතු දුරකථනවල මිළ සීමා නිර්ණය කිරීමකින් තොරව මිළට ගැනීම සිදුවී ඇති බවත් නිරීක්ෂණය විය. |

# ස්වාධීන විගණකගේ වාර්තාව



3. මූල්‍ය සමාලෝචනය

---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,303,324,331 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,582,655,586 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.279,331,255 ක පිරිහීමක් විය. ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම් සහ ලියාහැරීම් හා අත්පත් කර ගැනීමේ වියදම් පිළිවෙලින් රු. 853,870,734 කින් හා රු.251,862,336 කින් වැඩිවීම හා දළ වාරික ආදායම රු.84,142,667 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ පසුබෑම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා බදු පසු ලාභය ක්‍රමයෙන් වැඩිවී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එය පසුබෑමකට ලක් වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සැලකීමේදී අරමුදලේ දායකත්වය 2013 වර්ෂයේදී සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම් කළද සමාලෝචිත වර්ෂයේදී එය පසුබෑමකට ලක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

---------------

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 12(අ) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණු අනුව මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, අනපේක්ෂිත සෞඛ්‍ය අවදානම, පෞද්ගලික හදිසි අනතුරු හා දේපල හානි සම්බන්ධයෙන්-

(i) රාජ්‍ය නිලධාරයන්, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්, පළාත් පාලන සේවයේ නිලධරයන් සහ රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හා පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ලැබ අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් හෝ පළාත් පාලන සේවයෙන් දැනට විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන් සඳහා,

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ii) 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘධි අධිකාරිය පනතට අනුකූලව සමෘධි ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පවුල් සඳහා,

(iii) ගොවීන්, ධිවරයින් සහ ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් සඳහා,

(iv) මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කල හඳුනාගනු ලැබිය හැකි අවශ්‍යතාවයන් ඇති තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම් සඳහා, ප්‍රතිලාභ සහ ආරක්ෂණ සැපයීමය.

ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව, අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු තුල, සමාජයේ වඩා වැඩි අවදානම්වලට මුහුණ පාන්නා වූ සමෘද්ධි සහනලාභීන් සඳහා ආණ්ඩුව විසින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රම සහ රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ඇතුලත්ව තිබුණද සමෘද්ධි සහනලාභීන් සඳහා රක්ෂණ වැඩපිළිවෙලක් සකස් කරමින් සිටින බව පසුගිය වර්ෂයේදී විගණනයට දන්වා තිබුණද මෙතෙක් එය ක්‍රියාත්මක තත්වයේ නොවිය.

(ආ) රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂණය සඳහා අනිවාර්යය සියයට 30 වෙන් කිරීමට අදාලව අරමුදල විසින් මාර්ගෝපදේශයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද එම සංග්‍රහය 2016 සැප්තැම්බර් මාසය වන විටත් ක්‍රියාත්මක තත්වයට පත්කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාරිභෝගික හිතකාමී වන්දි ගෙවීමේ ක්‍රියාවලිය හරහා ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවීම් පිළිබඳව රක්ෂණ සමාගම්වලට අරමුදලේ වෙබ් අඩවි මගින් පරීක්ෂා කිරීම සඳහා අවස්ථාව ලබාදී තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ඊට අදාල නව කෙටුම්පත් මාර්ගෝපදේශයේ ඇතුළත් පරිදි රක්ෂණ සමාගම් කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබුවහොත්, රු.මිලියන 50 හා එය ඉක්මවන හිමිකම්පෑම සඳහා පමණක් ලියවිලි ඉදිරිපත් කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දී ඇතත් මාර්ගෝපදේශය 2015 වර්ෂයේ අනුමත නොවීම මත එය විගණිත දිනය වූ 2016 ඔක්තෝබර් 08 දින දක්වාම ක්‍රියාත්මක වී නොතිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) 2015 වර්ෂයේදී කාර්යක්ෂම හා ඵලදායී ආදායම් එකතු කිරීමේ යාන්ත්‍රණයක් සකස්කිරීමට අපේක්ෂා කර තිබුණද ඊට අදාල කෙටුම්පත් මාර්ගෝපදේශය අනුමත නොවීම මත එය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඉ) ප්‍රතිරක්ෂණ, වාරික ආදායම් හා හිමිකම් ගෙවීම් ස්වයංක්‍රීයකරණය සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කර තිබුණද එම කාර්යය අවසන් කිරීමට අපොහොසත්වීම නිසා විගණිත දිනය වූ 2016 සැප්තැම්බර් 19 වන විටත් ප්‍රතිරක්ෂණ අංශයේ මාසික වාර්තා ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) අග්‍රහාර රක්ෂණ ක්‍රමය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට වැඩි ප්‍රතිලාභ හිමි කරදීමේ අරමුණින් ආරම්භ කර තිබූ අග්‍රහාර රක්ෂණ ක්‍රමය හඳුන්වා දී වසර 10 කටත් වඩා වැඩි කාලයක් ගත වී ඇතත් ජාතික රක්ෂණ භාර අරමුදල සතුව එක් එක් සාමාජිකයාගේ විස්තර (මාසික දායක මුදල් අයවීම ද ඇතුළුව ) ඇතුළත් දත්ත පද්ධතියක් (Data base ) පවත්වා නොතිබුණි.

(ii) අදාල රාජ්‍ය ආයතනය විසින් එවන ලද මාසික මුළු ප්‍රතිලාභ වටිනාකම පමණක් පදනම් කරගෙන සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවනු ලබන බව නිරීක්ෂණය වූ අතර සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු 06 ක නිලධාරීන් 38 දෙනෙකු අතුරින් 21 දෙනෙකු ඉලෙක්ට්‍රොනික් කාඩ්පත් ප්‍රතිලාභියෙකු ලෙස හෝ ලියාපදිංචි සාමාජිකත්වයක් ලබා නොමැති බව අරමුදලේ පරිගණක තොරතුරු මගින් අනාවරණය විය.

(iii) රජයේ නිලධාරියකු ස්ථාන මාරු ලැබ වෙනත් දෙපාර්තමේන්තුවකට / ආයතනයකට මාරු වී ගිය පසු අරමුදල ඒ බව දැනුවත් නොවීමත් එම තත්වය සනාථ කර ගැනීමට අදාල වාර්තා හෝ ස්ථාන මාරු වීම් පිළිබඳ නිවේදන ලබා ගන්නා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමටත් අරමුදල විගණන දිනය වූ 2016 දෙසැම්බර් 31 දින දක්වා අපොහොසත් වී තිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(iv) 2016 මැයි සිට ජූනි දක්වා කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික විගණන සමාගමක් විසින් සිදු කර තිබූ පද්ධති විගණනයකට අනුව, සාමාජිකයන්ගේ දායකත්වය ලැබී තිබුණු බවට තහවුරු කිරීමේ ක්‍රමවේදයක් නොවීම මත අග්‍රහාර දායකත්වය ලබා නොමැති සාමාජිකයන්ටද ප්‍රතිලාභ ගෙවීමේ අවධානමක් ඇති බවත්, ලියාපදිංචි හා ඇතුළත් කරනු ලබන දත්තවල විශ්වාසනීයත්වය අඩු මට්ටමක පවතින බවත්, ප්‍රතික්ෂේප කළ හිමිකම් නැවත අනුමැතියකින් තොරව ගෙවීමට යොමු කළ හැකි බවත් හා සාමාජිකයින්ගේ දත්ත යාවත්කාලීන නොවන බවත් වාර්තා කර තිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා අරමුදල අතර ඇති කර ගත් ගිවිසුමකට අනුව, 2008 ජූනි 01 දින සිට ක්‍රියාත්මක කර තිබූ විදේශ රැකියාවල නියුක්ත වුවන් සඳහා වූ රක්ෂණ ක්‍රමය 2012 අප්‍රේල් 28 දින සිට අවසන් වී තිබුණි. මෙම රක්ෂණ ක්‍රමය සඳහා 2012 අප්‍රේල් 28 දිනෙන් පසු වාරික ආදායම් නොලැබුණු නමුත් ඉහත දිනට පෙර ඇති කරගත් රක්ෂණ ගිවිසුම්, වසර 02 කට හෝ 03 කට අදාල වීම හේතුවෙන් එදිනෙන් පසුවද අරමුදලට හිමිකම් ගෙවීම් කිරීමට සිදු වී තිබුණි. ඒ සඳහා ලද වාරික මුදල් වලින් නොඉපයූ වාරික ආදායම් වෙන් කිරීමක් වාර්ෂිකව සිදුකර නොතිබුණු අතර ලද සියළුම මුදල් ලැබූ වර්ෂ වලදීම ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂය තුලදී රු. 4,526,669 ක හිමිකම් සඳහා ගෙවීම් කර තිබූ අතර ඒ තුල වූ රු.1,640,118 ක් වූ හිමිකම් ගෙවීම්වලට අදාල ලිපිගොනු හෝ වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදල විසින් හිමිකම් ගෙවීමක් සිදුකිරීමේදී කමිටුවක් වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ/ අනුමැතිය මත ගෙවීම් කරමින් පැවතියත් අංක We/2/2/1/VR/01310/2012 හා අංක VR/04046/2013 යටතේ එකතුව රු. 599,998 ක හිමිකම් ගෙවීම සඳහා කමිටුවේ අනුමැතිය ලැබී නොතිබූ නමුත් අරමුදලේ විධායක නිලධාරීගේ අනුමැතිය මත පමණක් ගෙවීම් කර තිබුණි.

(ආ) අංක VR/04968/2013 දරන හිමිකම් ඉල්ලීම සඳහා රු. 100,000 බැගින් එකතුව රු. 200,000 ක් දෙදෙනෙකු වෙත ගෙවූ බවට ගිණුමෙහි සඳහන්ව ඇති නමුත් ලිපිගොනුව තුල ඊට අදාල වවුචරයක වටිනාකම සඳහන්ව නොතිබියදී සහතික කිරීමේ හා අනුමත කිරීමේ නිලධාරීන් විසින් වවුචරය අත්සන් කර තිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 4.3 ප්‍රසම්පාදන කළමනාකරණය

අරමුදල 2015 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, ඊට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි.

## 4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පෞද්ගලික බැංකුවක පවත්නා ඉතිරිකිරීම් බැංකු ගිණුමක රු.1,268,482 ක හර ශේෂයක් වසර ගණනාවක සිට අක්‍රියව පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ 2015 වර්ෂයට අදාල අනුමත නිලධාරීන් සංඛ්‍යාව 197 ක් වූ අතර තථ්‍ය නිලධාරීන් සංඛ්‍යාව 186 ක් වූයෙන් පුරප්පාඩු 11 ක් විය.

(ආ) කළමනාකරණ සහකාරවරු 11 දෙනෙකු හා කාර්යාල කාර්ය සහායකවරු 04 දෙනෙකු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණු අතර ඒ සඳහා 2016 සැප්තැම්බර් 19 වන තෙක්ම අනුමැතිය ලැබී නොතිබුණි. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව, කළමනාකරණ සහකාර තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් 03 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඇ) 2015 ජනවාරි 01 දින සිට අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි තනතුරට නිලධාරියෙකු බඳවා ගෙන තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට අනුව, එම තනතුර සඳහා හිමි වැටුප් පරිමාවේ, උපරිම වැටුප් පියවරෙහි පිහිටුවීමට 2014 නොවැම්බර් 05 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. පසුව එම පියවරේ සිට ඉදිරියට වැටුප් වර්ධක ලබාදීමක් සිදුකර තිබුණු අතර මේ සඳහා ලබාගත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවිය.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඉ) 2015 වර්ෂයේදී අභ්‍යන්තර මාරු කිරීම් සලකා බැලීම සඳහා සාමාජිකයින් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පිහිටුවා ඇති අතර එම කමිටුව මාස තුනකට වරක් රැස් වී තීරණ ගනු ලබන බව දක්වා තිබුණද, 2016 මැයි මාසයේ ඉල්ලීම් 3 ක් සඳහා තීරණ ලබා දී තිබුණු නමුත් ඉල්ලීම් 20 ක් සඳහා විගණිත දිනය වූ සැප්තැම්බර් 26 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. අභ්‍යන්තර මාරු කිරීම් තුළින් ආයතනය ඵලදායීතාවය හා රැකියා තෘප්තිය ඇති කිරීම ආයතනයේ අරමුණ බව සඳහන් කර තිබුණද, ඒ සඳහා අනුමත ක්‍රමවේදයක් අනුගමනය කළ බවක් විගණනයට නිරීක්ෂණය නොවීය.

(ඊ) 2015 වර්ෂයේදී අරමුදල විසින් පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා උපමාන (Criteria) අනුමත කරගෙන තිබුණු අතර ඒ මඟින් වෘත්තීය හා තාක්ෂණික හැකියාවෙන් පිරිපුන් සේවක කාර්ය මණ්ඩලයක් ඇති කිරීම හා බඳවාගත් නවක සේවක මණ්ඩලයට පුහුණු වැඩසටහන් පැවැත්වීමත් අරමුණු කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද බාහිර පුහුණු හා සංවර්ධන වැඩසටහන් 20න් වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබුණේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා තෘතීයික මට්ටමේ නිලධාරීන් සඳහා වන අතර ද්විතීයික මට්ටමේ නිලධාරීන් 144 න් 35 දෙනෙකුට පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීමට අවස්ථා 06 ක් ලැබී තිබුණි. ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් හා නවක සේවක මණ්ඩලයට අරමුදල විසින් කිසිදු පුහුණුවීම් වැඩසටහනක් ලබා දී නොතිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 07 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 4435 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**5.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය**

පෞද්ගලික විගණන සමාගමක් විසින් 2016 මැයි සිට ජුනි දක්වා කාලපරිච්ඡේදය තුල රු.1,150,000ක වෘත්තීය ගාස්තු ගිවිසුමකට අනුව අරමුදලේ පද්ධති විගණනයක් සිදුකර තිබුණු අතර එහිදී අනාවරණය වූ පරිදි අග්‍රහාර අංශයේ රක්ෂණ පද්ධතියට දත්ත ඇතුලත් කිරීම, ඇතුලත් කර ඇති තොරතුරු යාවත්කාලීන කිරීම හා පද්ධතියේ ආරක්ෂාකාරී බව සම්බන්ධව විශ්වාසනීයත්වය පහත් මට්ටමක පැවතුණු බව වාර්තා කර තිබුණි. එසේම, මුදල් අංශය විසින් භාවිතා කරනු ලබන පද්ධතියද නව සටහන් සඳහා අනුමැතියත් ලබා නොදීම, ජර්නල් සටහන් තුලනයකින් තොරව තනි සටහනක් ලෙස ඇතුලත් කළ හැකි වීම හා අනුමැතියකින් තොරව චෙක් පත් මුද්‍රණය හා නැවත මුද්‍රණය කල හැකි වීම යනාදී අඩුපාඩු පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) රක්ෂණ, වාරික ආදායම් තොරතුරු තාක්ෂණ අංශය විසින් පද්ධතියට ඇතුලත් කර මූල්‍ය අංශයට ලබා දීම. |
| | (ii) නව ලෙජර් ගිණුම් ඇති කිරීම සඳහා පද්ධතිය අනුමැතිය ලබා නොදීම. |
| | ) චෙක්පත් අනුමැතියකින් තොරව මුද්‍රණයට/ නැවත මුද්‍රණයට අවස්ථා ඇති වීම. |
| | (iv) හිමිකම් ගෙවීමේදී සීමා ඉක්මවා ගෙවීම් සිදුකිරීම. |

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

| | | |
|---|---|---|
| (ආ) | අග්‍රහාර රක්ෂණ ක්‍රමය | (i) පුද්ගල ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකයක් යටතේ පුද්ගලයින් දෙදෙනෙකු ලියාපදිංචි වී සිටීම.<br>(ii) සාමාජිකයින්ගේ විස්තර යාවත්කාලීන නොවීම හා අදාළ හිමිකම් ගෙවීමේදී පද්ධතියට ඇතුලත් කරන දත්ත සඳහා අනුමැතිය ලබා නොදීම. |
| (ඇ) | මානව සම්පත් කලමනාකරණය | අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදු නොකිරීම හා සම්මුඛ පරීක්ෂණවලදී ලබා දෙන ලකුණු විධිමත් නොවීම |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති .

# විස්තීර්ණ ආදයම් ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වසර

| | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික | 1 | 5,062,685,701 | 5,842,067,431 |
| අග්‍රභාර සඳහා ලද දායක මුදල් | 1 | 1,636,567,419 | 1,494,899,976 |
| රැස්කල වගා රක්ෂණ බදු | | 1,259,134,207 | 1,184,647,255 |
| **ශුද්ධ ලිඛිත වාරික** | | **7,958,387,326** | **8,521,614,663** |
| නොඉපයූ වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස | | **(26,901,647)** | **(505,986,318)** |
| ශුද්ධ වාරික ඉපයුම් | | **7,931,485,679** | **8,015,628,346** |
| **වෙනත් මෙහෙයුම් වලින් ලද ආදායම්** | | | |
| ගාස්තු සහ කොමිස් අදායම් | 2 | 6,596,760 | 1,405,900 |
| ආයෝජන සහ අනෙකුත් ආදායම් | 3 | 849,786,808 | 638,509,884 |
| **අනෙකුත් ආදායම්** | | **856,383,568** | **639,915,784** |
| දළ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම් | 4 | (3,227,140,119) | (2,373,269,385) |
| ප්‍රතිරක්ෂකයින් වෙත යැවූ හිමිකම් | 4 | - | - |
| ගිවිසුම් ගත වගකීම් හි දළවෙනස | 4 | 1,562,913 | (831,930,326) |
| ප්‍රතිරක්ෂණ ගිවිසුම් ගත වගකීම් හි වෙනස | 4 | - | |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | | **(3,225,577,206)** | **(3,205,199,711)** |
| ප්‍රාරක්ෂණ සහ අත්පත්කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණ ඇතුළුව) | 5 | (946,632,594) | (694,770,258) |
| අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | 6 | (225,512,915) | (172,918,575) |
| **මුළු ප්‍රතිලාභ, හිමිකම් හා අනෙකුත් වියදම්** | | **(4,397,722,716)** | **(4,072,888,544)** |
| **බදු පෙර ලාභය / (අලාභය)** | | **4,390,146,531** | **4,582,655,586** |
| ආදායම් බදු වියදම | | (86,822,200) | - |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | | **4,303,324,331** | **4,582,655,586** |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස | | (261,686,342) | 155,191,084 |
| **වසර සඳහා අනෙකුත් විස්තීරණ වියදම්, බදු පසු** | | (261,686,342) | 155,191,084 |
| **මුළු විස්තීරණ ආදායම** | | **4,041,637,990** | **4,737,846,670** |

# මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 7 | - | 0 |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 34,125,797 | 26,251,881 |
| මූල්‍ය වත්කම් | 9 | 10,388,972,726 | 9,105,573,879 |
| ලැබිය යුතු වාරික | 10 | 1,060,898,025 | 1,144,259,034 |
| මෘදු ණය | 11 | 129,244,611 | 188,220,907 |
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම් | 12 | 32,307,438 | 84,351,380 |
| විලම්භිත කොමිස් | 13 | 421,132,953 | 366,621,700 |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් | 14 | 166,785,332 | 278,096,913 |
| **මුළු වත්කම්** | | **12,233,466,883** | **11,193,375,695** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| රඳවා ගත් ඉපයුම් | | 8,743,809,636 | 7,550,219,714 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනෙකුත් අංග | | (88,871,109) | 172,815,232 |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | | **8,654,938,527** | **7,723,034,946** |
| වගකීම් | | | |
| රක්ෂණ ගිවිසුමේ වගකීම් | | 3,257,914,116 | 3,240,259,344 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | | 17,031,242 | 11,364,304 |
| අනෙකුත් වගකීම් | 15 | 303,582,998 | 197,413,174 |
| බැංකු අයිරා | 14 | - | 21,303,927 |
| **මුළු වගකීම්** | | **3,578,528,356** | **3,470,340,750** |
| **ස්කන්ධ ප්‍රග්ධනය හා වගකීම්** | | **12,233,466,883** | **11,193,375,695** |

අරමුදලේ මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමි.

.....................................

මූල්‍ය කළමණාකරු

පිටු අංක 5 සිට 33 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය අංගයන් වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයෙ වෙනුවෙන් අත්සන් තබා ඇත.

..................................... .....................................

අධ්‍යක්ෂ අධ්‍යක්ෂ

2016 දෙසැම්බර් 19

කොළඹ

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | රඳවා ගත් ඉපයුම් රු. | විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් රු. | මුළු ස්කන්ධය රු. |
|---|---|---|---|
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,949,244,214** | **17,624,148** | **6,966,868,362** |
| වසර සඳහා ලාභය | 4,582,655,586 | - | 4,582,655,586 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | - | 155,191,084 | 155,191,084 |
| මෝටර් වාහන සමුච්චිත ක්ෂය ගැලපුම් | 14,558,589 | - | 14,558,589 |
| ලාභ කොමිස් නැවත ලිවීම හා නැවත අයකර ගැනීම - RI Dept. | 12,287,375 | | 12,287,375 |
| වැ.කැකෝ.සි.අ.ත්‍ර.ක්‍රි. ගෙවියයුතු හා ප්‍රතිරක්ෂණ වාරික නිවැරදි කිරීම් | (10,268,621) | | (10,268,621) |
| 2013 ට අදාල ක්ෂය | (511,780) | | (511,780) |
| ආපසු ලද පත්‍රිකා නිවැරදි කිරීම් | 2,055,047 | | 2,055,047 |
| සේ.භා.අ. සහ මුද්දර බදු නිවැරදි කිරීම | 199,305 | | 199,305 |
| ඒකාබද්ධ අරමුදලට මාරුකල මුදල් | (4,000,000,000) | - | (4,000,000,000) |
| **2014 දෙසැම්බර්31 දිනට ශේෂය** | **7,550,219,714** | **172,815,232** | **7,723,034,946** |
| වසර සඳහා ලාභය | 4,303,324,331 | - | 4,303,324,331 |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | | (261,686,342) | (261,686,342) |
| ඇපකර වට්ටම් ක්‍රමක්ෂය | 50,321,582 | | 50,321,582 |
| කපා හරින ලද ප්‍රතිරක්ෂණ ලදුපත් හා ණයපත් | (92,421,039) | | (92,421,039) |
| වාර්ෂික ගාස්තු හා සෙස් | (24,370,817) | | (24,370,817) |
| නොගෙවූ ප්‍රතිරක්ෂණ නිවැරදි කිරීම | (60,170,679) | | (60,170,679) |
| මෝටර් වාහන නොවන වාරික ලියා හැරීම | (1,995,673) | | (1,995,673) |
| ක්ෂය නිවැරදි කිරීම් | (583,958) | | (583,958) |
| මෝටර් වාහන වාරික නිවැරදි කිරීම | 4,668,666 | | 4,668,666 |
| වාරික නැවත ලබාදීමේ ගැලපුම් | 2,574,100 | | 2,574,100 |
| දේ.පි.උ. සමුච්චිත ක්ෂය ගැලපුම් | 11,643,799 | | 11,643,799 |
| වියදම් හා වෙනත් පියවීම් | 599,610 | | 599,610 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල මුදල් | (3,000,000,000) | | (3,000,000,000) |
| | **8,743,809,636** | **(88,871,109)** | **8,654,938,527** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| | | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වූ මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | 4,390,146,531 | 4,582,655,586 |
| **ගැලපුම්** | | | |
| පොලී ආදායම් | | (801,608,493) | (624,075,269) |
| ක්ෂය වීම් | | 6,579,710 | 8,552,653 |
| සාධාරණ වටිනාකම් ශුද්ධ වෙනස | | (261,686,342) | 155,191,084 |
| පෙර වසරේ ගැලපුම් | | (109,734,409) | 4,273,105 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ අලාභ | | 1,096,675 | - |
| | | **3,224,793,673** | **4,126,597,159** |
| මෙහෙයුම් වත්කම් වෙනස්වීම | අ | 80,893,698 | (493,262,120) |
| මෙහෙයුම් වගකීම් වෙනස්වීම | ආ | 123,824,595 | 1,518,581,307 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | 3,429,511,967 | 5,151,916,346 |
| ගෙවූ පාරිතෝෂික | | 5,666,938 | 3,564,830 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් | | 3,435,178,905 | 5,155,481,176 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ අත්කරගැනීම් | | (1,283,398,847) | (2,261,335,760) |
| ලද පොලිය | | 703,726,452 | 624,075,269 |
| මෘදු ණය අයකර ගැනීම් | | 58,976,296 | 434,539,307 |
| දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීම් | | 15,500 | - |
| දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | | (4,505,960) | (1,462,818) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් භාවිතා කෙරුණ ශුද්ධ මුදල් | | (525,186,559) | (1,204,184,002) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල මුදල් | | (3,000,000,000) | (4,000,000,000) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිත ශුද්ධ මුදල | | (3,000,000,000) | (4,000,000,000) |
| **මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | ඇ | (90,007,654) | (48,702,826) |
| වර්ෂය ආරම්භයේ ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 256,792,986 | 305,495,812 |
| වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 166,785,332 | 256,792,986 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්**

| | | 2015 | 2014 |
|---|---|---|---|
| අ. මෙහෙයුම් වත්කම් හි වෙනස | | | |
| විලම්භිත කොමිස් මුදල් වල වැඩිවීම/(අඩුවීම) | | (54,511,252) | (167,448,531) |
| ලැබිය යුතු වාරිකවල වැඩිවීම/(අඩුවීම) | | 83,361,009 | (319,531,410) |
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම් වල වැඩිවීම/(අඩුවීම) | | 52,043,941 | (6,282,179) |
| | | 80,893,698 | (493,262,120) |
| ආ. මෙහෙයුම් වගකීම් වෙනස | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් වැඩිවීම/(අඩුවීම) | | 17,654,772 | 1,344,542,715 |
| අනෙකුත් වගකීම් වැඩිවීම/(අඩුවීම) | | 106,169,823 | 174,038,592 |
| | | 123,824,595 | 1,518,581,307 |
| **ඇ. මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම/(අඩුවීම)** | | | |
| වසර අවසානයේ ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 166,785,332 | 256,792,986 |
| අඩුකලා : වසර ආරම්භයේ ශුද්ධ මුදල් හා මුදල් සමාන දෑ | | 256,792,986 | 305,495,812 |
| මුදල් හා මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (90,007,654) | (48,702,826) |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

## 1.0 සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තා කරනු ලබන ආයතනය

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය (මණ්ඩලය) 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර ඇත. මෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ අංක 97, මරදාන පාර, කොළඹ 10 වන අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද එම ලිපිනයෙහිම පිහිටා ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය ලබාදීම

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2016.12.21 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් බලය ලබා දී ඇත.

### 1.3 වර්තමාන ආයතනය සහ මූලාරම්භක ආයතනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මව් සහ මූලාරම්භක ආයතනය වනුයේ ශ්‍රී ලංකා රජයයි.

### 1.4 මූල්‍ය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වරූපය

මෙම මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වනුයේ සාමාන්‍ය රක්ෂණ කටයුතු සහ ප්‍රතිරක්ෂණ කටයුතු ඉටු කිරීම වේ. සලකා බලනු ලබන කාලය තුළ මෙම ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැත.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා වන වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.

### 1.6 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

විශේෂිත වශයෙන් දක්වා ඇති අවස්ථාවන්හි දී හැර සෑම විටම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සකස් කර ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ.

- මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පැහැදිලි කෙරෙන තොරතුරු ඇතුළත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයක්
- සලකා බලනු ලබන කාලයට අදාළව මණ්ඩලයෙහි මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු නිරූපනය කරන ලාභ හෝ අලාභ සහ වෙනත් මෙහෙයුම් ආදායම් ඇතුළත් ප්‍රකාශනයන්
- කොටස්කරුවන්ගේ හිමිකාරිත්වයෙහි වෙනස්කම් නිරූපනය වන පරිදි හිමිකාරිත්වය වෙනස්වීමේ ප්‍රකාශනයක්
- මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය මගින් අනෙකුත් පාර්ශවයන් වෙත මණ්ඩලයට මුදල් සහ මුදල් හා සමාන දෑ උත්පාදනය කිරීමට ඇති හැකියාව නිරූපනය වන පරිදි සකස් කරන ලද තොරතුරු ඉදිරිපත් කර ඇත.
- මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් යටතට ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ වෙනත් මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු ඇතුළත් පැහැදිලි කිරීම් ද ඇතුළත් වේ.

### 1.7 සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 186කි (2014-177)

## 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### ගිණුම්කරන ප්‍රතිපත්ති වල වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ආයතනය මගින් වෙනත් ලෙස හෙළිදරව් කිරීම් කර නොමැති අවස්ථාවල දී පහතින් දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමකින් තොරව අඛණ්ඩව යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

### 2.1 පිළියෙල කිරීමේ පදනම

### 2.11 අගය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කර ඇති අතර විකිණීමට ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම පදනම්ව අගය කිරීම හැරුණු විට අනෙකුත් වත්කම් ඓතිහාසික පිරිවැය පදනම්ව අගය කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ ප්‍රමිති අංක 4 මගින් අවසර දී ඇති පරිදි එම ප්‍රමිතිය පිළිගැනීමට පෙර පැවති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව රක්ෂණ ගිවිසුම් සඳහා වන ගිණුම් ප්‍රමිති පිළිපදිමින් මණ්ඩලය මගින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

මණ්ඩලය මගින් වඩා පුළුල් ලෙස ද්‍රවශීලතාව පදනම්ව මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා උද්ධමනය මගින් ඇති කරන බලපෑම සඳහා ගැලපීම් සිදු කර නොමැත.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙක හිලව් කිරීම් කර ඇති අතර මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශන තුළ ශුද්ධ වටිනාකම පමණක් නිරූපනය කරයි. නෛතිකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බවට තොරතුරු ඇති විටෙක දී හැර වටිනාකම් හඳුනා ගෙන හිලව් කිරීමට අවස්ථාව ඇති විටෙක පමණක් මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීම් කර ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

### 2.12 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ විණිමය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සියලුම මූල්‍ය තොරතුරු වෙනස් ලෙසකට දක්වා නොමැති විට දී ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්න රුපියලට ගණනය කර ඉදිරිපත් කර ඇත.

### 2.13 ප්‍රමාණාත්මකභාවය හා එකතු වටිනාකම

සෑම කුඩා අයිතමයක්ම ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවධානය යොමු කර බාණ්ඩගත කර වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල දී හැර එවැනි සමානතාවයක් නොමැති අයිතමයන් වෙන් වශයෙන් සලකා වාර්තා ගත කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

### 2.2 වාර්තා ගත කරනු ලබන කාලය

වාර්තා ගත කරනු ලබන කාලය 2015 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වේ.

අවශ්‍ය අවස්ථාවල දී සුදුසු පරිදි පහතින් අදාළ ගිණුම්කරන ප්‍රතිපත්තීන් පැහැදිලි කර ඇත.

### 2.3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකාරීත්වය මගින් විනිශ්චයන්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් කළ යුතු වන අතර ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීම් සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වටිනාකම් හඳුනා ගැනීමට ද බලපෑමක් ඇති කරයි. සත්‍ය තත්ත්වයන් මෙම ඇස්තමේන්තු ගත වටිනාකම් සමඟ වෙනස්වීමට ද හැකියාව ඇත.

ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් ඓතිහාසික පිරිවැය මත සහ වෙනත් සාධක මත පදනම් වන අතර ඒවා පවත්නා වෙනත් සාධක සහ තොරතුරු මත පදනම්ව පවතින වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙන එනු ලබන වටිනාකම තක්සේරුවට භාජනය කර ඇත.

ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ඒ අනුව ගිණුම්කරණ ඇස්තමේන්තු වලට කරනු ලබන සංශෝධනයන් හඳුනා ගනු ලබන්නේ එම ඇස්තමේන්තු සංශෝධනයන් සිදු වුවහොත් සහ එය අනාගත කාලයට බලපෑමක් ඇති කරයි නම් පමණි.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීමේ දී කරනු ලබන තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු සහ ඒවා සැලකිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් තුළට බලපෑමක් ඇති කර ඇස්තමේන්තු කිරීම් පහත පරිදි සටහන් මගින් ඉදිරිපත් කර ඇත.

### 2.3.1 රක්ෂණ වගකීම් ගිවිසුම්වල වටිනාකම තක්සේරුව

සාමාන්‍ය රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට අදාළව වාර්තා කරනු ලබන දිනට ඉදිරිපත් විය හැකි අවසාන වටිනාකමට ඇස්තමේන්තු කර ඇති අතර එම ඉදිරිපත් වන හානි පූර්ණ අයදුම්පත්වල ගෙවීමට සිදුවන වටිනාකම නිශ්චිතව හඳුනා ගැනීමට ගතවන සාධාරණ කාලය සැලකියයුතු කාලයක් වෙයි.

විශාල වටිනාකමින් යුතු හානි පූර්ණයන් වෙන් වශයෙන්ම ගෙන සලකා බලා අලාභයන් හි මුහුණත වටිනාකම යළි තක්සේරු කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අනාගත තත්ත්වයන් නිරූපනය වන පරිදි බොහෝ අවස්ථාවල දී අගය කිරීම් කරනු ලැබුව ද උද්ධමනය හෝ අලාභ ලැබීමේ සම්භාවිතාව පදනම්ව පෙර වර්ෂවල හානි ප්‍රතිපූර්ණයන් වල වර්තමාන වටිනාකම තක්සේරුවට භාජනය කරනු ලබයි.

උපයා නොමැති වාරික වටිනාකම තක්සේරු කිරීමේ දී ද මේ හා සමාන විනිශ්චයන් ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් යොදා ගෙන ඇත. රක්ෂණ ආවරණ සහිත තුවාලකරුවන් මත ඉදිරිපත් වන හානි පූර්ණයන්ට අදාළව වටිනාකම් තක්සේරු කිරීමේ දී වැඩි වශයෙන් මෙම විනිශ්චයන් මත පදනම්ව ඇස්තමේන්තු කිරීම් කළ යුතු වේ. මෙහි දී කාලය පිළිබඳ වැඩි අවධානයක් යොමු නොවනු ඇත.

### 2.3.2 අත්පත් කර ගැනීමේ පිරිවැයෙහි හානිකරණය

සෑම වාර්තා කරන දිනකටම අත්පත් කර ගැනීමේ පිරිවැයෙහි අගය අඩුවීමත් පිළිබඳ සමාලෝචනයක් සිදු කරයි. ඉදිරියට ගෙන ආ වටිනාකම අඩුනම් එය විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙහි හානි කරන පාඩුවක් ලෙස හඳුනා ගනී. සමාලෝචිත වර්ෂය තුල එවැනි අගය අඩුවීමක් දක්නට නොතිබිනි. අදාල කොන්ත්‍රාත් හිලව් කර හෝ අවලංගු කර ඇතිවිට අත්පත් කර ගැනීමේ පිරිවැය ඉවත් කරනු ලබයි.

### 2.3.3 අගය අඩු වීම පිළිබඳ තක්සේරු කිරීම

සෑම වාර්තා කරනු ලබන දිනකටම මණ්ඩලය මගින් කිසියම් වත්කමකට හෝ මුදල් උත්පාදන ඒකකයක අගය අඩුවීමකට බලපාන සාධක ඇති බවට හඳුනාගැනීමක් හෝ තත්ත්වය වර්ධනය වීමක් තිබේ නම් ඒ පිළිබඳ තක්සේරුවක් කරනු ලබයි. මේ සඳහා අදාළ වත්කමෙහි හෝ මුදල් උපයන ඒකකයෙහි වටිනාකම පිළිබඳ තක්සේරුවක් කළ යුතු වේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකාරීත්වය මගින් එම වත්කම්වල හෝ මුදල් උත්පාදන ඒකකවල අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමක් සහ ඒවායෙහි වර්තමාන වටිනාකම සොයා ගැනීම සඳහා සුදුසු වට්ටම් ප්‍රතිශතයක් තෝරා ගැනීම ද කළ යුතු වේ. මෙම අගයකිරීම් සඳහා මණ්ඩලය මගින් අනාගත මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාත පිළිබඳ ඇස්තමේන්තු කිරීමක් කළ යුතු වේ. ඒ සඳහා ඔවුන් අවිනිශ්චතතාවන්ට ද මුහුණ දෙනු ඇත.

### 2.3.4 වගකීම් සහ අවදානම් සඳහා වෙන් කිරීම්

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ මණ්ඩලයට නීතයානුකූල හානි ප්‍රතිපූර්ණයන් ඉදිරිපත් කෙරෙයි. කළමනාකාරීත්වය මගින් එම ප්‍රතිපූර්ණයන් සඳහා ඉදිරිපත් වීමට ඇති සම්භාවිතාව පදනම්ව ඒ සඳහා වෙන් කිරීම් කරනු ලබයි. මෙහි දී නෛතික හානි පූර්ණයක් හිමි වීම සඳහා වන කාලය අවිනිශ්චිත වන අතර ඒ නිසා ද ආර්ථික ප්‍රතිලාභයන් ඇති කරයි. නියමිත නෛතික තීරණයන් ලැබීමට ගත වන කාලය සහ ඊට දරණ පිරිවැය අවසාන වශයෙන් රඳා පවතිනුයේ ඒ සඳහා ගත වන කාලය මත වේ.

### 2.3.5 පමා කළ බදු වත්කම් සහ වගකීම්

සංකීර්ණ බදු රෙගුලාසීන්වල පවතින අර්ථකතනයන්ට අදාළව අවිනිශ්චතතාවයක් පවතින අතර ඒ මත අනාගත ආදායම මත ගෙවීම් කළ යුතු බදු ප්‍රමාණය සහ දින වකවානු රඳා පවතියි. කළමනාකාරීත්වය ඇස්තමේන්තු කරන පරිදි මෑත අනාගතයක දී බදු ගෙවිය යුතු ලාභයක් ඉපැයීමක් නොමැති අතර ඊට හේතුව නම් මණ්ඩලය මගින් සැලකිය යුතු මුදලක් රජයේ ඒකාබද්ධ අරමුදලට දායක වන බැවින් සහ එම ප්‍රමාණය ආදායම් බදු ගණයේ දී අඩු කළ හැකි වියදමක් බවට ද පවත්වන බැවින් පමා කළ බදු සඳහා වෙන් කිරීමක් අවශ්‍ය නොවනු ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

### 2.3.6 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

#### තක්සේරු කිරීම - පාරිතෝෂිත

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ පරිදි විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම සඳහා වන වියදම තක්සේරු කිරීම සත්‍ය වටිනාකම මත පදනම්ව සිදු කිරීම අවශ්‍ය නොවන අතර කෙසේ වෙතත් පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ගණනය කරනුයේ අවම වශයෙන් මාසික වැටුපෙන් අඩක් සෑම සම්පූර්ණ කරන ලද වර්ෂයක් සඳහාම පදනම්වය. තව ද වට්ටම් අනුපාතයෙහි බලපෑම වත්කම්වල බලාපොරොත්තු වන ප්‍රතිලාභ අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම් අපේක්ෂාවන් ආදිය මෙහි දී අවධානයට ලක් කර නොමැත.

### 2.3.7 නාමික බදු බැර (රඳවා ගැනීමේ බදු)

මණ්ඩලය මගින් අනාගත බදු අය කළ හැකි ආදයම තක්සේරු කරනු ලබන අතර ඊට එරෙහිව ගෙවන ලද නාමික බදු බැර හිලව් කිරීම් සඳහා හිමිකම් ඇත. මෙහි දී මණ්ඩලය මගින් ගෙවන ලද නාමික බදු ලාභ අලාභ ගිණුමට සටහන් කරනු ලබන අතර එම නාමික බදු මුදල නුදුරු අනාගතය තුළ මණ්ඩලයට හිලව් කර ගැනීමක් අපේක්ෂා කළ නොහැකි. කෙසේ වෙතත් අනාගතයේ දි මණ්ඩලයට බදු අය වන ආදායම් ඉපයීමක දී එය ආපසු ලබා ගෙන එලෙස ලියා හැර ඇති නාමික බදු ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත.

### 2.3.8 අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයෙහි කළමනාකාරීත්වය මගින් ඇගයීමට ලක් කළ පරිදි මණ්ඩලයට අඛණ්ඩ පැවැත්මකින් යුතුව ව්‍යාපාරික කටයුතු නුදුරු අනාගතයක් දක්වා කර ගෙන යාහැකි අතර එයට එම අවශ්‍යතා සඳහා සියලු සම්පත් ඇති බව ද නිරීක්ෂණය කර ඇත.

ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්වාගෙන යෑමේ මණ්ඩලයේ හැකියාව පිළිබද සැලකිය යුතු සැකයක් ඇතිකරන ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයන් පිළිබඳව මණ්ඩලයට දැනගැනිමට ලැබී නැත. ඒ හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත. සැලකිය යුතු අවිනිශ්චිතතාවයෙන් යුතු ඇස්තමේන්තු කිරීමේ ප්‍රමාණාත්මක විනිශ්චයන් යොදා ගනිමින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතයට ගැනීමේ දී ඒ පිළිබඳ තොරතුරු ගිණුම් වාර්තා සමග ඉදිරිපත් කර ඇති වටිනාකම්වල ඇතුළත් වන අතර ඊට අදාළ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කර ඇත.

| තීරණාත්මක ගිණුම්කරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් |
|---|
| **උපයා නොගත් රක්ෂණ වාරික සහ පමා කළ අත්පත් කර ගැනීමේ පිරිවැය** |
| **හිගව ඇති හානිපූර්ණ සඳහා වෙන් කිරීම්** |
| **විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් අගය කිරීම** |

### 2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.4.1 අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගෙන ඇති අස්පෘෂ්‍ය වත්කම් අගය කිරීම ආරම්භක පිරිවැය පදනම්ව කර ඇති අතර පහත මූලිකවම හඳුනාගත් අස්පෘෂ්‍ය වත්කම් ඉදිරියට ගෙනවිත් ඇත්තේ පිරිවැයෙන් ඉදිරියට ගෙන ආ ලියාහැරීමේ වටිනාකමට අඩු කිරීමෙන් අනතුරුව වන අතර මෙම අස්පෘෂ්‍ය වත්කම් ඒවායෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ අගය අඩුවීමක දී ඒවා එම ජීවිත කාලය තුළ ලියා හරිනු ලබයි. අඩුම තරමින් සෑම වාර්තා කරනු ලබන අවස්ථාවක දීම ලියා හැරීමේ වර්ෂ ගණන සහ ක්‍රමය පිළිබඳ ඇගයීමකට ලක් කරනු ලබන අතර අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය හෝ බලාපොරොත්තු වන පාරිභෝජන රටාව පදනම්ව එම වත්කම්වල ලියා හරිනු ලබන වටිනාකම තීරණය කරනු ලබන අතර එය සුදුසු පරිදි එම ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ගෙන ගිණුම් ගැලපීම් සිදු කර ඇත. මෙම අස්පෘෂ්‍ය වත්කම්වල ලියා හැරීමේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනවල එම වත්කම් යොදා ගනු ලබන මෙහෙයුම් කාණ්ඩය යටතේ දක්වා ඇත.

අස්පෘෂ්‍ය වත්කමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමෙන් අත් හරිනු ලබන විටෙක දී හට ගනු ලබන ලාභය හෝ පාඩුව ගණනය කරනු ලබන්නේ එම වත්කම ඉවත් කිරීමෙන් උපලබ්ධිවන වටිනාකමින් ඉදිරියට ගෙන එන ලද වටිනාකම අඩු කිරීමෙන් පසුවය. එය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබූයේ එම අස්පෘෂ්‍ය වගකීම ඉවත් කරනු ලබන අවස්ථාවේදීමය.

මණ්ඩලය මගින් මිලට ගෙන ඇති පරිගණක මෘදුකාංග වටිනාකම පිරිවැයෙන් ඉදිරියට ගෙනවිත් ඇති ලියාහල අගය ඉදිරියට ගෙනවිත් ඇති ලියාහරින ලද පාඩු සැලකීමෙන් අනතුරුවය.

පරිඝනක මෘදුකාංග ලියා හැරීම වසර 04ක් පුරා සිදු කරනු ලබයි.

### 2.4.2 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත සහ උපකරණ සියල්ල ස්පෘෂ්‍ය වත්කම් වේ. ඒවා වර්ෂ එකකට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරනු ලබයි.

පිරියත යන්ත්‍ර සහ උපකරණ වාර්තා ගත කර ඇත්තේ ඒවා මිලට ගැනීමට දරණ ලද පිරිවැයට එම වත්කමින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමට සුදුසු බවට පත් කිරීමට දරනු ලබන අනෙකුත් වියදම් ද එකතු කරන ලද පිරිවැයටය.

### 2.4.3 ක්ෂය කිරීම්

මණ්ඩලය ස්ථාවර වත්කම් සඳහා ක්ෂය කිරීම් පරිහරණයට මිලට ගත් මාසයේ සිට ආරම්භ කර එම වත්කම ඉවත් කරන මාසය තෙක් එය ගණනය කිරීම කරනු ලබයි. ක්ෂය වෙන් කිරීම කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය පදනම්ව වන අතර එම පිරිවැය අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය පුරා පහත පරිදි ලියා හැරීම කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

| | |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර | වසර 10ක් සඳහා |
| ලී බඩු සහ සවි කිරීම් | වසර 08ක් සඳහා |
| කාර්යාල උපකරණ | වසර 06ක් සඳහා |
| මෝටර් රථ වාහන | වසර 10ක් සඳහා |

සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්වල ලියාහරින ලද වටිනාකම ප්‍රයෝජනවත් ජීව කාලය, ක්ෂය කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කර සුදුසු පරිදි අවශ්‍ය සංශෝධන සිදු කරනු ලබයි.

සලකා බලනු ලබන වර්ෂය තුළ දී මණ්ඩලය තීරණය කළ පරිදි කාර්යාලීය උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය වසර 6 සිට වසර 13.33 කටත් ලී බඩු සහ සවිකිරීම් වල ප්‍රයෝජනවත් ජීව කාලය වසර 8 සිට වසර 13.33 ලෙසට ද සංශෝධනයට කටයුතු කර ඇත.

ඊට හේතු වූයේ 2015 වර්ෂය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් කිරීමක් සහ ඒ සම්බන්ධ සමුච්චිත ක්ෂය වටිනාකම නියමිත පරිදි ශේෂ පත්‍ර වල නිරූපනය කිරීම සඳහා කාර්යාල උපකරණ සහ ලී බඩු සහ සවිකිරීම්වල ඉදිරියට ඇති ප්‍රයෝජනවත් ජීව කාලය ආදිය සියල්ල සලකා මෙම ගැලපීම් කරන ලද අතර එමගින් ඇති වන බලපෑම හිමිකාරීත්වයට ගැලපීම් කර ඇත.

**කාර්යාල උපකරණ**

සමුච්චිත ක්ෂය සඳහා වන වෙනස්කම් රු. 9,896,506 ක මුදල සමුච්චිත හිමිකාරීත්වය මගින් ගලපා ඇත.

2015 වර්ෂයට අතිරේක ක්ෂය කිරීම් රු. 1,133,539

**ලීබඩු සහ සවිකිරීම්**

සමුච්චිත ක්ෂය සඳහා වන වෙනස්කම් රු. 1,747,293.

2015 වර්ෂයට අතිරේබ ක්ෂය කිරීම් රු. 180,611 කි.

**භාවිතයේ ඇති පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත උපකරණ**

වාර්තාකරන දිනට තවමත් භාවිතා කරන පූර්ණ ලෙස ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරනවල මූලික පිරිවැය පිටු අංක 24 හි සටහන් අංක 08 යටතේ දක්වා ඇත.

### 2.4.4 මූල්‍ය උපකරණ

මණ්ඩලය මගින් එහි මූල්‍ය තත්ත්වය වාර්තා කරනු ලබන දිනට ඇති මූල්‍ය වත්කම් මූල්‍ය වගකීම් හඳුනා ගන්නා ලද්දේ මණ්ඩලය අදාළ මූල්‍ය උපකරණවලට අදාළ නෛතික ප්‍රතිපාදන අනුව මණ්ඩලයට හිමිකාරීත්වය ලැබෙන අවස්ථාවේ දීය. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මූලිකව ඒවායෙහි සාධාරණ වටිනාකම පදනම්ව අගය කර ඇත. සෘජුව හඳුනාගත හැකි හුවමාරුවට අදාළ වියදම් ඇති නම් ඒවා ද සලකා මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් අගය කරනු ලබන අතර ඒවායෙහි සාධාරණ වටිනාකම නිරූපනය කිරීම සඳහා සුදුසු පරිදි මූල්‍ය වත්කම් සහ වගකීම්වලට වටිනාකම එකතු කිරීම හෝ අඩු කිරීම තුළින් අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබයි.

**මූල්‍ය වත්කම්**

**(අ) මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම**

මණ්ඩලය මගින් මූලිකවම සියලුම ණය හා ලැබිය යුතු දෑ හට ගන්නා අවස්ථාවේ දීම හඳුනා ගැනීම සිදු කරනු ලබන අතර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකවම හඳුනා ගනු ලබන්නේ ඒවායෙහි නෛතික අයිතිය මණ්ඩලය වෙත පැවරෙන අවස්ථාවෙහි දී ය. මූලිකවම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ඒවායෙහි සාධාරණ වටිනාකමට එම වත්කම් නිකුත් කිරීමට හෝ අත්පත් කර ගැනීමට සෘජුවම දරනු ලබන වියදම් වේ නම් ඒවා ද එකතු කර අගය කරනු ලබයි.

මූලික අදියරෙහි දී ම මූල්‍ය වත්කම් පහත සඳහන් එක් කාණ්ඩයක් යටතේ කාණ්ඩගත කරනු ලැබේ.

- ලාභයක් හෝ අලාභයක් ඇතිව සාධාරණ වටිනාකමට
- විකිණීමට ඇති මූල්‍ය වත්කම්
- අලාභයන් හා ලැබිය යුතු දෑ සහ
- කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන ලෙසට වර්ග කිරීම කරයි.

මණ්ඩලය මගින් එහි ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කම් වර්ග කිරීම සිදු කරනු ලබයි.

මෙම වර්ග කිරීම අදාළ වත්කම් අත්පත් කර ගැනීමේ අරමුණ පදනම්ව සිදු කිරීමට අවධානය යොමු කරයි. තවද මෙම අගය කිරීම ඒවායෙහි සාධාරණ වටිනාකම අනුව අගය කරනු ලබයි. එම වටිනාකම පදනම්ව ආයෝජන කාණ්ඩයට අදාළ හට ගන්නා ලාභ සහ අලාභ උපක්‍රමිකව හඳුනා ගැනීම කරයි. විකිණීමට ඇති ආයෝජන සහ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන කාණ්ඩයන් අගය කිරීම හෝ රඳවා ගැනීම ලියා හරින ලද පිරිවැය පදනම්ව සිදු කරයි.

මූල්‍ය වත්කම්වල මිලදී ගැනීම හෝ විකිණීමට අදාළ නිශ්චිත දිනය තීරණය කරනුයේ අදාළ නෛතික අයිතිය හුවමාරු වන දිනය හෝ වෙළඳපොළ ක්‍රමවේදය තුළ පවත්නා නිරවුල් වීමට අදාළ භාවිතයන්ට අනුව එම දිනය තීරණය කරනු ලබයි. එනම් මණ්ඩලය මගින් මිලට ගන්නා / විකුණන මූල්‍ය වත්කම් වලට අදාළ ගෙවීමට ඇති / ලැබිය යුතු මුදල හඳුනා ගැනීම කරනු ඇත. කෙසේ වෙතත් එම ආයෝජන හිමිකාරීත්වය යටතට වර්ග කරනු ලබන අවස්ථාවක දී සාමූහික ණය වල ගනුදෙනු වූ දිනයට (එනම් විකුණූ දිනය) එම වත්කම් අගය කිරීමට හෝ අගය නොකිරීමට එම ආයෝජනවල පිරිවැය සැලකිල්ලට ගනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

මණ්ඩලය සතුව ඇති මූල්‍ය වත්කම් සහ ඒවායෙහි වර්ග කිරීම් පහත දක්වා ඇති වගුව මගින් ඉදිරිපත් කර ඇත.

| කාණ්ඩය | මූල්‍ය වත්කම් |
|---|---|
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකම | කිසිවක් නොමැත |
| විකිණීමට ඇති | භාණ්ඩාගාර බැඳුම්කර |
| | භාණ්ඩාගාර බිල්පත් |
| ණය සහ ලැබිය යුතු දෑ | ප්‍රතිමිලදී ගැනීම් |
| | එක්දින ප්‍රතිමිලදී ගැනීම් |
| කල් පිරෙන තෙක් රඳවා ගැනීම් | විදේශ විනිමය සංවර්ධන බැඳුම්කර |
| | භාණ්ඩාගාර බැඳුම්කර |

### (ආ) පසුව කරනු ලබන අගය කිරීම්

මූල්‍ය වත්කම්වලට අදාළව පසුව කරනු ලබන අගය කිරීම් පහත පරිදි ඒවායෙහි වර්ග කිරීම් මත පදනම් වනු ඇත.

#### ලාභ හෝ අලාභයන් අනුව මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට ඉදිරිපත් කිරීම

ලාභ හෝ අලාභයන් අනුව මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම මත හඳුනා ගන්නා මූල්‍ය වත්කම් තුළට ගනුදෙනු කිරීමට රඳවා ගන්නා වත්කම් සහ ඒවා මූලාරම්භයේ දී දරණ ලද පිරිවැය පදනම්ව ලාභ / අලාභයන් හඳුනා ගැනීම් සහිතව අගය කරයි. නුදුරු අනාගතයේ දී විකිණීමේ අදහසින් මිලට ගෙන ඇති ආයෝජන මෙම විකිණීමට ඇති වත්කම් කාණ්ඩයට ඇතුළත් වනු ඇත.

ලාභ හෝ අලාභයන් හඳුනා ගැනීමක් සහිතව සාධාරණ වටිනාකමට ආයෝජනය කාණ්ඩ හඳුනා ගැනීමක් සඳහා පහත සඳහන් නිර්ණායකයන් සම්පූර්ණ කළ යුතු වේ.

- වෙනස් වෙනස් වූ පදනම් යොදා ගනිමින් එම වත්කම් සහ වගකීම්වල සාධාරණ වටිනාකමට අගය කිරීමක් සිදු නොවන බවට තහවුරු කර ගන්නා අතරම අඛණ්ඩ පැවැත්මකින් යුතුව එම වත්කම්වල වටිනාකම් ඉවත් කිරීමක් හෝ තක්සේරු වටිනාකම එකතු කිරීමක් කරනු ලැබීම හෝ

- මණ්ඩලයේ ආයෝජන උපාය මාර්ග අනුව යමින් එම මූල්‍ය වත්කම් සහ වගකීම් කළමනාකරණය සහ මෙහෙයවීම කරනු ලබන අතර එම මූල්‍ය වත්කම්, වගකීම් හෝ එම දෙවර්ගයට මණ්ඩලයේ මූල්‍ය වත්කම් සහ වගකීම් යටතට ඇතුළත් වේ.

මෙම ආයෝජනයන් මූලිකවම සාධාරණ වටිනාකම පදනම්ව වාර්තා කර ඇත. දෙවනුව ඒවායෙහි මුල් හඳුනා ගත් අගය නැවත අගය කිරීමට භාජනය කර ඒ අනුව සාධාරණ වටිනාකමෙහි ඇතිවන වෙනස්කම ලාභයක් හෝ අලාභයක් ලෙසට හඳුනා ගැනීම කරයි. එය සම්පූර්ණ ආදායම් තත්ත්වය වෙනස්වීම දැක්වෙන ප්‍රකාශනය තුළට ඇතුළත් කර ඇත.

උපචිත හා ගෙවිය යුතු පොළිය පිළිවෙලින් ආයෝජන ආදායම හා මූල්‍ය වියදම් ලෙසට පිළිවෙලින් හඳුනා ගෙන ඉදිරිපත් කර ඇති අතර සඵල පොලී අනුපාතය පදනම් කරගෙන ආයෝජන මත පොළී ලැබීමට හිමිකම ලැබූ විට දී පමණක් ආදායම් ලෙසට හඳුනා ගැනීම සිදු කරයි.

සුදුසු පරිදි නුදුරු අනාගතය තුළ විකිණීමට අදහස් කරයි නම් මණ්ඩලය මගින් මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමකට ලාභයක් අලාභයක් ඇතිව තක්සේරු කරනු ලබයි. හෝ

තවද කිසියම් විටෙක මණ්ඩලයට පවත්නා වෙළඳපොළ තත්ත්වය තුළ අදාළ මූල්‍ය වත්කම් අපේක්ෂා කරන පරිදි විකුණා ගැනීමටත් සිදු කළ නොහැකි විටක දී ඒ පිළිබඳ තත්ත්වය සලකා එම වත්කම් යළි වර්ගීකරණය කිරීමකට භාජනය කරනු ලබයි. ඒ සඳහා එවකට පවත්නා පොළී අනුපාතයන් සැලකිල්ලට ගනු ලබයි. මෙවැනි ණය සහ ලැබිය යුතු දෑ යළි වර්ගීකරණයට භාජනය කිරීම මගින් විකිණීමට ඇති හෝ කල් පිරෙන තෙක් රඳවා ගන්නා වත්කම් ලෙසට ඒවායෙහි ස්වභාවය අනුව හඳුනා ගැනීම කරනු ලබයි.

#### විකිණීමට ඇති මූල්‍ය වත්කම්

විකිණීමට ඇති මූල්‍ය වත්කම්වලට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර (රජයේ බැඳුම්කර) ඇතුළත් වන අතර මෙම ආයෝජනයන් කාණ්ඩය නිශ්චිත නොවන කාලයක් සඳහා රඳවා ගනු ලබන ආයෝජනයන් වේ. මෙම ආයෝජනයන් ද්‍රවශීලතා අවශ්‍යතාවන් මත සහ වෙළඳපොළ තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් ලෙස ඒවා විකිණීමක් සිදු විය හැකිය. විකිණීමට ඇති මූල්‍ය වත්කම් මූලාරම්භ වටිනාකමට අගයකිරීමෙන් පසුව ඒවා සාධාරණ වටිනාකමට අගය කරනු ලබන අතර එහි දී උප ලබ්ධි නොවූ ලාභය හෝ පාඩුව හඳුනා ගනු ලබයි. මේවා වෙනත් සම්පූර්ණ ආදායම් වර්ගීකරණය යටතේ විකිණීමට ඇති සංචිත ලෙසට හඳුනා ගෙන ඇත.

විකිණීමට ඇති ආයෝජන මත උපයනු ලබන පොළී ආදායම බලාපොරොත්තු වන පොළී අනුපාතය පදනම්ව හඳුනා ගනු ලබන අතර ලියා හරින ලද හිඟ රක්ෂණ වාරික සහ හෝ වට්ටම් කිරීම් විකිණීමට ගෙන ඇති ආයෝජනවලට අදාළව ආදායම් ගිණුම්වල ආයෝජන ආදායම ලෙසට හඳුනාගෙන ඇත්තේ එම පොළිය ලැබීමේ හිමිකම් ලබන අවස්ථාවේදීය. එසේම එම වත්කම්වල අගය අඩුවීමක් සිදු වී ඇති බවට හඳුනා ගන්නා විටකදී ඒ අනුව ආයෝජන ආදායමට සිදු කරනු ලබන ලාභ හෝ අලාභයන් ලෙසට සහ විකිණීමට ඇති සංචිත වටිනාකමට ගැලපීම් ඉවත් කරනු ලබයි.

මණ්ඩලය මගින් විකිණීමට ඇති මූල්‍ය වත්කම් අගය කිරීමේ දී ඒවායේ විකිණීමට ඇති හැකියාව සහ ඒ පිළිබඳ කෙටිකාලීනව ඇති අදහස අනුව වටිනාකම් තීරණය කරනු ලබයි. එසේම මෙම මූල්‍ය වත්කම් පවත්නා වෙළඳපොළ තත්ත්වයන් අනුව විකුණා ගැනීමට නොහැකි බවට කළමනාකාරිත්වයට හැඟී යන්නේ නම් සහ එහි බලපෑම සැලකිය යුතු තරම් වේ නම් එම තත්ත්වය සලකා යළි එම වත්කම් වර්ගීකරණය කිරීමක් කරනු ලබයි. මෙලෙස යළි වර්ගීකරණය කිරීමට ණය සහ ලැබිය යුතු දෑ යන

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

වර්ගීකරණයට හැකියාව ඇත්තේ එම මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අයත් වන සහ කළමනාකාරිත්වයේ අදහස සහ නුදුරු අනාගතයේ දී විකිණීමට හෝ කල් පිරීම වන තෙක් රඳවා ගැනීම සම්පූර්ණ අවස්ථාවල දී පමණි. කල් පිරෙන තෙක් රඳවා ගන්නා වත්කම් වර්ගීකරණයට හැකියාව ඇත්තේ ආයතනයට ඒ සඳහා හැකියාවක් සහ කල් පිරෙන තෙක් රඳවා ගැනිටම අදහසක් ද තිබේ නම් පමණි.

මූල්‍ය වත්කම්වල විකිණීමට ඇති වත්කම් යන කාණ්ඩයට අදාළව යළි වර්ගීකරණය නිසා ඇති වන ලාභ හෝ පාඩුව එම වත්කම මත හඳුනා ගනු ලබන අතර එම ප්‍රමාණය අපේක්ෂිත පොළී අනුපාතය යොදා ගනිමින් එම වත්කමෙහි පවත්නා ප්‍රයෝජනවත් ජීව කාලය පුරා යොදා ගැනීමක් කරනු ලබයි.

නව ලියා හරින ලද පිරිවැය සහ අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනස අපේක්ෂිත පොලී අනුපාතය යොදා ගනිමින් ලියා හැරීමට භාජනය කරයි. පසුකාලීනව එම වත්කම්වල අගය අඩුවීමක් හඳුනා ගනු ලැබූ විටෙක දී එය හිමිකාරීත්වයට ඇති කරන බලපෑම ආදායම් ප්‍රකාශනවල දැක්වීම කරනු ලබයි.

### ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යන වත්කම් කාණ්ඩය ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සහිත වන අතර ඒවා ක්‍රියාකාරී වෙළඳපොළක හුවමාරු කිරීමට නොහැකි වත්කම් කාණ්ඩයකි. මණ්ඩලය මගින් ණයකර ද මෙම කාණ්ඩය යටතේ නම් කිරීමට තීරණය කරන ලද අතර ඊට හේතුව නම් එවැනි උපකරණ මිල ලේඛනයට ඇතුළත් කලද ඒ සඳහා ක්‍රියාකාරී වෙළඳපොළක් නොතිබීමයි.

මෙම ආයෝජනයන් ආරම්භයේ දී පිරිවැයට හඳුනා ගන්නා ලද අතර එම ආයෝජන අත්කර ගැනීම සඳහා සාධාරණ වටිනාකමක් ගෙවීමට සිදු විය. මෙම වත්කම් මිලට ගැනීමට සෘජුවම දරණ ලද පිරිවැයක් තිබේ නම් එම ප්‍රමාණය ද ආයෝජන පිරිවැයට ඇතුළත් කර ඇත. ආරම්භක අගය කිරීමට අනතුරුව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොළී අනුපාතය යොදා ගනිමින් වටිනාකමට අගය කිරීම් කරන අතර එහි දී අගය අඩුවීම් සඳහා ද අඩු කිරීම් කර ඇත.

ලියා හරින ලද පිරිවැය ගණනය කිරීමේ දී කිසියම් වට්ටම් කිරීමක් හෝ අධි මිලක් පවතියි නම් එය සැලකිල්ලට ගෙන ඇති අතර අත් කර ගැනීමේ ගාස්තු හෝ වියදමක් වේ නම් එය අපේක්ෂිත පොළී ආදායමට ද ඇතුළත් කර සලකා බලයි. ආදායම් ප්‍රකාශනවල ආයෝජන ආදායම තුළට මෙම අපේක්ෂිත පොළී අනුපාතය යොදා ගනිමින් කරනු ලබන ලියා හැරීම් ගලපා ඇති අතර එම ලියා හැරීමේ ක්‍රියාවලිය තුළ දී එම ආයෝජනයට අදාළව ලාභය හෝ අලාභය හඳුනා ගැනීමක් කරනු ලබයි.

කාර්ය මණ්ඩලයට ලබාදී ඇති ආපදා ණය ප්‍රමාණ වටිනාකම් සැලකිය යුතු ලෙස අඩු බැවින් පොළී අනුපාතය යොදා ගනිමින් අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර අදාළ ලැබිය යුතු ණය වටිනාකම ගණනය කිරීම් කර හිඟ ණය ශේෂය හඳුනා ගැනීමක් සිදු කර නොමැත.

### කල්පිරෙන තෙක් රඳවා ගන්නා මූල්‍ය වත්කම්

ගණුදෙනු කිරීම සඳහා යොදා ගැනිමට නොහැකි ස්ථිර හෝ නිශ්චිත ගෙවීම් වටිනාකමක් සහ නිශ්චිත කල් පිරීමක් සහිත ඒවා මෙම කාණ්ඩයට ඇතුළත් වේ. මණ්ඩලයේ අදහස සහ හැකියාව මත මෙම වත්කම් කල් පිරෙන තෙක් රඳවා ගැනීම කරයි. මූලික අගය කිරීමෙන් අනතුරුව සඵල පොළී අනුපාතය යොදා ගනිමින් කල් පිරීමට රඳවාගත් මූල්‍ය වත්කම් ලියා හැරීමේ පිරිවැය සලකා බලමින් තක්සේරු කිරීමක් සිදු කරනු ලබයි. විදේශ මුදල් සංවර්ධන මණ්ඩලය මෙම කාණ්ඩය යටතේ වර්ග කර ඇත.

අයෝජන ඉවත්කරන විට හෝ හානිකරනයට ලක්වී ඇති විට හා ක්‍රමක්ෂය ක්‍රියාවලිය මගින් ද ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

### (ඈ) මූල්‍ය වත්කම් බැහැර කිරිම

පහත අවස්ථාවල දී මූල්‍ය වත්කමක් (හෝ මූල්‍ය වත්කමකින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයකින් කොටසක්) මූල්‍ය වත්කම් වලින් බැහැර කරනු ලබයි.

- වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත් වී ඇති වීම.
- මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය ගිවිසුම්ගත බැඳීමක් මගින් මාරුවී ඇති විටෙක.

හෝ

- මණ්ඩලය මගින් වත්කමකට අදාළ මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය රඳවාගෙන අහිමිවීමක හෝ තෙවන පාර්ශ්වය වෙත ගිවිසුම්ගත බැඳීමක් අනුව ලැබෙන මුදල් සැලකිය යුතු කාල ප්‍රමාදයක් නොමැතිව සම්පූර්ණ මුදල ගෙවීමට බැඳීමක් ඇති විටෙක.

එසේ නොමැති නම්,

(අ) වත්කමට අදාළ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ මණ්ඩලය මගින් සැලකිය යුතු ලෙසට මාරු කර ඇති විටෙක

(ආ) මණ්ඩලය මගින් වත්කමකට අදාළ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් මාරු කර ඇති විටෙක හෝ රඳවාගෙන ඇති විටෙක.

නමුත් වත්කමෙහි පාලනය හුවමරු කරගෙන ඇති විටෙක

මණ්ඩලය මගින් වත්කමකට අදාළව ලැබීමට නියමිත මුදල් ප්‍රවාහයන් පිළිබඳ අයිතිය හුවමාරු කරගෙන ඇති විටෙක හෝ එසේ කර ගැනීමට එකඟ වී ඇති විටෙක සහ එම වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභයන් සැලකිය යුතු ප්‍රමාණයක් හුවමාරු වී ඇති විටෙක හෝ වත්කමෙහි පාලනය හුවමාරු වී ඇති විටෙක එම වත්කම පිළිබඳව මණ්ඩලයට ඇති බැඳියාව මත එහි හිමිකම හඳුනා ගනු ලබයි.

දිගුකාලීන බැඳීම් පදනම්ව හුවමරු වන වත්කමක එකඟවන ලද වටිනාකම ඉදිරියට ගෙන එන ලද අවම වටිනාකම පදනම්ව සහ මණ්ඩලය මගින් ගෙවීමට ඇති උපරිම මුදල පදනම් අගය කරනු ලබන අතර මණ්ඩලය මගින් සම්බන්ධිත වගකීම් හඳුනා ගැනීමක් කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

මණ්ඩලය මගින් රඳවා ගනු ලබන අයිතිවාසිකම් සහ වගකීම් මත පදනම්ව භුවමාරු වන වත්කම සහ ඒ හා සම්බන්ධ වගකීම් තක්සේරු කර හඳුනා ගනු ලබයි.

### (ඇ) මූල්‍ය වත්කම්වල අගය අඩුවීම

මණ්ඩලය මගින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම්වල කිසියම් කාණ්ඩයක අගය අඩුවීමක් නිරූපනය කරයි නම් එය ඇගයීමට ලක් කරනු ලබයි. කිසියම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අනාගත මුදල් ප්‍රවාහයන්ගේ අගය අඩුවීමක් නිරූපනය කර බවට විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කරනු ලැබිය හැකි නම් එමගින් අලාභයක් නිර්මාණය කරනු ලබයි. එසේ ම එය මූලාරම්භක අගය කිරීමට පසු අවස්ථාවක දී කිසියම් සිද්ධියක හෝ සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙසට සිදුවිය හැකි වේ. අගය අඩුවීම පිළිබඳ සාක්ෂියක් ලෙසට දැක්විය හැක්කේ කිසියම් ණයකරුවෙකුගේ හෝ ණය කාණ්ඩයක සැලකිය යුතු මූල්‍ය අර්බුදයක් නිරූපනය කරයි නම් සහ එමගින් ප්‍රාග්ධන මුදල හෝ පොළී මුදල් ගෙවීම පැහැර හරිනු ලබයි නම් හෝ නොගෙවා සිටියි නම් එවැනි අය බුන්වත් භාවයට පත්වීමට හෝ වෙනත් මූල්‍ය අර්බුදයන්ට මුහුණපෑමක් නිරූපනය කරයි. එමගින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සැලකිය යුතු අඩුවීමක් ද නිර්මාණය වේ. එය නොගෙවා සිටීමක් හෝ ඒ හා සමාන ආර්ථික අපහසුතාවක් නිර්මාණය කරනු ලබයි.

### (ඈ) සාධාරණ ගණනය කිරීම

මණ්ඩලය මගින් වාර්තා කරනු ලබන සෑම දිනකදීම විකිණීමට ඇති වත්කම් යන කාණ්ඩයට අයත් මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය පිළිබඳ තක්සේරුවක් කර ලාභය හෝ අලාභය හඳුනා ගනු ලබයි.

සියලුම වත්කම් හා වගකීම්වල සාධාරණ අගය තක්සේරු කිරීම හෝ හෙළිදරව් කිරීම මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන අතර එම සාධාරණ අගය දැක්වීම අනුපිලිවල පහත පරදි ඉදිරිපත් කරයි. එය සමස්ථයක් ලෙස සාධාරණ අගය ගණනය කිරීමට වැදගත්වන අඩුම යෙදවුම මත පදනම් වේ.

- 1 මට්ටම - මිල කිරීමක් සහිත (වෙන් කිරීමකින් තොරව) හඳුනාගත් වත්කම් හෝ වගකීම්වල ක්‍රියාකාරී වෙළඳපොළ මිල
- 2 මට්ටම - සාධාරණ අගය තක්සේරු කිරීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි වීම.
- 3 මට්ටම - සාධාරණ අගය තක්සේරු කිරීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම නිරීක්ෂණය කල නොහැකිවීම.

## මූල්‍ය වගකීම්

### (අ) මූලාරම්භක හඳුනා ගැනීම හා අගය කිරීම

සියලුම මූල්‍ය වගකීම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබයි. ණය සහ ණය ගැනීම් සැලකීමේ දී ඒ සඳහා දරනු ලබන සෘජුවම හඳුනා ගත හැකි වියදම් අඩු කරනු ලබයි.

මණ්ඩලයේ මූල්‍ය වගකිම් යටතට වෙළඳ සහ රක්ෂණ ගෙවීම් සහ බැංකු අයිරා ද ඇතුළත් වෙනත් ගෙවීම් ද ඇතුළත් වෙයි.

### (ආ) පසුකාලීනව අගය කිරීම

පහත පරිදි මූල්‍ය වගකීම්වල වර්ග කිරීම් මත පසුකාලීනව ඒවායෙහි අගය කිරීම රඳා පවතිනු ඇත.

#### ණය සහ ණය ගැනීම්

මූලාරම්භයේ දී හඳුනාගැනීමෙන් අනතුරුව පොළී ගෙවනු ලබන ණය සහ ණය ගැනීම් පසුකාලීනව අගය කිරීම සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ලියා හැරීමේ පදනමට කරනු ලබයි. සඵල පොළී අනුපාතය යොදා ගනිමින් වගකීම් ලියා හැරීමේ ක්‍රියාවලියේදී හට ගනු ලබන ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම කරනු ලබයි. අත්පත් කර ගැනීමේ දී ගෙවනු ලබන අධි මිල හෝ ලැබෙන වට්ටම් ද සලකා ඒවා ද සඵල පොළී අනුපාතයට ගැලපීමෙන් අනතුරුව ලියා හැරීමේ පිරිවැය ගණනය කරයි. එසේම ආදායම් ප්‍රකාශනවල එම ලියා හැරීමේ පිරිවැය මූල්‍ය ණය පිරිවැය යටතේ දක්වා ඇත.

### (ඇ) ඉවත් කිරීම

වගකීම් යටතේ ඇති බැදීම් නිදහස්කලවිට, අවලංගුකල විට හෝ කල් ඉකුත්වූ විට මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබයි.

### (ඈ) ගෙවිය යුතු රක්ෂණ

ගෙවිය යුතු රක්ෂණයන් ගේ වටිනාකම අදාළ වාරික ගෙවීමට බැඳීමත් සමග හඳුනා ගන්නා අතර එහි වටිනාකම මූලාරම්භයේ දී ඉදිරිපත් වී ඇති වටිනාකමෙහි සාධාරණ අගයෙන් එම ගණුදෙනුව සඳහා දරන ලද පිරිවැය අඩු කරන ලද අගයට තක්සේරු කර ඇත. පසු අවස්ථාවල දී සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ලියා හරින ලද වටිනාකමට අගය කරනු ලබයි.

මෙම ගෙවිය යුතු රක්ෂණ වාරික කිසියම් විටෙක ඒ පිළිබඳ වගකීම නිරවුල් කිරීමක දී වගකීම අවලංගු කල විට දී හෝ කල් ඉකුත්වීමක දී ඉවත් කරනු ලබයි.

### 2.6.4 මූල්‍ය උපකරණයන් එකිනෙක හිලව් කිරීම

මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙක හිලව් කර ශුද්ධ අගය පමණක් හඳුනා ගෙන දක්වා ඇත. එසේ කරනුයේ වර්තමානයේ

| උපකරණ කාණ්ඩය | සාධාරණ අගය කිරීමේ පදනම | සාධාරණ අගය කිරීමේ වැදගත්කම |
|---|---|---|
| සංවර්ධන බැඳුම්කර | සඵල අනුපාතය අනුව අගය කර ඇත. | මට්ටම 2 |
| භාණ්ඩාගාර බැඳුම්කර | වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. | මට්ටම 1 |
| භාණ්ඩාගාර බිල්පත් | වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. | මට්ටම 1 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවත්නා විට හා එලෙස ශුද්ධ අගයට නිරවුල් කිරීමේ අරමුණක් ද පවතින විටෙකදීය. එසේ නොමැතිනම් වත්කම් උපලබ්ධිවීම සහ වගකීම් නිරවුල් කිරීම එකම අවස්ථාවක දී සිදුවන විටෙක දී ද මෙලෙස ශුද්ධ අගයට වාර්තා කිරීම කරනු ලබයි. විශේෂ වශයෙන් හෙළිදරව් කළ පරිදි මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුව කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක අවශ්‍යතාව පරිදි හෝ ඉඩ ලබාදී ඇති පරිදි හෝ නිර්වචනය කර ඇති පරිදි ආදායම් සහ වියදම් හිලව් කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම් කර ඇත.

### 2.6.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

මණ්ඩලය මගින් සෑම වාර්තා කරනු ලබන දිනක දීම කිසියම් වත්කමක අගය අඩුවීම පිළිබඳ ලක්ෂණයන් තිබේද යන්න පිළිබඳව සලකා බලයි. එවැනි ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කම වාර්ෂික අගය අඩුවීම පිළිබඳ පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේ නම් මණ්ඩලය මගින් එම වත්කමෙහි අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමක අය කර ගත හැකි අගය වනුයේ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පරිහරණයට ඇති වටිනාකම අඩු කළ පසු ඉතිරි අගය වේ. අනෙක් වත්කම් හෝ වත්කම් කාණ්ඩයන්ගෙන් වැඩි වශයෙන් ස්වාධීනව කිසියම් වත්කමක් මුදල් ඉපයීමක් උත්පාදනය නොකරයි නම් එවිට දී වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම වෙන් වශයෙන් හඳුනා ගැනීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ආ අගය හෝ මුදල් උත්පාදන ඒකක වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම් එම වත්කමේ අගය අඩුවීමක් ඇති බවට සලකයි. එවිට එම එහි අය කර ගත හැකි වටිනාකම අඩු කිරීමක් කරනු ලබයි. වත්කමක පරිහරණයට ගත හැකි වටිනාකම තක්සේරු කිරීමේ දී ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්. බද්දට පෙර වට්ටම් අනුපාතය යොදා ගනිමින් වර්තමාන වටිනාකම සොයා ගැනීම කරයි. සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී විකිණීමට දැරීමට සිදුවන වියදම අඩු කරනු ලබන අතර තොරතුරු තිබේනම් මෑතකාලීන වෙළඳපොළ ගණුදෙනු විස්තර ද යොදා ගනු ලබයි. එවැනි වෙළඳපොළ තොරතුරු නොමැති විටක දී පවත්නා සුදුසු අයග කිරීමේ ක්‍රමවේදයක් යොදා ගැනීම සිදු කරයි.

අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්වල අගය අඩුවීමේ අලාභයන් ආදායම් ප්‍රකාශනවල හඳුනා ගන්නා අතරම එම වියදම් කාණ්ඩය එම අගය අඩු වූ වත්කමෙහි ක්‍රියාකාරී ස්වභාවය අනුව වර්ගීකරණය කරනු ලබයි.

### 2.6.6 සාමාන්‍ය රක්ෂණ ගිවිසුම්ගත බැඳීම්

සාමාන්‍ය රක්ෂණ ගිවිසුම්වලට අදාළ වගකීම්වලට හිගව ඇති හානි ප්‍රතිපූර්ණ මුදල් සහ හිගව ඇති රක්ෂණ වාරික සඳහා වන වෙන් කිරීම් හිගව ඇති හානි ප්‍රතිපූර්ණ වෙන් කිරීම් ඇස්තමේන්තුගත අවසාන වශයෙන් දරන ලද එහෙත් වාර්තාගත කරන දිනට නිරවුල් නොවූ සියලුම හානි ප්‍රතිපූර්ණයන් පදනම් කරගෙන ඇති අතර ඊට හානි ප්‍රතිපූර්ණයන් සැකසීමට අදාළ වියදම්, වෙනත් ලැබීම් සහ සුන්බුන් විකිණීමේ ලැබීමට අපේක්ෂිත මුදල් අඩු කිරීම ද කරනු ලබයි.

සමහර අවස්ථාවල දී දැනුම්දීමේ ලිපිය හා සමහර වර්ගවල හානි ප්‍රතිපූර්ණයන් ප්‍රමාදවීමක් සිදු විය හැකිය. එම නිසා වාර්තා කරනු ලබන දිනට අවසාන වශයෙන් දරණ වියදම නිශ්චිත කිරීමක් නිශ්චිතවම නොහැකි වනු ඇත. තව ද මුදලේ අගය වෙනස්වීම සඳහා වගකීම්වලට අදාළව ගැලපීම් කර නොමැත. තව ද හානි පූර්ණ ගෙවීමට ඇති වගකීම කල් ඉකුත් වීම, වගකීම ඉවත්වීම හෝ අවලංගු වූ විටෙක දී අදාළ වගකීම ද හඳුනා නොගනියි.

වෙන් කිරීම් ශුද්ධ උපයා නොගත් රක්ෂණ වාරික හිලව් කර නොගත් ශුද්ධ අත්පත් කර ගැනීම් පිරිවැය සඳහා වෙන් කිරීම් සහ දළ හිග වාරික ගෙවීම සඳහා කළ වෙන් කිරීම් ද ඇතුළත් වේ. උපයා නොගත් රක්ෂණ වාරික වටිනාකම හිලව් කර නොගත් වත්කම් අත්කර ගැනීමේ පිරිවැය සහ නිරවුල් නොකළ දළ හානි ප්‍රතිපූර්ණ සඳහා වෙන් කිරීම් යනාදිය රක්ෂණ කර්මාන්තයේ සහ යහපත් පරිහරණයන්ට අනුව සිදු කර ඇත.

සෑම වාර්තා කරනු ලබන දිනක දීම මණ්ඩලය මගින් එහි කල් ඉකුත් නොවූ අවදානම් ඇගයීමට ලක් කරන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති අංක 4 අනුව වගකීම් හඳුනා ගැනීමේ පරීක්ෂාව ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් බලාපොරොත්තු වන හානි පූර්ණයන්ගේ සමස්ථ අතිරික්තයක් තිබේද, උපයා නොගත් වාරික අත් කර ගැනීමේ වියදම් ලියා හැරීමේ වියදම් ආදිය සලකා බලයි. මෙම ගණනය කිරීම් සඳහා අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන ඇස්තමේන්තු සලකා බලන අතර ඒ සඳහා සාමාන්‍ය රක්ෂණ සඳහා වන ප්‍රතිපාදන වෙන් කිරීම් හා ඒ මත ඇතිව වත්කම්වල බලාපොරොත්තුවන ආයෝජන ප්‍රතිලාභය සැලකිල්ලට ගනු ලබයි. මෙහි දී උපයා නොගත් රක්ෂණ වාරිකයන්ගේ වාර්තාගත වටිනාකම (අත්කර ගැනීමේ ඉදිරියට ගෙන ආ අගය අඩු කළ පසු) ප්‍රමාණවත් නොවේ නම්, එම ඌණතාවය රක්ෂණ වාරික හිගය ලෙසට හඳුනා ගෙන එය ආදායම් ප්‍රකාශනවල දැක්වීම කරයි.

### 2.6.7 ප්‍රතිරක්ෂණය කිරීම

මණ්ඩලය සිය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී හට ගන්නා රක්ෂණ අවදානම හඳුනාගැනීමක් සිදු නොකරයි. ප්‍රතිරක්ෂණ වත්කම් ප්‍රතිරක්ෂණ සමාගම්වලින් ලැබිය යුතු වටිනාකම් නිරූපනය කරයි. එම ප්‍රතිරක්ෂණයන්ගෙන් ලැබිය යුතු වටිනාකම තක්සේරු කිරීම හිගව ඇති හානි ප්‍රතිපූර්නයන් සඳහා වෙන් කිරීම් හෝ ප්‍රතිරක්ෂණ ගිවිසුම් අනුව ගෙවීම් කරන ලද ප්‍රතිලාභ අනුව සහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් ප්‍රකාරව වනු ඇත.

සෑම වාර්තා කරනු ලබන දිනකම හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හීන වූ අගය තක්සේරු කිරීමක් හෝ බොහෝ විට වාර්තා කරනු ලබන වර්ෂයක දී එලෙස අගය අඩුවීමක් පිළිබඳ අනාවරණයක දී සිදු කරනු ලබයි. මෙලෙස අගය අඩුවීම සිදු වනුයේ ප්‍රතිරක්ෂණ වත්කමක මූලාරම්භක වටිනාකම වෙනස්වීමට තුඩු දෙන සිද්ධියක් සිදු වී ඇති විටෙක මණ්ඩලයට ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුව හෝ සිදු වූ සිදුවීමකට අනුව විශ්වාසදායී ලෙසට ඇතිවන බලපෑම ගණනය කළ හැකි විටෙක දීය. මෙම අගය අඩුවීමේ අලාභය ආදායම් ප්‍රකාශනවල වාර්තා ගත කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

පවරන ලද ප්‍රතිරක්ෂණ සැලසුම් මගින් මණ්ඩලයට රක්ෂණ හිමියන් කෙරෙහි වගකීමක් නොමැත.

ප්‍රතිරක්ෂණ වගකීම් නියෝජනය කරනුයේ ප්‍රතිරක්ෂණ සමාගම්වලට ගෙවීමට ඇති බැඳීම් වේ. ගෙවීමට ඇති වටිනාකම අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට අනුකූලව ඇස්තමේන්තු කර ඇත.

රක්ෂණ වාරික සහ ගෙවීමට ඇති ප්‍රතිපූර්ණයයන් පවරනලද සහ සක්‍රීය ප්‍රතිරක්ෂණයන් මත දළ වටිනාකම් ඉදිරිපත් කර ඇත.

ගිවිසුම්ගත හිමිකම කල් ඉකුත්වීම ඉඩ හැරීමක දී හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයකට පැවරීමක දී හෝ මණ්ඩලය මගින් ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් ඉවත්කරන ලදී.

මණ්ඩලය 2012 වර්ෂයේ සිට අනුගමනය කළ පරිදි සලකා බලන වර්ෂය තුළ දී සියළුම ව්‍යාපාරික කටයුතුවලින් භට ගන්නා රක්ෂණ සහ එමගින් භාර ගන්නා ප්‍රතිරක්ෂණ සඳහා වන අවදානම් භාර දීමක් සිදුකර නොමැත.

### 2.6.8 ලැබිය යුතු රක්ෂණයන්

ලැබිය යුතු රක්ෂණ වාරිකයන් මූලාරම්භයේ දී ලැබිය යුතු හෝ ලැබීමට නියමිත වටිනාකම සාධාරණ අගයට තක්සේරු කර හඳුනා ගැනීම කරයි. කිසියම් රක්ෂණයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම කිසියම් සිදුවීමක් හෝ තත්ත්වයන්ගේ වෙනසක් නිසා අගය අඩවීමක් සිදු වෙයි නම් එය තක්සේරුවට භාජනය කර අගය අඩුවීමේ අලාභයන් ආදායම් ප්‍රකාශනවලට වාර්තා ගත කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත්කර ඇති රක්ෂණ වාරික ගෙවීම් පිලිබඳ සහතික කිරීමේ විධිවිධානවලට අනුව එයට යටත්ව නිකුත්කර ඇති රක්ෂණ ඔප්පු දින 60 ක කල්පිරීමේ කාලය මත බේරුම්කර නොතිබුන හොත් අවලංගු කරනු ලබයි.

### 2.6.9 මුදල් සහ මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ ලෙස බැංකු ශේෂය, අතැති මුදල් ශේෂය සහ ශුද්ධ බැංකු අයිරා ශේෂය ද ඇතුළත් වෙයි.

### 2.6.10 විකුණුම් බදු සහ රක්ෂණ වාරික බදු

පහත අවස්ථාවන්හි දී හැර ආදායම්, වියදම් සහ වත්කම් හඳුනා ගැනීමේ දී විකුණුම් බදු සහ රක්ෂණ වාරික මත බදු මුදල් හැර ශුද්ධ අගයට හඳුනා ගෙන ඇත.

- වත්කමක් මිලට ගැනීමේ දී හෝ සේවාවක දී ඒ මත ගෙවනු ලබන බදු වටිනාකම ආපසු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් හිලව් කර ගැනීම නොහැකි විටෙක දී එවැනි බදු අදාළ වත්කම් අත් කර ගැනීමේ වියදමෙහි හෝ අදාළ වියදමෙහි කොටස් ලෙස සුදුසු පරිදි හඳුනා ගනු ලබයි.

- ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් දැක්වීමේ දී විකුණුම් වටිනාකම හෝ රක්ෂණ වාරිකවල වටිනාකම අදාළ ගනුදෙනුව මත වන බදු මුදල් ද ඇතුළත් වේ.

විකුණුම් මත හෝ රක්ෂණ වාරික මත ගෙවීමට හෝ ලැබීමට ඇති ශුද්ධ බදු ප්‍රමාණය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති / ලැබීමට ඇති බදු ලෙස මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශවල දක්වා ඇත.

### 2.6.11 විදේශ මුදල් හුවරුව ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදලින් කරන ගණුදෙනු ආරම්භයේ දී වාර්තා කරනුයේ ගණුදෙනුව සිදුවන දිනට පැවති භාවිත විණිමය අනුපාතය ඇනුව වාර්තා ගත කර ඇත.

විදේශ මුදලින් නියෝජනය කෙරෙන මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරනු ලබන දිනට පවත්නා භාවිත විණිමය අනුපාතය පදනම්ව යළි තක්සේරු කරනු ලබයි.

### 2.6.12 විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ වගකීම

#### (අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිත

පාරිතෝෂිත යනු නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකි. 1983 අංක 12 දරණ පාරිතෝෂිත මුදල් ගෙවීම පිළිබඳ පණත අනුව මණ්ඩලය පාරිතෝෂිත ගෙවීමට බැඳී සිටියි. ඒ අනුව වසර 5ක අඛණ්ඩ සේවා කාලයක සපුරා තිබීම මත පමණි. මෙම වගකීම නිරූපනය කිරීම අවසාන වශයෙන් ලැබූ වැටුපෙන් අර්ධය බැගින් සම්පූර්ණ කළ සේවා කාලය මත ගණනය කිරීම කර මූල්‍ය ප්‍රකාශවල දක්වයි. මෙම පාරිතෝෂිත ගණනය කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ''සේවක ප්‍රතිලාභ'' ආයුගනක ගණනය කිරීමේ ක්‍රමයට ගණනය කර නොමැත.

#### (ආ) නිශ්චිත දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ නීති රෙගුලාසීන්ට අනුව කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය ලැබීමට හිමිකම් කියයි. මණ්ඩලය කාර්ය මණ්ඩලයේ දළ වැටුපෙන් නිශ්චිත ප්‍රතිශතයක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වෙයි.

### 2.6.13 අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන් කිරීම්

මණ්ඩලයට වගකීමක් බැඳෙන (නෛතික හෝ වෙනයම් ආකාරයට) අවස්ථාවල දී ඒ සඳහා වෙන් කිරීමක් කරන අතර එය පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් සහ ඒ මත ආර්ථික ප්‍රතිලාභයන් හෝ මුදල් ගලා යාමක් ඇති වන අතර එය සාධාරණ ලෙස ඇස්තමේන්තු කර නිරවුල් කළ යුතු වේ.

මණ්ඩලය මගින් සමහර හෝ සියලුම වෙන් කිරීම් පියවා ගැනිමට බලාපොරොත්තු වන විටදී එම පියවා ගැනීම වෙනමම වත්කමක් ලෙසට හඳුනා ගනු ලබයි. නමුත් ඒ සඳහා පියවා ගනු ලබන මුදල සෑම ආකාරයෙන්ම නිශ්චිත විය යුතු වේ. කිසියම් වෙන් කිරීමක් සඳහා වන වියදම ආදායම් ප්‍රකාශනවල පියවා ගත හැකි මුදල හිලව් කර ශුද්ධ අගයට දක්වා ඇත. මුදලෙහි වර්තමාන වටිනාකම එතරම් ප්‍රමාණාත්මක නොවන විටදී ප්‍රතිපාදන වෙන් කිරීම් පවත්නා බද්දට පෙර අනුපාතය යොදා ගනිමින් වට්ටම් කර වටිනාකමට එළැඹී ඇත. කිසියම් අවස්ථාවක වට්ටම් කිරීම් යොදා ගන්නා විටෙක කාල පමාව නිසා ප්‍රතිපාදන වෙන් කිරීම් ඉහළ යාමක දී එය මූල්‍ය පිරිවැයක් ලෙසට හඳුනා ගනු ලබයි.

සම්පත් ගලා යාම හඳුනා ගැනීමට නොහැකි අවස්ථාවල දී හැර සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙසට අනාවරණය කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

### 2.7 ආදායම හඳුනා ගැනීම

### 2.7.1 දළ වාරික

දළ ලිඛිත රක්ෂණ වාරික සමන්විත වනුයේ ගිණුම් කාලසීමාව තුල ඇතුලත් වූ ගිවිසුම් මගින් සපයන ලද සමස්ත ආවරණ කාල පරිජේදය සඳහා ලැබිය යුතු මුළු වාරිකයන්ගෙනි. ඒවා ඔප්පුව අනුමත කරන ලද දිනයේ දී හඳුනාගනු ලබයි. පෙර ගිණුම් කාල පරිච්ජේදයේ සටහන් කරන ලද ව්‍යාපාර කටයුතු වලට අදාලව ලැබිය යුතු වාරික සඳහා වන ගිණුම් කාලපරිච්ජේදය තුල පැන නැගුනු කවර ගැලපීමක් වුවත් වාරික තුල ඇතුලත් වේ.

නොඉපයූ වාරික යනු වාර්තා කරන දිනයට පසුව අවදානම් කාලයට අදාලව වර්ෂය තුල සටහන් කරන ලද වාරිකවල කොටස්ය. පොදුවේ පිලිගන්නා රක්ෂණ හා ප්‍රතිරක්ෂණ පරිචයන් අනුව දින 365, 1/24 හෝ දළ වාරික පදනම මත 35% අනුපාතයට නොඉපයූ වාරික ගණණය කරයි. පසුකාලීන කාල පරිජේදයන්ට ආරෝපණය කෙරෙන අනුපාත නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදනයක් ලෙස විලම්භනය කෙරේ.

### 2.7.2 ගාස්තු හා අනෙකුත් ආදායම්

ඔප්පු පරිපාලන සේවා ඔප්පු ගාස්තු හා අනෙකුත් ගිවිසුම් ගාස්තු වශයෙන් රක්ෂණ ගිවිසුම් ඔප්පු ලාභීන්ගෙන් ගාස්තු අය කරයි. මෙම ගාස්තු ලිඛිත පදනම මත (අනෙක් ආදායම්) ආදායම ලෙස හඳුනා ගනියි.

### 2.7.3 පොලී ආදායම

හටගන්නා අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශය තුල පොලී ආදායම හඳුනා ගන්නා අතර එය සඵල පොලී අනුපාත ක්‍රමය භාවිත කරමින් ගණනය කරයි.

### 2.8 ප්‍රතිලාභ, හිමිකම් හා වියදම් හඳුනාගැනීම

### 2.8.1 දළ ප්‍රතිලාභ හා හිමිකම්

හිමිකම් ඉල්ලීම සම්බන්ධ ක්‍රියාවලිය හා පියවීමට අදාල අභ්‍යන්තර හා බාහිර හිමිකම් මෙහෙයුම් වලට අදාලව වසර තුල වාර්තා වන සියළු හිමිකම් ඉල්ලීම්, අබලි වටිනාකම් සහ අනෙකුත් අයවීම් සඳහා වන අඩු කිරීමක් සහ පෙර වසර වල හිගව ඇති හිමිකම් සඳහා වන කවර හෝ ගැලපීම් රක්ෂණ හිමිකම් ඉල්ලීම් හි ඇතුලත්වේ.

### 2.8.2 වියදම් හඳුනා ගැනීම

කාර්යක්ෂම ලෙස මණ්ඩලය පවත්වාගෙන යෑම මෙන්ම දේපල පිරියත උපකරණ නඩත්තු කිරීම මගින් හට ගන්නා සියළු වියදම් ශුද්ධ අතිරික්තය මත ආදායමට අයකර ඇත.

### 2.9 සංසන්දනාත්මක දත්ත

ප්‍රවර්ථන වර්ෂයේ ගිණුම්කරන ප්‍රතිපත්ති හා ඉදිරිපත් කිරීම් සඳහා අනුකූලවනසේ අවශ්‍ය පරිදි මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි දක්වා ඇති සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු යලි සඳහන් කර ඇත.

### 2.10 ප්‍රාග්ධන කැපකිරීම්

ශේෂපත්‍ර දිනට කිසිදු ප්‍රාග්ධන කැපකිරීමක් දක්නට නොලැබිනි.

### 2.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

### 2.12 සම්බන්ධිත පාර්ශවකාර ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වල දක්වා ඇති අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු හැරුණුවිට සම්බන්ධිත පාර්ශවකාර ගනුදෙනු සිදුවී නොමැත.

### 2.13 පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම්

සියළු ප්‍රමාණාත්මක පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සලකා බලා ඇති අතර අදාලවන පරිදි ගැලපීම් හෝ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශයේ අදාල සටහන්වල දක්වා ඇත.

### 2.14 අවිනිශ්චිතතා

මණ්ඩලයේ මතය අනුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතු හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලට එරෙහිව දැනට පවත්නා නඩු කටයුතු වාර්තාකර ඇති මූල්‍ය ප්‍රතිපත්තිවලට හෝ මණ්ඩලයේ අනාගත මෙහෙයුම්වලට සැලකියයුතු බලපෑමක් ඇති නොකරයි.

### 2.15 නිකුත්කරන ලද එහෙත් තවමත් බලාත්මක නොවූ ප්‍රමිතීන්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා පහත සඳහන් ප්‍රමිතීන් බලාත්මක නොවූ අතර මණ්ඩලයේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ඒවා අදාල කරගනු නොලැබීය. ඒවායේ බලාත්මක දිනයේ පටන් මූල්‍ය ප්‍රකාශනයන්ට මෙකී ප්‍රමිතීන් මගින් මූල්‍ය බලපෑමක් ඇතිවිය හැකිව තිබිනි.

#### ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මැනීම

නිකුත්කරන ලද ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.9 ශ්‍රී ලං. ගි. ප්‍ර 39 වෙනුවට ආදේශ වීමේ මුල් අදියර පිලිබිඹු කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණයට හා මිනුමට අදාල වෙයි.

මෙම ප්‍රමිතීන් බලාත්මක වුයේ 2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වූ වාර්ෂික කාල පරිච්ජේදයන්ටය.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.9 යොදා ගැනීම මගින් මණ්ඩලයේ මූල්‍ය වත්කම් වර්ගීකරණයට හා තක්සේරු කිරීමට බලපෑමක් ඇතිකරන අතර මණ්ඩලයේ මූල්‍ය වගකීම් වර්ගීකරණය හා තක්සේරු කිරීමට එයින් බලපෑමක් ඇති නොකරයි.

#### ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 - පාරිභෝගිකයින් සමග ඇති ගිවිසුම්වලින් ලැබෙන ආදායම

කොපමණ හා කුමන අවස්ථාවක ආදායම හඳුනාගත යුතුද පිළිබඳව තීරණය කිරීම සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 මගින් විස්තීර්ණ රාමුවක් ස්ථාපිත කරයි.

2018 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාල පරිච්ජේද සඳහා මෙම ප්‍රමිති බලාත්මක වෙයි.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 4 මගින් රක්ෂණ ගිවිසුම්වල විෂය ඉවත්කරන බැවින් මෙම ප්‍රමිතිය මගින් රක්ෂණ ගනුදෙනු සඳහා කිසියම් සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

## 1. ශුද්ධ වාරික

### 1.1 දළ ලිඛිත වාරික

ප්‍රධාන රක්‍ෂණ ව්‍යාපාර පන්තීන්ගෙන් වසර තුල වාරික ආදායම පහත පරිදි වේ.

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ප්‍රතිරක්‍ෂණයෙන් ලද වාරික | 1,737,839,949 | 2,041,207,710 |
| වැව.කැ.කෝ.සි.අ.ත්‍රස්. වාරික | 3,018,417,937 | 2,835,199,980 |
| සාමාන්‍ය රක්‍ෂණය - මෝටර් රථ | 242,090,517 | 142,690,974 |
| සාමාන්‍ය රක්ෂනය - මෝටර් රථ නොවන | 36,599,503 | 22,595,787 |
| වගා රක්‍ෂණ - ගොවීන්ගෙන් ලද වාරික | - | 787,372,981 |
| පාර්ලිමේන්තු සභිකයන් සඳහා වෛද්‍ය රක්‍ෂණය | 27,737,796 | 13,000,000 |
| | 5,062,685,701 | 5,842,067,431 |

| 1.2 අග්‍රහාර වෛද්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා රැස්කල දායක මුදල් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| සාමාජිකයන්ගේ දායකත්වය | 1,236,567,419 | 1,094,899,976 |
| මහා භාණ්ඩාගාරයේ දායකත්වය | 400,000,000 | 400,000,000 |
| | 1,636,567,419 | 1,494,899,976 |

| 2. ගාස්තු හා කොමිස් ආදායම | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ඔප්පු හිමියන්ගේ පරිපාලන ගාස්තු | 6,596,760 | 1,405,900 |
| මුළු ගාස්තු හා කොමිස් ආදායම | 6,596,760 | 1,405,900 |

| 3. අයෝජන හා අනෙකුත් ආදායම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **3.1 ණය සහ ලැබිය යුතු පොලී ආදායම** | | |
| ප්‍රතිමිලදී ගැනුම් පොලී ආදායම | 230,199,663 | 137,565,147 |
| භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම | 88,394,975 | 113,941,967 |
| | 318,594,638 | 251,507,113 |
| **3.2 විකුණුම් සඳහා ඇති ආයෝජන ආදායම** | | |
| භාණ්ඩාගාර බිල්පත් වලින් ලද පොලී ආදායම | 215,631,288 | 136,852,638 |
| භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම | 264,371,922 | 235,715,518 |
| | 480,003,210 | 372,568,155 |
| **3.3 කල්පිරීම සඳහා ඇති - පොලි ආදායම** | | |
| පොලී ආදායම - ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 3,010,646 | - |
| | - | |
| | 3,010,646 | - |
| මුළු ආයෝජන ආදායම | 801,608,493 | 624,075,269 |
| **3.4 අනෙකුත් ආදායම්** | | |
| මෘදු ණය සඳහා පොලී | 3,110,618 | 11,937,931 |
| කාර්ය මණ්ඩල ආපදාණය පොලී | 730,037 | 713,358 |
| වෙනත් | 44,337,661 | 1,783,326 |
| | 48,178,316 | 14,434,616 |
| **මුළු ආදායම** | 849,786,808 | 638,509,884 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| 4. ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **(අ) දල ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම්** | | |
| ප්‍රතිරක්ෂණය | (715,790,744) | (612,666,566) |
| වැව.කැ.කෝ.සි.අ. (SRCC) | (2,967,351) | (80,993,389) |
| සාමාන්‍ය රක්ෂණය - වාහන | (111,147,284) | (83,453,649) |
| සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය සහ අනෙක් | (30,195,877) | (75,560,574) |
| විගා රක්ෂණය | (685,994,044) | (369,304,694) |
| පාර්ලිමේන්තු සභිකයින් සඳහා වෛද්‍ය රක්ෂණ | (19,087,311) | (15,161,878) |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය | (1,661,957,508) | (1,136,128,636) |
| | (3,227,140,119) | (2,373,269,385) |
| **(ආ) ගිවිසුම්ගත වගකීම් හි දල වෙනස** | | |
| ප්‍රතිරක්ෂණය | (527,238,148) | (161,154,770) |
| වැව.කැ.කෝ.සි.අ. හා ත්‍රස්තවාදී | 2,187,114 | 24,096,208 |
| සාමාන්‍ය රක්ෂණය - වාහන | (59,771,021) | (55,715,081) |
| සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය හා අනෙක් | (3,084,534) | 2,236,590 |
| විගා රක්ෂණය | 489,137,093 | (549,398,194) |
| පාර්ලිමේන්තු සභිකයන් සඳහා වෛද්‍ය රක්ෂණ | | |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය | 100,332,409 | (91,995,080) |
| | 1,562,913 | (831,930,326) |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | **(3,225,577,206)** | **(3,205,199,711)** |

| 5. ප්‍රාරක්ෂණය සහ අත්පත් කර ගැනීමේ පිරිවැය | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| අත්පත් කර ගැනීමේ පිරිවැය | (1,001,143,846) | (862,218,789) |
| නොඉපයූ කොමිස් සංචිත වෙනස - වැව.කැ.කෝ.සි.අ. (SRCC) | 10,769,720 | 25,211,540 |
| නොඉපයූ කොමිස් සංචිත වෙනස - ප්‍රතිරක්ෂණ | 43,741,532 | 142,236,991 |
| | (946,632,594) | (694,770,258) |

| 6. අනෙකුත් පරිපාලන හා මෙහෙයුම් වියදම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| විගණකයන්ගේ පාරිශ්‍රමික | 180,000 | 430,000 |
| සේවක ප්‍රතිලාභ වියදම් | 132,494,516 | 84,790,542 |
| පරිපාලන හා ආයතනික වියදම් | 83,592,545 | 77,133,156 |
| විකුණුම් වියදම් | 1,609,680 | 791,355 |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය | 6,579,710 | 8,552,653 |
| නෛතික ගාස්තු | 346,864 | 361,826 |
| පරිත්‍යාග | 709,600 | 859,044 |
| **මුළු අනෙකුත් මෙහෙයුම් පරිපාලන වියදම්** | 225,512,915 | 172,918,575 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| 7. අස්පෘශ්‍ය වත්කම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **පිරිවැය** | | |
| 2015 ජනවාරි 1 දිනට | 6,542,073 | 6,542,073 |
| එකතු කිරීම් | | - |
| 2015 දෙසැම්බර් 31 දිනට | 6,542,073 | 6,542,073 |
| සමුච්චිත ක්‍රමක්ෂය හා අඩුකිරීම | | |
| 2015 ජනවාරි 1 දිනට | 6,542,073 | 6,524,886 |
| ක්‍රමක්ෂය | - | 17,188 |
| 2015 දෙසැම්බර් 31 දිනට | 6,542,073 | 6,542,073 |
| ඉදිරියට ගෙනා ශේෂය | | |
| 2014 දෙසැම්බර් 31 දිනට | - | |
| 2015 දෙසැම්බර් 31 දිනට | - | |

වාර්තා කරන දිනට භාවිතා කෙරෙන පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | 2015 | 2014 |
|---|---|---|
| මෘදුකාංග | 6,542,073 | 6,542,073 |

| 8. දේපල, පිරියත හා උපකරණ<br>ආයතනය | මෝටර් වාහන<br>රු. | කාර්යාල උපකරණ<br>රු. | ලී බඩු හා සවිකිරීම්<br>රු. | විවිධ වත්කම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2015 ජනවාරි 1 දිනට | 34,470,255 | 35,434,098 | 7,604,146 | 23,338 | 77,531,837 |
| එකතු කිරීම් | 157,990 | 3,492,342 | 855,627 | - | 4,505,960 |
| මාරු කිරීම් | - | - | - | - | - |
| බැහැර කිරීම් | - | (2,490,403) | (208,473) | - | (2,698,876) |
| 2015 දෙසැම්බර් 31 දිනට | 34,628,245 | 36,436,037 | 8,251,301 | 23,338 | 79,338,921 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2015 ජනවාරි 1 දිනට | 21,948,956 | 24,529,436 | 4,778,226 | 23,338 | 51,279,956 |
| ක්ෂය | 3,453,608 | 2,507,348 | 618,753 | | 6,579,710 |
| බැහැර කිරීම් | - | (1,468,410) | (118,291) | - | (1,586,701) |
| පෙර වසරේ ගැලපුම් | 45,966 | (9,385,270) | (1,720,537) | - | (11,059,841) |
| 2015 දෙසැම්බර් 31 දිනට | 25,448,530 | 16,183,106 | 3,558,150 | 23,338 | 45,213,124 |
| **ඉදිරියට ගෙනා** | | | | | |
| 2014 දෙසැම්බර් 31 දිනට | 12,521,299 | 10,904,662 | 2,825,920 | - | 26,251,880 |
| 2015 දෙසැම්බර් 31 දිනට | 9,179,714 | 20,252,932 | 4,693,151 | - | 34,125,797 |

**සම්පූර්ණයෙන් ක්ෂය වූ නමුත් පාවිච්චි කරන දේපල පිරියත හා උපකරණ**

සම්පූර්ණයෙන් ක්ෂය වූ එහෙත් වාර්තා කරන දින තෙක් පාවිච්චි කරන දේපල, පිරියත හා උපකරණ වල මූලික පිරිවැය පහත සඳහන් වේ.

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| විවිධ වත්කම් | 23,338 | 23,338 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| 9. මූල්‍ය වත්කම් | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| ණය හා ලැබිය යුතු දෑ | 9.1 | 4,268,076,752 | 3,588,917,799 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | 9.2 | 5,890,404,632 | 5,516,656,080 |
| කල් පිරීමට ඇති මූල්‍ය වත්කම් | 9.3 | 230,491,342 | |
| | | 10,388,972,726 | 9,105,573,879 |

| 9.1 ණය සහ ලැබිය යුතු දෑ | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | | |
| රජයේ රක්ෂණ- ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන | 4,268,076,752 | 2,516,496,974 |
| ලයිස්තුගත නොකල ණයකර | - | 1,072,420,825 |
| ක්‍රමක්ෂය පිරිවැයට මුළු ණය සහ ලැබිය යුතු දෑ | 4,268,076,752 | 3,588,917,799 |

| 9.2 විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් - භාණ්ඩාගාර බැඳුම්කර | 2,898,681,590 | 3,073,152,738 |
| රජයේ සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් | 2,991,723,042 | 2,443,503,342 |
| | 5,890,404,632 | 5,516,656,080 |
| **9.3 කල් ඉකුත් වන මූල්‍ය වත්කම්** | | |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 230,491,342 | - |
| | 230,491,342 | - |

| 10. ලැබිය යුතු වාරික | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| වාරික ලැබිය යුතු : | | |
| සෘජු පාරිභෝගිකයින්ගෙන් | 507,851,102 | 725,145,901 |
| අනෙකුත් | - | 3,462,112 |
| අතරමැදියන් | 553,046,924 | 415,651,021 |
| | 1,060,898,025 | 1,144,259,034 |
| **10.1 සෘජු පාරිභෝගිකයින්ගෙන් ලැබිය යුතු වාරික** | | |
| සාමාන්‍ය රක්ෂණ - වාහන | 39,682,591 | 6,773,856 |
| සාමාන්‍ය රක්ෂණ - වාහන නොවන | 5,033,772 | 2,278,260 |
| ලබාගත් ප්‍රතිරක්ෂණ වාරික | 446,043,246 | 716,093,785 |
| පාර්ලිමේන්තු සභිකයින් ගේ රක්ෂණ | 17,091,493 | - |
| | 507,851,102 | 725,145,901 |
| | | |
| **11. මෑදු ණය** | 129,244,611 | 188,220,907 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| 12. අනෙකුත් මූල්‍ය නොවන වත්කම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| අත්තිකාරම් සහ ගෙවීම් | 4,725,187 | 944,129 |
| ලැබිය යුතු (WHT) රඳවා ගැනීමේ බදු | - | 46,121,820 |
| ආපසු ගෙවන තැන්පතු | 6,780,250 | 8,995,104 |
| කාර්ය මණ්ඩල ආපදා ණය | 17,418,397 | 15,417,086 |
| පෙර ගෙවූ වියදම් | - | - |
| ආර්ථික සේවා කුලී | 2,554,923 | 12,092,199 |
| ලැබිය යුතු හරවා යැවූ චෙක්පත් | 828,681 | 757,982 |
| බඩු තොග | - | 23,060 |
| | 32,307,438 | 84,351,380 |

| 13. විලම්භිත කොමිස් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ජනවාරි 1 දිනට | 366,621,700 | 199,173,169 |
| වසර තුල ප්‍රතිපාදන / (නිදහස් කිරීම) | 54,511,252 | 167,448,531 |
| දෙසැම්බර් 31 දිනට | 421,132,952 | 366,621,700 |

| 14. මුදල් හා මුදල් සමාන දෑ | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| සුළු මුදල් | 159,002 | 130,270 |
| බැංකුවේ ඇති මුදල් | 166,626,330 | 277,966,643 |
| අතැති හා බැංකුවේ ඇති මුදල් | 166,785,332 | 278,096,913 |
| බැංකු අයිරාවය | - | (21,303,927) |
| මුදල් හා මුදල් සමාන දෑ | 166,785,332 | 256,792,986 |

| 15. අනෙකුත් වගකීම් | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| අනෙකුත් මූල්‍ය වගකීම් | 15.1 | 193,756,079 | 118,675,128 |
| අනෙකුත් මූල්‍ය නොවන වගකීම් | 15.2 | 109,826,918 | 78,738,047 |
| | | 303,582,998 | 197,413,174 |

| 15.1 අනෙකුත් මූල්‍ය වගකීම් | 2015 | 2014 |
|---|---|---|
| හිමිකම් චෙක්පත් / හරවා එවූ ගෙවිය යුතු SLIPS | 5,369,830 | 3,261,680 |
| කල්තබා රැස්කල මෝටර් වාරික | 29,328,516 | 45,260,626 |
| ගෙවිය යුතු කොමිස් - ප්‍රතිරක්ෂණ | 56,796,368 | - |
| වාර්ෂික ගාස්තු හා ගෙවිය යුතු සෙස් බදු | 28,431,933 | |
| නැවත ගෙවිය යුතු වාරික | 53,670,950 | 61,928,872 |
| උපචිත වියදම් | 7,838,761 | 5,284,964 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 12,319,721 | 2,938,985 |
| | 193,756,079 | 118,675,128 |

| 15.2 අනෙකුත් මූල්‍ය නොවන වගකීම් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| රජයේ බදු | 109,826,918 | 78,738,047 |
| | 109,826,918 | 78,738,047 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

**16. තොරතුරු බණ්ඩනය**

ඉහත කාණ්ඩ වල ප්‍රාරක්ෂණ ප්‍රතිඵලයන්හි දළ ලිඛිත වාරික පහත වේ.

| වාරික | මෝටර් වාහන රු. | මෝටර් වාහන නොවන රු. | ප්‍රතිරක්ෂණ රු. | 2015 වැ..කැ.කෝ. සි.අ.තු.ක්‍රි අ රු. | සෞඛ්‍ය රක්ෂණ අග්‍රහාර/පා.ම. | කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| දළ ලිඛිත වාරික | 242,090,517 | 36,599,503 | 1,737,839,949 | 3,018,417,937 | 27,737,796 | - | 5,062,685,701 |
| අග්‍රහාර සඳහා දායක මුදල් | - | - | - | - | 1,636,567,419 | 1,259,134,207 | 1,636,567,419 |
| එකතු කල වගා රක්ෂණ බදු | - | - | - | - | - | - | 1,259,134,207 |
| ප්‍රතිරක්ෂණ වාරික | - | - | - | - | - | - | - |
| **ශුද්ධ ලිඛිත වාරික** | **242,090,517** | **36,599,503** | **1,737,839,949** | **3,018,417,937** | **1,664,305,215** | **1,259,134,207** | **7,958,387,326** |
| නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස්වීම් | (2,439,987) | (15,487,569) | 106,178,717 | (103,788,426) | (11,364,384) | - | (26,901,647) |
| **ශුද්ධ වාරික ඉපයුම් (අ)** | **239,650,530** | **21,111,934** | **1,844,018,666** | **2,914,629,511** | **1,652,940,831** | **1,259,134,207** | **7,931,485,679** |
| ගාස්තු ආදායම | 6,557,392 | 39,368 | - | - | - | - | 6,596,760 |
| **මුළු ප්‍රාරක්ෂණ ආදායම (අ+ආ+ඇ)** | **246,207,921** | **21,151,302** | **1,844,018,666** | **2,914,629,511** | **1,652,940,831** | **1,259,134,207** | **7,938,082,439** |
| අත්පත් කර ගැනීමේ පිරිවැය | - | - | (487,625,676) | (459,006,918) | - | - | (946,632,594) |
| විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය වෙනස | - | | | | | | |
| **ශුද්ධ අත්පත්කර ගැනීමේ පිරිවැය** | **-** | **-** | **(487,625,676)** | **(459,006,918)** | **-** | **-** | **(946,632,594)** |

| | මෝටර් වාහන රු. | මෝටර්වාහන නොවන රු. | ප්‍රතිරක්ෂණ රු. | 2015 වැව.කැ.කෝ. සි.අ.තු.ක්‍රි අ රු. | සෞඛ්‍යරක්ෂණ අග්‍රහාර/පා.ම. | කෘෂිරක්ෂණ යෝජනා ක්‍රමය | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| ගෙවූ දළ හිමිකම් | (170,918,305) | (33,280,411) | (1,243,028,893) | (780,236) | (1,580,712,410) | (196,856,951) | (3,225,577,206) |
| ප්‍රතිරක්ෂණ අය කිරීම් | - | - | - | - | - | - | - |
| **ගෙවූ ශුද්ධ හිමිකම්** | (170,918,305) | (33,280,411) | (1,243,028,893) | (780,236) | (1,580,712,410) | (196,856,951) | (3,225,577,206) |
| ගෙවිය යුතු හිමිකම් සඳහා වන සංචිතයේ වෙනස | - | - | | | | | |
| අනෙක් කාර්මික සංචිතයන්හි දල වෙනස - IBNR | - | - | | | | | |
| අනෙක් කාර්මික සංචිතයන්හි වෙනසේ ප්‍රතිරක්ෂණ කොටස - IBNR | - | - | | | | | |
| ශුද්ධ හිමිකම් (ඉ) | (170,918,305) | (33,280,411) | (1,243,028,893) | (780,236) | (1,580,712,410) | (196,856,951) | (3,225,577,206) |
| පරිපාලන වියදම් (ඊ) | (39,506,918) | (9,876,729) | (19,753,459) | (27,978,326) | (118,520,753) | (9,876,729) | (225,512,914) |
| **මුළු ප්‍රාරක්ෂණ වියදම් (ඈ+ඉ+ඊ)** | (210,425,223) | (43,157,140) | (1,750,408,028) | (487,765,481) | (1,699,233,163) | (206,733,680) | (4,397,722,715) |
| **ප්‍රාරක්ෂණ ප්‍රතිඵලය** | 35,782,698 | (22,005,838) | 93,610,638 | 2,426,864,030 | (46,292,332) | 1,052,400,526 | 3,540,359,724 |
| වසර සඳහා අයෝජන හා අනෙක් ආදායම් | 55,803,559 | 6,554,957 | 209,806,082 | 553,547,822 | 3,331,735 | 20,742,654 | 849,786,808 |
| **බදු පෙර ලාභය** | 91,586,258 | (15,450,881) | 303,416,720 | 2,980,411,852 | (42,960,597) | 1,073,143,180 | 4,390,146,532 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

## 17 රක්ෂණ ගිවිසුම් වගකීම්

| (අ) රක්ෂණ ප්‍රතිපාදන | සටහන් | 2015<br>රථවාහන ගිවිසුම් වගකීම්<br>රු. | රථවාහන නොවන ගිවිසුම් වගකීම්<br>රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම්<br>රු. | වැ. කැ.කෝ.සි.අ ගිවිසුම් වගකීම්<br>රු. | භෝග රක්ෂණ ගිවිසුම් වගකීම්<br>රු. | අග්‍රහාර ගිවිසුම් වගකීම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ඔප්පු හිමියන් විසින් වාර්තාකර ඇති හිමිකම් සඳහා ප්‍රතිපාදන | - | - | - | | | | | |
| වාර්ක සඳහා ප්‍රතිපාදන - IBNR | - | - | - | | | | | |
| නොගෙවූ වාර්ක සඳහා ප්‍රතිපාදන | 18.1 | 128,991,910 | 3,084,534 | 774,923,902 | 39,324,019 | 65,000,000 | 91,045,492 | 1,102,369,856 |
| නොඉපයූ වාර්ක සඳහා ප්‍රතිපාදන | 18.2 | 72,053,269 | 20,919,792 | 608,243,982 | 1,442,962,833 | 11,364,384 | - | 2,155,544,260 |
| මුළු රක්ෂණ ගිවිසුම් වගකීම් | | 201,045,179 | 24,004,326 | 1,383,167,884 | 1,482,286,852 | 76,364,384 | 91,045,492 | 3,257,914,116 |

| (ආ) තාක්ෂණික ප්‍රතිපාදන | සටහන් | 2015<br>රථවාහන ගිවිසුම් වගකීම්<br>රු. | රථවාහන නොවන ගිවිසුම් වගකීම්<br>රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම්<br>රු. | වැ. කැ.කෝ.සි.අ ගිවිසුම් වගකීම්<br>රු. | භෝග රක්ෂණ ගිවිසුම් වගකීම්<br>රු. | අග්‍රහාර ගිවිසුම් වගකීම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ඔප්පු හිමියන් විසින් වාර්තාකර ඇති හිමිකම් සඳහා ප්‍රතිපාදන | - | - | - | | | | | |
| වාර්ක සඳහා ප්‍රතිපාදන - IBNR | - | - | - | | | | | |
| නොගෙවූ වාර්ක සඳහා ප්‍රතිපාදන | 18.1 | 128,991,910 | 3,084,534 | 774,923,902 | 39,324,019 | 65,000,000 | 91,045,492 | 1,102,369,856 |
| නොඉපයූ වාර්ක සඳහා ප්‍රතිපාදන | 18.2 | 72,053,269 | 20,919,792 | 608,243,982 | 1,442,962,833 | 11,364,384 | - | 2,155,544,260 |
| මුළු රක්ෂණ ගිවිසුම් වගකීම් | | 201,045,179 | 24,004,326 | 1,383,167,884 | 1,482,286,852 | 76,364,384 | 91,045,492 | 3,257,914,116 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

**17.1 ගෙවිය යුතු හිමිකම් සඳහා ප්‍රතිපාදන**

| | සටහන් | 2015 රථවාහන ගිවිසුම් වගකීම් රු. | රථවාහන නොවන ගිවිසුම් වගකීම් රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම් රු. | වැ.කැ.කෝ.සි.අ ගිවිසුම් වගකීම් රු. | භෝග රක්ෂණ ගිවිසුම් වගකීම් රු. | අග්‍රහාර ගිවිසුම් වගකීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 1 දිනට | | 69,220,888 | - | 247,685,753 | 49,195,097 | 554,137,093 | 191,377,901 | 1,111,616,732 |
| ප්‍රතිපාදන වැඩිවීම / (අඩුවීම) | | 59,771,021 | 3,084,534 | 527,238,148 | (9,871,078) | (489,137,093) | (100,332,409) | (9,246,876) |
| දෙසැම්බර් 31 දිනට | | 128,991,910 | 3,084,534 | 774,923,902 | 39,324,019 | 65,000,000 | 91,045,492 | 1,102,369,856 |

**17.2 ගෙවිය යුතු හිමිකම් සඳහා ප්‍රතිපාදන**

| | සටහන් | 2015 රථවාහන ගිවිසුම් වගකීම් රු. | රථවාහන නොවන ගිවිසුම් වගකීම් රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම් රු. | වැ.කැ.කෝ.සි.අ ගිවිසුම් වගකීම් රු. | පාර්ලිමේන්තු සාමාජිකයින්ගේ ගිවිසුම් වගකීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 1 දිනට | | 69,613,282 | 5,432,223 | 714,422,699 | 1,339,174,408 | - | 2,128,642,612 |
| | | - | - | - | | | |
| වර්ෂය තුල නොඉපයූ වාරික | | 2,439,987 | 15,487,569 | (106,178,717) | 103,788,426 | 11,364,384 | 26,901,648 |
| දෙසැම්බර් 31 දිනට | | 72,053,269 | 20,919,792 | 608,243,982 | 1,442,962,833 | 11,364,384 | 2,155,544,260 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

## 18. අවදානම් කළමනාකරනය

### 18.1 හැඳින්වීම

මණ්ඩලය අලාභයන්ට මුහුණ දීම අවම කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග අවදානම් කළමනාකරනය මගින් විද්‍යමාන වේ. මණ්ඩලය පහත සඳහන් අවදානම් සඳහා නිරාවරණය වෙයි.

| | |
|---|---|
| **රක්ෂණ අවදානම** | ජීවිත නොවන රක්ෂණ හා ලැබෙන ප්‍රතිරක්ෂණ |
| | ගිවිසුම් ප්‍රතිරක්ෂණය |
| **මූල්‍ය අවදානම** | වෙළඳපළ අවදානම |
| | ද්‍රවශීලතා අවදානම |
| | ණය අවදානම |
| | මෙහෙයුම් අවදානම |

### රක්ෂණ හා මූල්‍ය අවදානම

#### (අ) රක්ෂණ අවදානම

රක්ෂණ ගිවිසුම් යටතේ මණ්ඩලය මුහුණ දෙන ප්‍රධාන අවදානම වන්නේ සත්‍ය හිමිකම් ඉල්ලීම හා ප්‍රතිලාභ ගෙවීම් හෝ ඒවායේ කාලය අපේක්ෂා කරන මට්ටමට වඩා වෙනස් වීමයි. නිතර නිතර ඉල්ලීම් ඉදිරිපත් වන තත්ත්වය සහ ඉල්ලීම් වල බරපතලකම සහ ගෙවනු ලබන සත්‍ය ප්‍රතිලාභයන් මීට බලපායි. එහෙයින් මණ්ඩලයේ අරමුණ වනුයේ මෙකී වගකීම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් සංචිත පවත්වා ගැනීමට කටයුතු කිරීමයි.

රක්ෂණ ගිවිසුම් විශාල සංඛ්‍යාවක් හරහා විවිධාංගීකරණය මගින් මේ අවදානම් තත්ත්වය අවම කරනු ලබයි. සැලකිලිමත් තෝරා ගැනීම සහ ප්‍රාරක්ෂණ උපාය මාර්ගෝපදේශයන් මගින් අවදානම් විචලනය ද පාලනය කරයි.

මණ්ඩලය මූලික වශයෙන් මෝටර් වාහන, සමුද්‍ර උවදුරු, ගිනි, ඉංජිනේරු හා විවිධ රක්ෂණ වර්ග වැනි සාමාන්‍ය රක්ෂණ වර්ග නිකුත් කරයි. සෞඛ්‍ය රකෂණය මගින් ඔප්පු හිමියන් සඳහා වෛද්‍ය වියදම් ආවරණ සපයයි. රකෂණ ඔප්පු යටතේ වන අවදානම සාමාන්‍යයෙන් මාස දොළහක කාලකයට ආවරණ සපයයි.

ලබාගන්නා ප්‍රතිරක්ෂණයන් ඇතුළු සාමාන්‍ය රක්ෂණයන් සඳහා වඩාත් ම කැපීපෙනෙන අවදානම පැන නගිනුයේ කාලගුණික වෙනස්කම්, ස්වභාවික විපත් සහ ත්‍රස්තවාදී ක්‍රියා මගිනි. පියවීම සඳහා සැලකිය යුතු දීර්ඝකාලයක් ගතවන හිමිකම් සඳහා උද්ධමන අවදානමක් ද පවතී. සෞඛ්‍ය රකෂණ ගිවිසුම් සඳහා වඩාත්ම වැදගත් අවදානම පැන නගින්නේ ජීවන රටාවේ වෙනස්කම්, වසංගත සහ වෛද්‍ය මෙන්ම තාක්ෂණයේ ද ඇතිවන දියුණුව මගිනි.

මණ්ඩලය විසින් රක්ෂණය කරනු ලබන අවදානමේ පිහිටීම, කර්මාන්තය විසින් රක්ෂණය කරනු ලබන අවදානම් වර්ගය අනුව අවදානම් වල කැපී පෙනෙන වෙනසක් නොමැත.

රක්ෂණ ගිවිසුම් විශාල සංඛ්‍යාවක් මගින් විවිධාංගීකරණය කිරීම හරහා ඉහත සඳහන් අවදානම් නිරාවරණය අවම කරගනී. රක්ෂිත ප්‍රතිලාභ මට්ටම හා අවදානම් වර්ගය අනුව අවදානම් විවිධාංගීකරණයට ලක්වන බවට සහතික වන සේ නිර්මාණය කර ඇති ප්‍රතිරක්ෂණ උපායමාරගයන් ක්‍රියාත්මක කිරීම මගින් සහ සැලකිලිමත් තෝරා ගැනීම මගින් අවදානම් විචලනය ද පාලනය කරනු ලබයි. කර්මාන්ත අංශයන් හි විවිධාංගීකරණය හරහා විශාල වශයෙන් මෙය ලඟාකර ගනී. තවද මණ්ඩලය නිරාවරණය විය හැකි අවදානම් අවම කරනු පිණිස අලුත් සහ දැනට පවත්නා සියළුම හිමිකම් ඉල්ලීම් තක්සේරු කිරීම පිණිස හිමිකම් සමාලෝචනය සඳහා දැඩි ප්‍රතිපත්ති හිමිකම් ඉල්ලීම සඳහා කටයුතු කරන පර්‍යාම් පිළිබඳ දිනපතා සවිස්තරාත්මක සමාලෝචන, වියහැකි වංචා සඳහා වන නිරන්තර විමර්ෂණ වලට අදාල ප්‍රතිපත්ති හා පටිපාටි නිසි පරිදි යොදාගැනේ. ව්‍යාපාරය සඳහා නිශේධාත්මක ලෙස බලපෑ හැකි කල්තබා කිව නොහැකි තත්ත්වයන්ට මණ්ඩලය ගොදුරු වීම අවම කිරීම පිණිස මණ්ඩලය තවදුරටත් හිමිකම් ඉල්ලීම් සක්‍රියව කළමනාකරනය කිරීම පිණිස සහ කඩිනම් පසු විපරම් කිරීමට අදාලව ප්‍රතිපත්තියක් බලාත්මක කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

කළමනාකාරීත්වයේ තීරණ මත මණ්ඩලය මගින් අවදානම් අවම කර ගැනීමේ අරමුණින් ආයතන ප්‍රාරක්ෂණ ක්‍රම උපායයන් මගින් ඇති විය හැකි අවදානම් අවම කර ගනු ලබයි.

**හිමිකම් ඉල්ලීම් නිරතුරු ඉදිරිපත්වීම හා ඒවායේ තීව්‍රභාවය**

හිමිකම් ඉල්ලීම් නිරතුරු ඉදිරිපත්වීම හා ඒවායේ බරපතලකම සාධක කිහිපයක් මත රඳා පවතියි. මණ්ලඩය ප්‍රධාන වශයෙන් දේපළ, ඉංජිනේරුමය, මෝටර් රථ, විවිධ අනතුරු, නාවික, වෛද්‍ය සහ පුද්ගල අනතුරු වර්ගයන් සඳහා ප්‍රාරක්ෂණය කරනු ලබයි. මෙවැනි රක්ෂණ වර්ගයන් සාමාන්‍යයෙන් කෙටිකාලීන රක්ෂණ ගිවිසුම් වේ. මේවායෙහි හානි ප්‍රතිපූර්ණයන් සඳහා වන්දි ගෙවීම් සාමාන්‍යයෙන් කෙටිකාල පරාසයක් තුළ සිදු වේ. මෙය රක්ෂණ අවදානම අඩු කිරීමට හේතු වේ.

**දේපල**

දේපල රක්ෂණ ගිවිසුම්වලට අදාළව ප්‍රධාන කාණ්ඩය වනුයේ ගිනි රක්ෂණය වේ. ඊට අනුරූපව එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරික කටයුතු අඩපන වීම ද ඇතුළත් වේ.

මෙම ගිවිසුම් යළි ස්ථාපන කිරීම් වටිනාකම හෝ හානි ප්‍රතිපූර්ණ පදනමින් ප්‍රාරක්ෂණය කිරීමක් සිදු කරයි. හානියට පත් දේපල යළි ගොඩනැගීම හෝ අළුත්වැඩියා කිරීමට යන වියදම ඒ දේපල පෙර තිබූ තත්ත්වයට පත් කිරීමට ගත වන කාලය හා ඒ තුළ ව්‍යාපාරික කටයුතු අඩාල වීම යන කරුණු ආවරණය වන පරිදි හානි පූර්ණ වන්දි ඉල්ලීම් කරයි.

**ඉංජිනේරු**

ඉංජිනේරු රක්ෂණ කොන්ත්‍රාත්වල ප්‍රධාන අංගයක් වනුයේ රක්ෂණ ව්‍යාපෘතියට හානිවීම හෝ පාඩු සිදු වීම එහි ප්‍රතිඵලයක් ලෙස තුන්වන පාර්ශවයීය වගකීම්, පාඩු හෝ රක්ෂිත පිරියත දේපල හා උපකරණවලට හානි සිදුවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙසට ව්‍යාපාර කටයුතු ඇන හිටීම හා පාඩු සිදුවීම ද ඇතුළත් වේ. අලාභයේ හෝ හානියේ තරම අනුව ඉල්ලීම් ඉදිරිපත් වන හානිය වෙනස් වෙයි.

**මෝටර් වාහන**

මෝටර් වාහන රක්ෂණ ගිවිසුමක දී ප්‍රධාන අවදානම් හට ගැනීම වනුයේ මරණයට පත්වීම හෝ ශාරීරික හානි හා තුන්වන පාර්ශ්වයේ දේපල හානි ද ඇතුළත්ව රක්ෂිත වාහනයට සිදුවන අලාභයන් වේ. මරණයක දී හෝ ශරීර හානියක දී ලැබිය හැකි උසාවි නියෝග හා පාර්ශ්වකරුවන්ට සිදු වී ඇති හානියේ තරම අනුව හානි පූර්ණ වන්දිය තීරණය වේ.

**විවිධ අනතුරු**

විවිධ අනතුරු රක්ෂණයේ දී මුදල් නැති වීම, සේවක විශ්වාසය කඩකිරීම, පුද්ගල අනතුරු, සේවක වන්දි ගෙවීම්, විදේශ ගමන්, සාමාන්‍ය තුන්වන පාර්ශව වගකීම හා වෘත්තීයමය වගකීමෙන් මිදීම වැනි දෑ සම්බන්ධයෙන් හදිසි අනතුරු රක්ෂණ පන්තිය යටතේ ප්‍රාරක්ෂණය සිදුකරයි.

අලාභයේ හෝ හානියේ තරම අනුව අපේක්ෂිත උසාවි නියෝග අනුව වගකීම් කාණ්ඩ හා වන්දි ප්‍රමාණය තීරණය කිරීමට විවිධ හේතු බලපායි.

**මුහුදු රක්ෂණය**

මුහුදු රක්ෂණයේ දී ප්‍රධාන අවදානම් සාධකය වනුයේ සම්පූර්ණ හෝ කොටසක් වශයෙන් හිමිකම් අහිමිවීමට හේතුවන පාඩු හෝ රක්ෂිත භාණ්වලට හා යාත්‍රාවට හානි සිදුවීමයි. හිමිකම් ඉල්ලීම් වල ප්‍රමාණයට බලපාන ප්‍රධාන සාධකය වන්නේ පාඩුවේ හෝ හානියේ ප්‍රමාණයයි.

**වෛද්‍ය හා පුද්ගල අනතුරු**

වෛද්‍ය රක්ෂණයට අදාළ ප්‍රධාන අවදානම් වන්නේ ලෙඩ රෝග හා අනතුරු තත්ත්වයන් ඊට අදාල සෞඛ්‍ය පිරිවැයයි. පුද්ගල අනතුරුවලට අදාළව ප්‍රධාන අවදානම් නම් මරණය හෝ ස්ථිර හෝ අර්ධ දුබලතා තත්වයන් වෙනුවෙන් පැන නගින හිමිකම් ඉල්ලීම් වේ.

**භූගෝලීය තත්ත්වයන් මත අවදානම**

රක්ෂණ ගිවිසුම් මගින් පැන නගින රක්ෂණ අවදානම ශ්‍රී ලංකාව තුල ප්‍රධාන වශයෙන් අවධානයට ලක් කෙරේ.

**(ආ) මූල්‍ය අවදානම**

**I. ණය අවදානම**

ණය අවදානම වනුයේ මූල්‍ය උපකරණයකට අදාළව එක් පාර්ශවයක් මගින් සිය වගකීම ඉටු නොකරන තත්ත්වයක් මත අනෙක් පාර්ශ්වයට වන්දි ගෙවීමට සිදු වීමයි.

පහත ක්‍රියාවලින් / ක්‍රියාකාරකම් මගින් මූල්‍ය උපකරණවල ණය අවදාම අඩු කරනු ලබයි.

- මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා මඟපෙන්වීම් මගින් ඇති කර ඇති ණය අවදානම් ප්‍රතිපත්තිය. මෙම නිරාවරණය වීම රජයේ සුරැකුම්පත් සඳහා පමණක් සීමා වී පවතියි.
- මණ්ඩලයේ නිරන්තර සමාලෝචනය මගින් ද ණය අවදානම අවම වී ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

**19. රක්ෂණ සහ මූල්‍ය අවදානම**

**ලැබිය යුතු වාරික**

සියලුම වෙළඳ ණය මෙහෙයුම් අංශ මගින් අඛණ්ඩ පදනමකින් සුපරීක්ෂණය කරනු ලබයි.

වාර්තා කරනු ලබන දිනට ණය අවදානම සඳහා උපරිම නිරාවරණය වීම පහත පරිදි වේ.

| | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| ණය හා ලැබිය යුතු දෑ | 9.1 | 4,268,076,752 | 3,588,917,799 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | 9.2 | 5,890,404,632 | 5,516,656,080 |
| ලැබිය යුතු වාරික | 10 | 1,060,898,025 | 1,144,259,034 |
| මෘදු ණය | 11 | 129,244,611 | 188,220,907 |
| අත ඉතිරි මුදල් සහ බැංකු ශේෂය | 14 | 166,785,332 | 256,792,986 |
| | | 11,515,409,353 | 10,694,846,806 |

**(ආ) ද්‍රවශීලතා අවදානම**

මූල්‍ය උපකරණයන් හා සම්බන්ධිත වගකීම නිරවුල් කිරීම සඳහා මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් අතැතිව සිටීම මගින් ඉදිරිපත් වන මූල්‍ය වගකීම් නිරවුල් කිරීමට නොහැකිවීම පිළිබඳව ඇති අවදානම ද්‍රවශීලතා අවදානම නම් වෙයි.

ද්‍රවශීලතා අවශ්‍යතාවන් මාසික පදනමින් සුපරීක්ෂණය කරනු ලබන අතර ඒ තුළින් කළමනාකාරීත්වය මගින් පැන නගින ඕනෑම වගකීමක් නිරවුල් කිරීමට ප්‍රමාණවත් අරමුදල් රඳවා ගැනීමක් අරමුණු කරයි.

පහත ප්‍රතිපත්තීන් හා ක්‍රියාපිළිවෙත් මගින් මණ්ඩලය නිරාවරණය වන ද්‍රවශීලතා අවදානම අඩු කර ගැනීමක් අපේක්ෂා කරයි.

* ද්‍රවශීලතා අවශ්‍යතාව මාසික පදනමින් සුපරීක්ෂණය කිරීම සහ ඒ තුළින් කළමනාකාරීත්වය පැන නගින ඕනෑම වගකීමක් නිදහස් කිරීමට ද්‍රවශීල අරමුදල් රඳවා ගැනීමක් අපේක්ෂා කරයි.

* හදිසි අරමුදල් අවශ්‍යතා ආවරණය කිරීම සඳහා හදිසි අරමුදල් සැලසුමක් ක්‍රියාත්මක කරනු ලබයි.

**(ඇ) වෙළඳපොළ අවදානම**

වෙළඳපොළ මිල මට්ටම් වෙනස්වීම, විදේශ විනිමය අනුපාත වෙනස්වීම සහ පොළී අනුපාත වෙනස්වීම වැනි තත්ත්වයන් තුළ මණ්ඩලයේ ආදායම හෝ මූල්‍ය වත්කම්වල අගය වෙනස්වීම පිළිබඳ අවදානම වෙළඳපොළ අවදානම නම් වෙයි. මෙම වෙළඳපොළ අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ උපරිම ප්‍රතිලාභයක් ලබා ගන්නා අතරම පිළිගත හැකි සීමාවන් තුළ වෙළඳපොළ අවදානම් සඳහා නිරාවරණය වීමයි.

**අ පොළී අනුපාත අවදානම**

වෙළඳපොළ පොළී අනුපාතය වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය උපකරණයන් මගින් උත්පාදනය කරනු ලබන අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම වෙනස්වීමට ඇති අවදානම පොළී අනුපාත පිළිබඳ අවදානම නම් වෙයි. පාවෙන අනුපාත උපකරණයන් මෙම මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම නිරාවරණය වන උපකරණ වන අතර, ස්ථිර පොළී අනුපාත සහිත උපකරණයන් සාධාරණ අගය පිළිබඳ පොළී අනුපාත අවදානමට නිරාවරණය වෙයි. මණ්ඩලය ස්ථිර පොළී අනුපාත යටතේ රජයේ සුරැකුම්වල ආයෝජනය කර ඇත. ඒ හේතුවෙන් වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීම තුලින් විශාල අවදානමක් ඇතිවීම වළක්වා ගෙන ඇත.

**ආ විදේශ විනිමය අවදානම**

විදේශ විනිමය අනුපාතයෙහි ඇති වන වෙස්කම් නිසා මූල්‍ය උපකරණයන්ගේ වටිනාකම් වෙනස්වීම පිළිබඳව ඇති අවදානම විදේශ විනිමය අවදානම නම් වේ. මෙම අවදානමට මණ්ඩලය මුහුණ දෙන්න එය විදේශ විනිමය යොදා ගනිමින් අනෙකුත් රක්ෂකයින් සමඟ කරනු ලබන අන්තර්ජාත්‍ය ප්‍රතිරක්ෂණ ව්‍යාපාරික කටයුතුවල දීය.

කළමනාකාරීත්වයේ විශ්වාසයේ හැටියට විදේශ විනිමය අනුපාතයන්ගේ උච්චාවචනය මත සැලකිය යුතු අවදානම් හට ගැනීම අවම කරගෙන ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙසට මණ්ඩලය සිය විදේශ විනිමය නිරාවරණය වීමේ රටාව ද වෙනසක් සිදු නොකරයි.

# දස වසරක දැක්ම

මූල්‍ය කාර්ය සාධනය
දෙසැම්බර් 31න් අවසන් වර්ෂ සඳහා

| | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම්** | | | | | | | | | | |
| ඉපයූ ශුද්ධ වාරික ආදායම | 7,931,485,679 | 8,015,628,345 | 5,452,318,662 | 3,886,183,341 | 3,606,365,031 | 3,926,469,856 | 4,019,486,220 | 3,427,950,662 | 2,654,902,681 | 318,902,642 |
| **ප්‍රතිලාභ, පාඩු හා වියදම්** | | | | | | | | | | |
| රක්ෂණ හිමිකම් හා ප්‍රතිලාභ ගෙවීම් | (4,172,209,800) | (3,899,969,969) | (1,763,476,689) | (2,281,470,751) | (1,879,486,696) | (2,292,072,983) | (2,075,936,806) | (1,736,355,732) | (1,423,044,038) | (242,465,993) |
| | 3,759,275,879 | 4,115,658,376 | 3,688,841,974 | 1,604,712,590 | 1,726,878,335 | 1,634,396,873 | 1,943,549,415 | 1,691,594,930 | 1,231,858,643 | 76,436,649 |
| **වෙනත් ආදායම්** | | | | | | | | | | |
| ආයෝජන ආදායම් | 801,608,493 | 624,075,269 | 691,492,020 | 615,813,544 | 723,412,241 | 798,117,037 | 1,364,459,074 | 1,205,463,441 | 528,264,787 | |
| මෘදු ණය මත පොළී | 3,110,618 | 11,937,931 | 5,915,955 | 7,278,316 | 10,163,846 | 16,982,331 | 15,125,027 | 19,424,829 | 38,713,576 | |
| වෙනත් ආදායම් | 51,664,458 | 3,902,584 | 4,165,001 | 18,886,182 | 743,614 | 1,006,353 | 471,787 | 917,841 | | |
| | 856,383,568 | 639,915,784 | 701,572,977 | 641,978,043 | 734,319,701 | 816,105,721 | 1,380,055,889 | 1,225,806,111 | 1,798,837,006 | 76,436,649 |
| **වියදම්** | | | | | | | | | | |
| කාර්යාල මණ්ඩලය සම්බන්ධ පිරිවැය | 132,494,516 | 84,790,542 | 76,487,490 | 72,006,709 | 52,769,174 | 42,326,032 | 33,124,615 | 21,470,147 | 11,500,953 | 1,333,806 |
| පරිපාලන වියදම් | 93,018,399 | 86,907,163 | 64,621,143 | 74,402,484 | 72,147,229 | 45,136,006 | 49,246,381 | 28,264,346 | 14,142,950 | 1,508,940 |
| මූල්‍ය හා වෙනත් වියදම් | - | 1,220,870 | 8,459,075 | 17,258,273 | 21,581,925 | 32,425,697 | 38,401,103 | 5,380,035 | 3,385,205 | 138,170 |
| **මුළු වියදම්** | 225,512,915 | 172,918,575 | 149,567,708 | 163,667,466 | 146,498,329 | 119,887,735 | 120,772,099 | 55,114,528 | 29,029,109 | 2,980,916 |
| **බදු ගෙවීම්** | | | | | 108,349,446 | | | | | |
| **වියදම ඉක්ම වූ ආදායම** | 4,390,146,532 | 4,582,655,585 | 4,240,847,242 | 2,083,023,166 | 2,206,350,261 | 2,330,614,859 | 3,202,833,203 | 2,862,286,514 | 1,769,807,897 | 73,455,733 |

# දස වසරක දැක්ම

මූල්‍ය තත්වය
දෙසැම්බර් 31 දිනට

| වත්කම් | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 34,125,797 | 26,251,881 | 19,317,968 | 24,739,202 | 29,606,877 | 36,096,011 | 43,603,504 | 44,659,781 | 25,240,465 | 1,461,388 |
| මූල්‍ය උපකරණ | 10,388,972,726 | 9,105,573,879 | 6,667,518,021 | 5,375,914,672 | 4,444,546,262 | 5,574,107,464 | 8,550,206,721 | 7,749,178,616 | 5,449,343,240 | |
| | 10,423,098,523 | 9,131,825,761 | 6,686,855,988 | 5,400,653,874 | 4,474,153,140 | 5,610,203,475 | 8,593,810,225 | 7,793,838,397 | 5,474,583,705 | 1,461,388 |
| ජංගම වත්කම් | | | | | | | | | | |
| ලැබිය යුතු දෑ | 1,222,450,075 | 1,416,831,322 | 1,686,049,990 | 1,664,647,836 | 1,927,814,565 | 1,945,815,895 | 2,079,570,419 | 1,988,501,988 | 2,221,955,826 | 511,844,970 |
| මුදල් හා මුදලට සමාන දෑ | 166,785,332 | 278,096,913 | 305,495,813 | 103,641,397 | 3,542,969,945 | 3,594,104,553 | 110,173,003 | 239,795,258 | 560,259,122 | 13,357,202 |
| | 1,389,235,407 | 1,694,928,235 | 1,991,545,803 | 1,768,289,233 | 5,470,784,510 | 5,539,920,448 | 2,189,743,421 | 2,228,297,246 | 2,782,214,948 | 525,202,172 |
| මුළු වත්කම් | 11,812,333,930 | 10,826,753,995 | 8,678,381,792 | 7,168,943,107 | 9,944,937,649 | 11,150,123,923 | 10,783,553,646 | 10,022,135,643 | 8,256,798,953 | 526,663,560 |
| හිමිකාරිත්වය හා හිමිකාරිත්ව වගකීම | | | | | | | | | | |
| සමුච්චිත අරමුදල | 8,654,938,527 | 7,723,034,946 | 6,950,664,274 | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| | 8,654,938,527 | 7,723,034,946 | 6,950,664,274 | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| තාක්‍ෂණික සංචිත | | | | | | | | | | |
| නොඉපයූ නොවූ වාරික | 2,155,544,260 | 2,128,642,612 | 1,622,656,295 | 1,059,398,308 | 963,443,837 | 821,564,804 | 1,046,825,276 | 1,063,317,772 | 877,695,727 | |
| ලියා හල කොමිස් | (421,132,953) | (366,621,700) | (199,173,169) | (176,532,688) | ( 161,486,715 ) | (139,745,300) | (200,139,536) | (206,999,340) | (161,317,228) | |
| | 1,734,411,307 | 1,762,020,912 | 1,423,483,136 | 882,865,620 | 801,957,122 | 681,819,505 | 846,685,740 | 856,318,432 | 716,378,499 | |
| වගකීම් | | | | | | | | | | |
| ජංගම නොවන වගකීම් | | | | | | | | | | |
| රජයේ අරමුදල් | - | - | 66,960 | 66,960 | 142,150 | 284,330 | 719,190 | 719,190 | 719,190 | 719,190 |
| ගෙවිය යුතු ලාභ හා කොමිස් | - | - | 12,287,375 | 12,287,375 | 12,287,375 | 12,287,375 | 63,762,150 | 113,635,474 | 83,722,067 | |
| | | | 12,354,336 | 12,354,336 | 12,429,525 | 12,571,705 | 64,481,340 | 114,354,664 | 84,441,257 | 719,190 |
| ජංගම වගකීම් | | | | | | | | | | |
| ගෙවිය යුතු හානි ප්‍රතිපූර්ණයන් | 1,102,369,856 | 1,111,616,732 | 273,060,335 | 286,078,050 | 392,410,772 | 518,000,207 | 329,449,921 | 333,321,632 | 602,777,397 | |
| වෙනත් වගකීම් | 320,614,240 | 230,081,405 | 18,819,722 | 74,726,585 | 240,690,522 | 242,265,350 | 178,033,863 | 306,121,335 | 269,692,571 | 431,842,361 |
| | 1,422,984,096 | 1,341,698,137 | 291,880,056 | 360,804,635 | 633,101,294 | 760,265,557 | 507,483,784 | 639,442,967 | 872,469,968 | 431,842,361 |
| මුළු හිමිකාරිත්වය සහ වගකීම් | 11,812,333,930 | 10,826,753,995 | 8,678,381,792 | 7,168,943,108 | 9,944,937,649 | 11,150,123,923 | 10,783,553,647 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |

# සමායතන තොරතුරු

**ආයතනයේ නම**

ජාතික රක්‍ෂණ භාර අරමුදල

**නෛතික තත්ත්වය**

2006 අංක 28 දරණ ජාතික රක්‍ෂණ අරමුදල් පනතින් ස්ථාපිත කළ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

**ලියාපදිංචි කාර්යාලය**

අංක 97, මරදාන පාර, කොළඹ 10, ශ්‍රී ලංකාව.

**ඇමතුම් විස්තර**

දුරකථන අංක +94 114873900-5, +94 112026600

ෆැක්ස් අංකය +94 112338778

විද්‍යුත් තැපෑල ඃ ආයතනික වෙබ් අඩවිය

**අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින්**

මංජුල ද සිල්වා මයා (සභාපති)

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මයා

එන්.එම්.ඩී. නවරත්න මයා

ට්‍රේවින් ප්‍රනාන්දුපුල්ලේ මයා

අසේන්ද්‍ර සිරිවර්ධන මයා

පී.පී.එස්. රොහාන් ද සිල්වා මයා

චන්දන කුමාරසිංහ මයා

**මණ්ඩල ලේකම්**

උදාරි රන්හොටිගමගේ මිය

**බාහිර විගණක**

විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

**බැංකුකරුවන්**

මහජන බැංකුව

ලංකා බැංකුව

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

## ජාතික රක්ෂණ භාර අරමුදල

නො. 97, මරදාන පාර, කොළඹ 10.
ටෙලි : +94 11 4873900-5, +94 11 2026600 ෆැක්ස්: +94 11 2338778
Web : www.nitf.lk